AA CEYLON
NOW OPEN
Autowheel Cafe
Open for 7.30 AM – 6.00 PM
Lunch Packets Rs. 495/= each
Lamprais Rs. 980/= each
PickMe
14, Duplication Road, Colombo 3

දිවයින

AA CEYLON
වාසල LEISURE
WAASALA LEISURE ANURADHAPURA
NO.394/2B/1, HARISCHANDRA MAWATHA, ANURADHAPURA, SRI LANKA
+94 777 999 197 - (HOTLINE)
+94 764 417 320 - (MANAGER)
www.waasalaleisure.com

44 වැනි කාණ්ඩය 179 වැනි පත්‍රය | 2025 ඔක්තෝබර් මස 24 වැනිදා සිකුරාදා | අද පිටු 12යි | මිල රු.60 යි | www.divaina.lk

එකට පලා ගිහින් මගදී වෙන්වෙලා!

● වැලිගම සභාපති මැරුවේ

පැන ගිය සෙබළකුට දුන් ඕඩරයට

දේහය මිදිගම නිවසට

>> 03 පිටුව

කුලී ඝාතකයා හඳුනා ගැනේ

හේමන්ත රන්දුණු සහ නෝමන් පළිහවඩන

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති ලසන්ත වික්‍රමසේකර හෙවත් මිදිගම ලසාට වෙඩි තබා ඝාතනය කර ඇත්තේ දකුණු පළාතේ ක්‍රියාත්මක වන ප්‍රධාන පෙළේ පාතාල කල්ලියක් විසින් යුද හමුදාවෙන් පළා ආ සෙබළකුට ලබාදුන් මුදල් කොන්ත්‍රාත්තුවක් මත බව විමර්ශනවලින් හෙළි වී ඇත.

>> 02 පිටුව

අනීතිකව අත්අඩංගුවට ගෙන මහපාරේදී පහර දී වධහිංසා කරලා

මාධ්‍යවේදියාට වන්දි ගෙවීමට පොලිසියේ 3 කට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝග

වහාම නීති පියවර ගන්නැයි නීතිපතිටත් නියෝග කරයි

ඒ. ජේ. ඒ. අබේනායක

සිය නිවසේ සිට කොළඹ බලා යතුරුපැදියෙන් රාජකාරියට පැමිණෙමින් සිටි නෙත් එෆ්. එම්. ගුවන්විදුලියේ විධායක නිෂ්පාදකවරයකු වන තිළිණ රාජපක්ෂ මහතා නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගෙන මහාමාර්ගයේදී මහජනතාව ඉදිරියේදීම අමානුෂික ලෙස පහරදී කෲර වධහිංසා කළ අලව්ව පොලිසියට අනුයුක්තව සේවය කළ පොලිස් නිලධාරීන් තිදෙනකුට එරෙහිව කෲර වධහිංසා වැළැක්වීමේ පනත යටතේ වහාම නීතිමය පියවර ගන්නා ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය පෙරේදා (22දා) නීතිපතිවරයාට නියෝග කළේය.

>> 02 පිටුව

ඇල්ලූ පාතාල කල්ලි නායක ‘බස් ලලිත්’ රැගෙන එන්න

පොලිසියට මහජන ප්‍රසාදය

හේමන්ත රන්දුණු

පාතාල කල්ලි නායක ලලිත් කන්නංගර නොහොත් බස් ලලියා නමැත්තා ඩුබායි හිදී අත්අඩංගුවට ගැනීමට ප්‍රසාදය පළ කරමින් හංවැල්ල අවිස්සාවේල්ල ඇතුළු ප්‍රදේශ ගණනාවක ජනතාව බැනර් ප්‍රදර්ශනය කරමින් ස්තුතිය පොලිසිය වෙත පිරිනමා ඇත.

>> 02 පිටුව


ජනාධිපතිතුමනි, පොලිස්පතිතුමනි, මහජන ආරක්ෂකතුමනි
බස් ලලියා නොහොත් තිරිසන් මිනිමරු පාදඩයව
දිවයිනට රැගෙන ඒමට කටයුතු කරන්න
වින්දිතයන්ට සාධාරණය ඉටු කරන්න.
අවිස්සාවේල්ල වෙළඳ ප්‍රජාව

බැකෝ සමන්ගේ කෝටි 8ක් වටිනා බස් 2ක් පොලිසිය භාරයට



හේමන්ත රන්දුණු

බැකෝ සමන්ට අයත්ව තිබූ රුපියල් කෝටි 8කට අධික වටිනාකමකින් යුත් සුඛෝපභෝගී බස්රථ දෙකක් බස්නාහිර උතුරු අපරාධ කොට්ඨාසය මගින් ඊයේ (23) තම භාරයට ගෙන තිබේ.

>> 02 පිටුව

ජනපති පරිසර සම්මාන ප්‍රදානයට එක්වී....

ජනාධිපති පරිසර සම්මාන ප්‍රදානෝත්සවය ඊයේ (23දා) පෙරවරුවේ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති අවස්ථාවේ පරිසර සංරක්ෂණය සඳහා කැප වී ක්‍රියාකළ පාසල් හා ප්‍රජා සහභාගිත්වය ඇගයීමේ සම්මාන ප්‍රදානයන් ද සිදුවිය. එහි අවස්ථාවකි මේ. පරිසර අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය උළෙළ සංවිධානය කර තිබිණි.

වැලිගම ඝාතනයට විරුද්ධව විපක්ෂය කළු අඳී

අකිත පෙරේරා, රනිල් ධර්මසේන

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති ලසන්ත වික්‍රමසේකර මහතා වෙඩි තබා ඝාතනය කිරීමට විරෝධය දක්වමින් විපක්ෂ මන්ත්‍රීවරු කළු ඇඳුමින් සැරසී ඊයේ (23දා) පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගී වූහ.

>> 02 පිටුව

මහජන ආරක්ෂක ඇමැතිගේ කතාවෙන් වැලිගම සභාපති ඝාතනය සාධාරණීකරණය කළා

හොරාට පෙර කෙහෙල් කැන වැට පැන්නා වගෙයි

මේකද හදන අලුත් සංස්කෘතිය?

මුජිබර් රහුමාන් අසයි

අකිත පෙරේරා, රනිල් ධර්මසේන

වත්මන් ආණ්ඩුවේ සිටින අය 2005 වසරේදී දුන් දේශපාලන සහාය නිසා වර්තමානයේ අප ඉදිරියේ ඇති අපරාධ රාජ්‍යය බිහිවූ බවත් එම අපරාධ රාජ්‍යය තවදුරටත් ඉදිරියට ගෙන යන බව පෙරේදා (22දා) මහජන ආරක්ෂක ඇමැති ආනන්ද විජේපාල මහතා 88, 89 මානසිකත්වයෙන් කළ කතාවෙන්.....

>> 02 පිටුව

සාර්ථක තොරතුරු ලැබුණා:

දින 2-3ක් ඇතුළත ඝාතකයන් අල්ලනවා

සභාපති ඝාතනය ගැන ඇමැති විජේපාල කනගාටු වෙයි

අකිත පෙරේරා, රනිල් ධර්මසේන

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති ලසන්ත වික්‍රමසේකර මහතා වෙඩි තබා ඝාතනය කළ සැකකරුවන් පිළිබඳ මේ වනවිට සාර්ථක තොරතුරු ලැබී ඇති බවත් ඊට සම්බන්ධ සියලුදෙනා දින දෙක තුනක් ඇතුළත අත්අඩංගුවට ගන්නා බවත් මහජන ආරක්ෂක අමාත්‍ය ආනන්ද විජේපාල මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (23දා) පැවසීය.

>> 02 පිටුව

අයවැයට පෙර තෙදිනක් මැතිසබේ විශේෂ සෝදිසියක්

මන්ත්‍රී විවේකාගාර සහ ඇඳුම් අල්මාරිත් පරීක්ෂා කරයි

අකිත පෙරේරා, රනිල් ධර්මසේන

ජනාධිපතිවරයා විසින් අයවැය කථාව ඉදිරිපත් කිරීමට පෙර ලබන නොවැම්බර් 04, 06 සහ 07 යන දිනයන්හිදී පාර්ලිමේන්තුව තුළ විශේෂ ආරක්ෂක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක....

>> 02 පිටුව

බී.වයි.ඩී. ගැන තීරණය අද උසාවියට කියනවා

රේගුව අභියාචනාධිකරණයට දැනුම් දෙයි

ඒ.ජේ.ඒ. අබේනායක

මෝටර් ධාරිතාව නිශ්චිතව තහවුරු කිරීම හා අයකළ යුතු බදු අනුපාතය සම්බන්ධයෙන් ඇති වූ ගැටලු මත ශ්‍රී ලංකා රේගුව භාරයේ රඳවාගෙන සිටින බී.වයි.ඩී. වර්ගයේ විද්‍යුත් වාහන පෙන්සම්කාර සමාගමට කඩිනමින් මුදාහැරීම සඳහා ශ්‍රී ලංකා රේගුව සමඟ සාකච්ඡා කොට සුදුසු ක්‍රියාමාර්ග කුමක්දැයි අද (24දා) අධිකරණයට දැනුම් දෙන බව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ සුමති ධර්මවර්ධන මහතා ඊයේ (23දා) අභියාචනාධිකරණයට දැනුම් දුන්නේය.

>> 02 පිටුව

කෝටියක් වටිනා වාහනය ලක්ෂ 30ට අරන් කුඩු ජාවාරමෙකුට දුන්නැයි අයෙක් දැලේ

වාද්දුව සුමිත් පොකුණුපිටිය

පේජ් බුක්

• කථානායකතුමා කිව්වලු මන්ත්‍රී කෙනෙකුට වෙඩි තිබ්බට ඒක ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් නෙමේ කියලා...!

• අනේ...! ගැඹුර සුළු කොට තැකීම...!

කිරි සාරයෙන් කැලතී...
නියම මිල්ක් චොක්ලට් රස සොයායන රසවතුන් වෙනුවෙන්ම කැන්ඩොස් මිල්ක් චොක්ලට් බාර්. ඔබත් රස විඳින්න...
Kandos The original chocolate
Milk Chocolate
කැන්ඩොස් මිල්ක් චොකලට්
Kandos
Original Cocoa Butter Chocolate
Premium Kandos Quality
මිල රු. 260/-

සුපිරි ධන සම්පත	0698 වැනි වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය -Y	0 - 0 - 9 - 8 - 3 - 2
මහජන සම්පත	5990 වැනි වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය - O	3 - 5 - 2 - 9 - 8 - 5
අද සම්පත	0565 වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය - O	2 - 9 - 8 - 5
හඳහන	1299 වැනි වාරය	2025.10.22	ලග්නය - මිථුන	20 - 30 - 36 - 47
මෙගා පවර්	2338 වැනි වාරය	2025.10.22	සුපිරි අංකය - 14 ඉංග්‍රීසි අක්ෂරය - X	10 - 23 - 39 - 58
ශනිදා වාසනාව	5125 වැනි වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය - R	04 - 54 - 57 - 59
අද කෝටිපති	2790 වැනි වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය - H	46 - 47 - 64 - 69
ජය	0258 වැනි වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය - T	3 - 2 - 7 - 0
ධන නිධානය	2020 වැනි වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය - K	06 - 26 - 32 - 66
ලග්න වාසනාව	4676 වැනි වාරය	2025.10.22	ලග්නය - මකර	25 - 29 - 31 - 55
ජයෝදා	2172 වැනි වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය - V	19 - 20 - 29 - 67
ගොවිසෙත	4232 වැනි වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය - J	02-- 32 - 55 - 61–
ජය සම්පත	172 වැනි වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය - Y	9 - 8 - 3 - 2
සුපර් බෝල්	2964 වැනි වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය - S	28 - 42 - 52 - 57
කප්රුක	2140 වාරය	2025.10.22	ඉංග්‍රීසි අක්ෂරය - I සුපිරි අංකය - 02	05 - 64 - 71 - 73
සුබ දවසක්	0106 වැනි වාරය	2025.10.22	ලග්නය - මීන	13 - 44 - 57

පැන ගිය සෙබළකුට දුන් ඕඩරයට

මෙම ඝාතනය සිදුකළ පාතාල කුලී ඝාතකයා මේ වනවිට හඳුනාගෙන ඇති අතර විශේෂ පොලිස් කණ්ඩායමක් ඔහු අත්අඩංගුවට ගැනීමට විමර්ශන ආරම්භ කර තිබේ.

මෙම වෙඩි තැබීම සිදුවන අවස්ථාවේ පටිගත වී තිබූ සීසීටීවී දර්ශන ඔස්සේ කළ විමර්ශනයකදී කුලී ඝාතකයා හඳුනාගැනීමට හැකි වූ බව විමර්ශන කණ්ඩායම් පවසයි.

මේ අතර මෙම කුලී ඝාතකයා සහ යතුරුපැදිය පැදවූ පාතාල සාමාජිකයා ලසන්ත වික්‍රමසේකර ඝාතනය කර පලාගිය මාර්ගය සොයා ගැනීමට ප්‍රදේශයේ සීසීටීවී කැමරා පරීක්ෂා කිරීමේ කටයුතු පොලිසිය ඊයේ සිට ආරම්භ කර තිබිණි. ඝාතනයට පැමිණි වෙඩික්කරු තවත් සගයෙකු සමග යතුරුපැදියකින් පලාගොස් අතරමගදී දෙදෙනා යතුරුපැදි දෙකකින් පලාගිය බවට ලැබී ඇති තොරතුරු ඔස්සේ ද පොලිස් පරීක්ෂණ පවත්වයි.

මේ අතර මෙම ඝාතනය සිදුවන අවස්ථාවේ එම ප්‍රදේශයේ හුවමාරු වූ දුරකථන විශ්ලේෂණ වාර්තාද පොලිසිය ලබාගෙන ඇති අතර ඒ ඔස්සේ ද වෙනම විමර්ශනයක් ආරම්භ කර තිබේ.

මෙම ඝාතනයට මිදිගම රුවන් මිදිගම චුටි සහ හරක්කටා නමැති පාතාල මැරයන්ගේ සම්බන්ධයක් ඇති බවට ලැබුණු තොරතුරු මත ඒ ඔස්සේද විමර්ශන පවත්වාගෙන යයි. ඝාතනයට ලක් වූ ලසන්ත වික්‍රමසේකර පසුගිය කාලය පුරාම දැඩි මරණ බියකින් පසුවී ඇති බවද හෙළි වී ඇත.

මේ මරණ භීතිය නිසාම මොහු පදිංචි ස්ථාන පවා වෙනස් කරමින් රහසිගත ජීවිතයක් ගත කිරීමට පුරුදුව සිට ඇති බව විමර්ශන නිලධාරීහු කියා සිටිති.

ලසන්තට එල්ලවී තිබූ තර්ජන නිසා ඔහු පෞද්ගලික ආරක්ෂකයන් පහළොස් දෙනකු පමණ ළඟ තබා ගෙන සිටි බවද හෙළි වී ඇත. එහෙත් මෙම ඝාතනය සිදුවූ අවස්ථාවේ ඔහු සමීපයේ ඒ එකදු ආරක්ෂකයකු හෝ සිට නොමැති බවද අනාවරණය වී තිබේ. මේ සම්බන්ධයෙන්ද පොලිසියේ අවධානය යොමු වී ඇත.

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ඝාතන සිද්ධිය සම්බන්ධයෙන් පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා සිය අධීක්ෂණය යොමු කර ඇති අතර දකුණු පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කිත්සිරි ජයලත් මහතාගේ මෙහෙයවීමෙන් විමර්ශන පැවැත්වෙයි.

මාධ්‍යවේදියාට වන්දි ගෙවීමට...

අලව්ව පොලිසියට අනුයුක්තව සේවය කළ පොලිස් සැරයන් රවීන්ද්‍ර කුමාර (34971), පොලිස් කොස්තාපල් විජේබණ්ඩාර (30472) හා පොලිස් කොස්තාපල් ජයසුන්දර (87445) යන තිදෙනා පෙත්සම්කාර මාධ්‍යවේදියාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට ද නිගමනය කළ ශ්‍රේෂ්ඨාධිකරණය සිය පෞද්ගලික මුදලින් පෙත්සම්කරුට රුපියල් 25,000 බැගින් වන්දි ගෙවන ලෙසට ද ඔවුන්ට නියෝග කළේය.

පෙත්සම්කාර මාධ්‍යවේදියා පොල්ගහවෙල ප්‍රදේශයේ සිට 2021.03.01 වැනිදා දහවල් සිය යතුරුපැදියෙන් කොටුව බලා ගමන් කරමින් සිටියදී අලව්ව වලකුඹුර ප්‍රදේශයේදී පළමු හා දෙවන වගඋත්තරකාර පොලිස් නිලධාරීන් ඔහුගේ යතුරුපැදිය නවත්වා ඉදිරියෙන් ගමන් කළ මෝටර් රථයක් මාර්ග නීති උල්ලංඝනය කරමින් ඉස්සර කළ බවට චෝදනා කර තිබිණි. තමා කිසිදු මාර්ග නීතියක් උල්ලංඝනය නොකළ බව පවසා සිය රියැදුරු බලපත්‍රය ඔවුන් වෙත ලබාදුන් පෙත්සම්කරු ඔවුන් හා තමා අතර ඇතිවූ සංවාදයට සිය ජංගම දුරකථනයෙන් පටිගත කර තිබිණි. එලෙස තමන්ව වීඩියෝ කරන්නේ ඇයි දැයි පරුෂ වචනයෙන් බැණ වැදුණු එම නිලධාරීන් ඔහුගේ ජංගම දුරකථනය බලහත්කාරයෙන් උදුරාගෙන ඇති අතර සිය රාජකාරි හැඳුනුම්පත පෙන්වා මාධ්‍යවේදියකු වන තමාට සිදුවන අසාධාරණය වීඩියෝ කිරීමේ අයිතිය ඇති බව පෙත්සම්කරු පවසා තිබිණි.

මාර්ගයේ ගමන් කළ පදිකයන් ඇතුළු විශාල පිරිසක් ද යතුරුපැදිකරු වෙනුවෙන් පෙනීසිටීම නිසා ඉහළ නිලධාරීන්ට දන්වා තවත් පොලිස් නිලධාරීන් පිරිසක් ගෙන්වා ගත් සැකකාර නිලධාරීන් එම නිලධාරීන් හා එක්ව පෙත්සම්කාර මාධ්‍යවේදියාට අමානුෂික ලෙස පහරදී බරපතළ තුවාල සිදුකොට පොලිසියට රැගෙන ගොස් පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම, මෝටර් රථවාහන පනත යටතේ ගැනෙන වැරදි සිදුකිරීම ඇතුළු අසත්‍ය චෝදනා නගා නඩු පැවරීමට පියවර ගෙන තිබිණි.

අනීතික ලෙස කටයුතු කරන්නේ නම් ඉහළ පොලිස් නිලධාරීන්ට පැමිණිලි කරන බවට පෙත්සම්කරු පැවසීම නිසා එලෙස අත්අඩංගුවට ගෙන ඇති බවත් ඒ පිළිබඳව සිය ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් කිරීමට හෝ ඔහුට අවස්ථාවක් ලබානොදුන් බවත් පෙත්සමින් පෙන්වා දී තිබූ පෙත්සම්කරු කෙසේ හමුත් නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතාගේ මැදිහත්වීම මත ඔහු රෝහල්ගත කිරීමට පියවර ගත් බවත් කියා සිටී.

රෝහල්ගතව සිටියදී රෝහලට පැමිණි මහෙස්ත්‍රාත්වරයකු පෙත්සම්කාර මාධ්‍යවේදියා රක්ෂිත බන්ධනාගාරගත කර තිබූ අතර දින ගණනාවකට පසුව ඇප මත මුදාහැර තිබිණි. පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් ඉදිරිපත් කළ වෛද්‍ය වාර්තා ඇතුළු සියලු කරුණු විභාග කළ අගවිනිසුරු ප්‍රීති පද්මන් සූරසේන, කේ. ප්‍රියන්ත ප්‍රනාන්දු හා සම්පත් බී. අබේකෝන් යන විනිසුරු මඩුල්ල එම නියෝගය කළේය. පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ඒ. ජී. ජයවීර මහතාගේ උපදෙස් පරිදි ප්‍රභාත් එස්. අමරසිංහ මහතා සමග ශ්‍යාමල් ඒ. කොල්ලුරේ මහතා පෙනී සිටියේය.

ඇල්ලූ පාතාල කල්ලි නායක ...

පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා කියා සිටියේ මෙම පාතාල කල්ලි නායකයා වැඩි දවසක් ගතවන්නට පෙර ශ්‍රී ලංකාවට ගෙන ඒමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරගෙන යන බවයි.

මිනිස් ඝාතන කප්පම් ගැනීම් මත්ද්‍රව්‍ය ජාවාරම් කොල්ලකෑම් ඇතුළු දරුණු ගණයේ අපරාධවල නිරත වෙමින් ලලිත් කන්නංගර නමැති මෙම පාතාල නායකයා අවිස්සාවේල්ල, හංවැල්ල ඇතුළු ප්‍රදේශ ගණනාවක ජනතාව භීතියට පත් කරගෙන සිටියේය.

සිය පාතාල කල්ලි අපරාධකරුවන් යොදවා මෙම අපරාධ සිදු කළ ලලිත් කන්නංගර ඩුබායි රාජ්‍යයට වී සුඛෝපභෝගී ජීවිතයක් ගත කරමින් සිටියේය.

පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගේ මූලිකත්වයෙන් ඩුබායි රාජ්‍ය වෙත ගිය විශේෂ පොලිස් කණ්ඩායමක් විසින් එරට පොලිසියේ ද සහාය ඇති ලලිත් කන්නංගර මීට දින කිපයකට උඩදී අත්අඩංගුවට ගන්නා ලදී.

මෙම පාතාල නායකයාගෙන් එල්ල වූ තර්ජන හමුවේ හංවැල්ල අවිස්සාවේල්ල ඇතුළු ප්‍රදේශ ගණනාවක ව්‍යාපාරිකයන් සහ සාමාන්‍ය ජනතාව සිය නිවාස පවා අත්හැර වෙනත් ප්‍රදේශවලට ගොස් සැඟවී ජීවත් වීමට කටයුතු කර තිබූ බව පොලිසිය පවසයි.

මිනිස් ඝාතන දහයක් ඇතුළු අපරාධ ගණනාවක් සම්බන්ධයෙන් මොහුට එරෙහිව චෝදනා එල්ල වී ඇති බව විමර්ශනවලින් හෙළි වී තිබේ.

වැලිගම ඝාතනයට...

ඒ අනුව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ප්‍රමුඛ සමගි ජනබලවේගය මෙන්ම විපක්ෂය නියෝජනය කරන සෙසු පක්ෂ මන්ත්‍රීවරු ද මෙලෙස කළු ඇඳුමින් සැරසී පැමිණ සිටියහ. ඇතැම් මන්ත්‍රීවරුන් කළු පැහැති පටි බැඳගෙන පැමිණ සිටින අයුරු ද දැකගත හැකිවිය.

බී.වයි.ඩී. ගැන

මෝටර් රථ ධාරිතාව පරීක්ෂා කිරීමට අවශ්‍ය තාක්ෂණික උපකරණ (ස්කෑන් යන්ත්‍ර) ලබාදිය හැකි බව පෙත්සම්කාර ජෝන් කීල්ස් ඔටෝ ප්‍රයිවට් ලිමිටඩ් සමාගම විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් අධිකරණයට හා ශ්‍රී ලංකා වරාය අධිකාරියට දැනුම් දී තිබියදී ඒ පිළිබඳව නොතකා හා එකී වාහන නිශ්චිත පරීක්ෂණ අවසන් වනතුරු මුදාහැරීමට අවශ්‍ය අමතර බැංකු බැඳුම්කර කුමක් දැයි නිශ්චිතව දැනුම් නොදී ශ්‍රී ලංකා රේගුව දිගින් දිගටම කල්වරමින් සිටීම යුක්ති සහගත නොවන බවට පෙත්සම්කාර ජෝන් කීල්ස් සමාගම වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ පර්සානා ජමීල් මහත්මිය කළ කරුණු දැක්වීමට පිළිතුරු දෙමින් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා එම පොරොන්දුව දුන්නේය.

තම අධිකරණය හමුවට ඉදිරිපත් වී ඇති පෙරකී විද්‍යුත් වාහන රේගුව භාරයේ දිගින් දිගටම රඳවා නොගෙන කඩිනමින් එයට විසඳුම් ලබාදීම සුදුසු බව අධිකරණයට පෙනී යන බව අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු රොහාන්ත අබේසූරිය මහතා පැවසීය.

එබැවින් ශ්‍රී ලංකා රේගුව ඇතුළු වගඋත්තරකාර පාර්ශ්වය සමග සාකච්ඡා කොට එකී ගැටලුක් නිරාකරණයකර ගත හැකි සුදුසු නිර්දේශ වහාම අද අධිකරණයට දැනුම් දෙන ලෙසට නීතිපතිවරයාට නියෝග කළ අභියාචනාධිකරණය එම නඩුව අද පෙරවරු 9.30ට අධිකරණය හමුවේ කැඳවීමට නියම කළේය.

තම සමාගම විසින් නියමිත ක්‍රමවේදය අනුගමනය කර ආනයනය කළ බී.වයි.ඩී. වර්ගයේ විද්‍යුත් වාහන තොගයක් අනීතික ආකාරයෙන් දිගින් දිගටම රඳවා තබාගැනීම අභියෝගයට ලක්කරමින් ජෝන් කීල්ස් ඔටෝ ප්‍රයිවට් ලිමිටඩ් සමාගම එම පෙත්සම ගොනු කර තිබිණි. එම පෙත්සම අභියාචනාධිකරණයේ සභාපති රොහාන්ත අබේසූරිය හා සාමාජික විනිසුරු කේ. ප්‍රියන්ත ප්‍රනාන්දු යන මහත්වරුන් හමුවේදී කැඳවිණි.

බැකෝ සමන්ගේ...

පොලිසිය විසින් කළ ප්‍රශ්න කිරීම්වලදී එම බස්රථ තමන්ට අයත් බව බැකෝ සමන් පිළිගෙන තිබේ. බස්නාහිර උතුර අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂ රොහාන් ඕලුගල මහතාගේ උපදෙස් මත පරීක්ෂණ පැවැත්වේ.

මහජන ආරක්ෂක...

හෙළිවූ බවත් කොළඹ දිස්ත්‍රික් මන්ත්‍රී මුජිබුර් රහුමාන් (සජබ) මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (23දා) පැවසීය.

අපරාධ කල්ලි සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මර්දනය කිරීමට අදාළව නීති සහ ක්‍රමෝපාය සැකසීමට ආණ්ඩුව ඉදිරිපත් කර ඇති 'රටම එකට' වැඩසිළිවෙළ සම්බන්ධයෙන් කල්තැබීමේ විවාදයේදී අදහස් දක්වමින් මේ බව කී මන්ත්‍රීවරයා වැඩිදුරටත් මෙසේද කීය.

"අපි දැක්කා ඊයේ පෙරවරුවේ වැලිගම ප්‍රාදේශීය සභාවේ සජබ සභාපතිවරයාව මහ දවල් රාජකාරියේ නිරතවෙලා සිටිද්දී ඝාතනය කළා. මේ ඝාතනය ගැන අපි දැක්කා මහජන ආරක්ෂක ඇමැති පාර්ලිමේන්තුවට ඇවිත් කතාවක් පටන්ගත්තා පාතාලය ගැන. ශිෂ්ට සම්පන්න සමාජයක නම් මීට පෙර ඝාතනයක් වූ විට ශෝකය පළ කරලා තමයි කතා කරන්නේ. නමුත් මේ ආණ්ඩුවේ ඒ ශිෂ්ට සම්පන්න ගතිගුණයවත් තිබුණේ නෑ. පටන් ගත්තේම එතුමා පාතාලයේ කියාගෙන. ඒ විතරක් නොවෙයි එම ඝාතනය සාධාරණීකරණය කළා. ඒක තමයි භයානකකම. මම ලැජ්ජා වෙනවා ඔහු වගේ ඇමැතිවරයෙක් සමග මේ පාර්ලිමේන්තුවේ වාඩි වෙලා සිටීම ගැන.

එතුමා ඇවිත් ඝාතකයන් වෙනුවෙන් තමයි අදහස් දැක්වුවේ. ඊට විරුද්ධව නොවේ. ඔහුට චෝදනා තිබෙනවා නම් ඒවා උසාවියට දාලා දඬුවම් දෙන්න පුළුවන්. එහෙම නැතිව ඝාතනය කරන්න කාටවත් අයිතියක් නෑ. ජනාධිපතිතුමා කලින් මේ පාර්ලිමේන්තුවේ කිව්වේ මොකක්ද? පරණ කතා අහලා බලන්න. කාවවත් මරන්න බෑ. ඒ අයගේ ඉතිහාසය වැඩක් නෑ. ඇයි එයාව මැරුවේ, කොහොමද මැරුවේ, ඇයි මරන්න ඉඩ දුන්නේ කියන එකයි ජනාධිපති එදා ප්‍රශ්න කළේ. අද ඇවිත් ඇමැතිතුමා කතාකළේ මොනවාද? අර කොහෙන්ද ගෙනාපු අපරාධකාරයෙක් කිව්වාලු එතුමා ළඟ තුවක්කු තිබෙනවා කියලා. එහෙම නම් අත්අඩංගුවට ගන්න තිබුණානේ.

ඔහු නාමයෝජනා දීලා සභාවට පත් වෙලා මාස හයක් වෙනවා. එතුමා නාමයෝජනා දීලා මාස තුනක් හිටියා. සභාපති වෙලා මාස තුනක් හිටියා. අපරාධකාරයෙක් නම් අත්අඩංගුවට අරන් උසාවියට දාන්න තිබුණානේ. මේකෙන් පෙන්නන්නේ තමුන්නාන්සේලා ශිෂ්ට සම්පන්න නෑ. තමුන්නාන්සේලා බොරු කරන්නේ. වෛරයෙන් 88, 89 තිබුණු මානසිකත්වය තවම හිත්වල තියෙනවා. ඒකයි ඊයේ ඇමැතිතුමා එළියට දැම්මේ. සභාපතිතුමාව ඝාතනය කරන්න අවශ්‍ය පරිසරය තමුන්නාන්සේ හැදුවා කියන සැකය අපිට තිබෙනවා. තමුන්නාන්සේ වගකියන්න ඕනෑ. මොකද ඔබ ඊයේ කතාවෙන් ඔප්පු කළේ අර කතාවක් තියෙන්නේ හොරා වැට පනින්න කලින් කෙහෙල් කැන වැට පැන්නා කියලා. අන්න ඒ වගේ කතාවක් තමයි ඇමැතිතුමා ඇවිත් ඊයේ මෙතන කතාකළේ. තමුන්නාන්සේ ඊයේ ඇවිත් මේ ඝාතනය සාධාරණීකරණය කළා. ශිෂ්ට සම්පන්න සමාජයක ඕක බලාපොරොත්තු වන්නේ නෑ. ශිෂ්ට සම්පන්න නම් මිනිහෙක් මැරුණාම මොන අපරාධකාරයෙක් වුණත් ඒ මිනිහට අපි ගෞරව කරනවා. තමුන්නාන්සේලා ආවේ ලස්සන රටක් හදන්න. අලුත් සංස්කෘතියක් හදන්න. මේකද හදන අලුත් සංස්කෘතිය? ඒකට ද ජනතාව බලය දුන්නේ? තමුන්නාන්සේලා 2005 බලයට ගෙනාපු අය පසුගිය අවුරුදු 12ක් 15ක් තිස්සේ හදපු සංස්කෘතිය තමයි මේ ඉස්සරහට ගෙනිහින් තිබෙන්නේ. ඊයේ කරපු කතාවෙන් අර කැලෑ නීතිය වෙනුවෙන් පෙනී සිටියා. කැලෑ නීතිය ආරක්ෂා කළා.

ඇමැති කෙනෙක් ලෙස කියන්න තිබුණා මේ ඝාතකයන් අපි හොයනවා. අත්අඩංගුවට ගන්නවා, නීතිය ක්‍රියාත්මක කරනවා කියලා. එහෙම කතාවක් නීතිය පිළිබඳ ඇමැතිවරයාගේ කටින් ආවේ නෑ. ඇවිත් අර මැරුණු මිනිහාගේ ඉතිහාසය ගැන කිව්වා. මරපු අය ගැන කිව්වේ නෑ. ජනාධිපතිතුමා ලැජ්ජා වෙන්න ඕනෑ මේ වාගේ ඇමැතිවරු පත්කළාට.

ජනාධිපතිගේ මාධ්‍ය අංශයෙනුත් මේක කැම්පේන් කරනවා. ලැජ්ජයි! මටත් ගහනවා මගේ ආගම ගැන අහනවා. මගේ ආගමේ කරන දේවල් අහනවා. ඔව්! මම ඒ දේවල් කරලා තිබෙනවා. ඇයි ඕගොල්ලන්ට පාන්ද? ආණ්ඩුව මඩ ගහන බළකායක් හදාගෙන ඉන්නවා. ජාතිවාදය නැති කරන්න ආවා කියන අය ජාතිවාදය තමයි කතා කරන්නේ. ජනාධිපති කිව්වා අපරාධ රාජ්‍යයක් භාර ගත්තේ කියලා. 2005 දී ඒක හදන්න දීපු අය තමයි දැන් මේක අරගෙන යන්නේ. අපරාධ වෙනවා මහ දවල් උසාවියට ඇවිත් වෙඩි තියනවා. ප්‍රාදේශීය සභාවට ඇවිත් වෙඩි තියලා යනවා. දැන් පාර්ලිමේන්තුව ඇතුළේ විතරයි වෙඩි තියලා ගියේ නැත්තේ. මේක ඇතුළෙත් ඒක වෙයිද දන්නේ නෑ. ඒ කාලේ සභාවට ගෙනේඩ් එකක් ගහපු අය තමයි අද බලයේ ඉන්නේ. දැන් මේ අපරාධ රාජ්‍යය බරපතළ තැනකට ගෙනත් තිබෙනවා. තමුන්නාන්සේලා 2005 බලයට ගෙනාවේ ගෝඩ් ෆාදර් කෙනෙක්. ඒ අය තමයි අපරාධ රාජ්‍යය හැදුවේ. තමුන්නාන්සේලා ඒකේ හවුල්කාරයෝ. තමුන්නාන්සේලා අපරාධ රාජ්‍යයකට වගකිව යුතු පොලිස් නිලධාරීන්ට ඩීඅයිජී පත්වීම් දීලා උසස්වීම් දෙනවා. මේවා තමයි අපරාධ රාජ්‍යයක ගමන් මග. අපරාධ රාජ්‍යය අවසන් කරනවා කියලා ඒකේ කොටස්කාරයන්ට උසස්වීම් දී තිබෙනවා. ඒ අයව ජනාධිපති ආරක්ෂා කරනවා. තමන්ගේ ඇමැතිවරු සමග සිටින යාළුවන්ව මේ ආණ්ඩුව ආරක්ෂා කරනවා. මාධ්‍ය ආයතන කීයකට ගැහුවාද? ඒ නඩු ටික ගත්තේ නෑ. ඒවා වැලිතලාවේ යට කරන්න තමුන්නාන්සේලා වැඩ කරනවා.

සාර්ථක තොරතුරු ලැබුණා:

ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා මෙසේද කීය.

"මෙම ඝාතනය ආරංචි වූ වහාම මම පොලිස්පති සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කරව්ට මහතාට නියෝග දුන්නා වහාම මේ ගැන පියවර ගන්න කියලා. මේ ගැන සෙවීමට පොලිස් කණ්ඩායම් 04ක් යෙදෙව්වා. මේ වනවිට සාර්ථක තොරතුරු ලැබී තියෙනවා. දින 2ක් 3ක් ඇතුළත මේකට සම්බන්ධ සියලුදෙනා අත්අඩංගුවට ගන්නවා. ඒ සඳහා නියෝගයක් ලබාදීලා තියෙනවා. ඒ ගැන තොරතුරු ලැබෙමින් තියෙනවා.

අපි කනගාටු වෙනවා එතුමා ඝාතනයට ලක්වීම ගැන. මම ඊයෙත් කිව්වා මේක පාතාලය, නීතිවිරෝධී කටයුතු කරන කෙනෙක් ද වෙනත් කෙනෙක් ද කියන එක අපිට අදාළ නෑ. හැම ජීවිතයක්ම ආරක්ෂා කරන්න අපි බැඳිලා ඉන්නවා."

අයවැයට පෙර තෙදිනක්...

කරමින් මන්ත්‍රීවරුන්ගේ විවේක කාමර, ඇඳුම් අල්මාරි ද ඇතුළුව සමස්ත පාර්ලිමේන්තු ගොඩනැගිල්ලම පරීක්ෂාවට ලක් කරන බව කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා ඊයේ (23දා) නිවේදනය කළේය. එහිදී ඔහු මෙසේද සඳහන් කළේය.

ලබන වසර (2026) සඳහා අයවැය කථාව ඉදිරිපත් කිරීමට අදාළව විශේෂ ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත මෙයින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව අයවැය ඉදිරිපත් කෙරෙන නොවැම්බර් 07 සිකුරාදා ආරක්ෂක වැඩපිළිවෙළ පහත සඳහන් ආකාරයට සිදු කරනු ලබන බවද දන්වනු කැමැත්තෙමි. පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ හඳුනාගත් අධිආරක්ෂිත/විශේෂිත වූ ප්‍රදේශ, මෙදින ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ලැබේ. මහජන ගැලරිය ආරාධිත අමුත්තන් සඳහා පමණක් සීමා කරනු ලැබේ. අමුත්තන් සඳහා වන ආරාධනා පත්‍ර මුදල් අමාත්‍යාංශය වෙතින් නිකුත් කරනු ඇත.

මෙදින පාර්ලිමේන්තුවට පැමිණීමේ දී හැකිතාක් දුරට රියැදුරෙකු කැටුව පැමිණෙන ලෙස ද, අමුත්තන් කැටුව පැමිණීමෙන් වැළකී සිටින ලෙස ද, මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. තමන් විසින්ම තම රථය පදවාගෙන එන මන්ත්‍රීවරුන්ගේ වාහන නියමිත රථගාලෙහි ගාල් කිරීම සඳහා මන්ත්‍රී පිවිසුමෙහි, කාර්ය මණ්ඩල පිවිසුමෙහි සහ මහජන පිවිසුමෙහි පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට අයත් රියැදුරන් සේවයේ යොදවන බව ද දන්වනු කැමැත්තෙමි.

මහජන ගැලරිය ආරාධිත අමුත්තන් වෙනුවෙන් සීමා කර ඇති බැවින් තමන් සමග ආරාධිත අමුත්තෙක් පැමිණෙන්නේ නම් ජයන්තිපුර පිවිසුමේදී සේවයේ නියුතු පොලිස් නිලධාරීන් වෙත ආරාධනා පත්‍රය සමග තම අනන්‍යතාව තහවුරු කර මහජන පිවිසුම දක්වා පැමිණීමට හැකියාව පවතී. පාර්ලිමේන්තු රථගාල මෙදින වසා තබන බැවින් මන්ත්‍රීවරුන් පැමිණෙන වාහන අදාළ රථගාල් වෙත යොමු කරනු ලැබේ. මෙදින රථවාහන පොලිසිය සහ සමීප පොලිස් ස්ථාන මගින් විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලැබේ.

කෝටියක් වටිනා වාහනය ලක්ෂ 30ට අරන් කුඩු ජාවාරමෙකුට දුන්නැයි අයෙක් දැලේ

වාද්දුව සුමිත් පොහුපිටිය

රුපියල් ලක්ෂ 100 කට අධික වටිනාකමක් ඇති සුඛෝපභෝගී මෝටර් රථයක් වාහන අලෙවි සලකින් රුපියල් ලක්ෂ 30 කට ලබාගෙන මත්කුඩු ජාවාරම්කරුවකුට දුන් බව කියන පුද්ගලයකු කළුතර කොට්ඨාස විශේෂ අපරාධ විමර්ශන ඒකකය මගින් අත්අඩංගුවට ගෙන ඇත.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ පස්යාල ප්‍රදේශයේ පදිංචි 56 හැවිරිදි අයෙකි.

තමන්ට අයත් රුපියල් ලක්ෂ 100 කට අධික වටිනා සුඛෝපභෝගී මෝටර් රථය යක්කල ප්‍රදේශයේ වාහන අලෙවි සලක විකිණීමට තබා තිබියදී රුපියල් ලක්ෂ 30 ක් ලබාදී රැගෙන ගොස් ඇති බවට දර්ගා නගරයේ ව්‍යාපාරිකයකු කළ පැමිණිල්ලක් මත සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරුගෙන් කළ ප්‍රශ්න කිරීමේදී අනාවරණය වී ඇත්තේ එම මෝටර් රථය තවත් පුද්ගලයකුට ලබාදී ඇති බවත් ඔහු කොළඹ අපරාධ කොට්ඨාසය මගින් මත්කුඩු ජාවාරමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් අයකු බවත්ය.

සැකකරු කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

කළුතර නියෝජ්‍ය පොලිස්පති ජයන්තා පද්මිනී සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රමිඳු සිල්වා යන මහත්ම මහත්මීන්ගේ උපදෙස් පරිදි ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ධම්මික ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන්, පොලිස් පරීක්ෂක උදය කුමාර, සැරයන්වරුන් වන සුදසිංහ (51429), ජයවික්‍රම (56910), කොස්තාපල්වරුන් වන කුමාර (77444), කාන්තා පො.කො. දිල්රුක්ෂි (9667) සහ හේවගේ (9833) වැටලීම කර තිබේ.

ශ්‍රී සමයං

* අය වැය ගේන්න හදන්නේ පාර්ලිමේන්තුවේ විශේෂ සෝදිසි මෙහෙයුමකින් පස්සේලු...!

* අය වැය ගෙනල්ල අපේ ඉතුරු තුට්ටු දෙකටත් විදල ඊට පස්සේ තවත් විශේෂ මෙහෙයුමක් කරලා අපි ජීවත්වෙන හැටි හෙව්වොත් හොඳයි...!!

සියලුම පෙර පාසල් 2027 සිට එකම විෂය මාලා රාමුවකට

- අධ්‍යාපන අමාත්‍යාංශය

චමින්ද සිල්වා

සියලුම පෙර පාසල් සඳහා එකම විෂය මාලා රාමුවක් යටතේ ක්‍රියාත්මක කිරීම 2026 වර්ෂයේ නොව 2027 වර්ෂයේ සිට සිදුකරන බව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රකාශ කරයි.

මෙම වැඩසටහන 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන බවට ප්‍රකාශ වුව ද එය 2027 ලෙස නිවැරදි විය යුතු බව එම අමාත්‍යාංශය පවසයි.

පූර්ව ළමාවිය විෂය මාලා රාමුව මේ වනවිට සම්පූර්ණ කර අවසන්ව ඇති අතර දහනව දහසකට ආසන්න පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන ලබන නොවැම්බර් 25 වැනිදා සිට ආරම්භ කිරීමට නියමිත බව ද අගමැතිනිය කියයි.

කොළඹ ඇස් රෝහලේදී මාධ්‍යවේදීන් සඳහා 1දා විශේෂ අක්ෂි සායනයක්

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන්

ජනමාධ්‍යවේදීන් උදෙසා වන විශේෂ අක්ෂි සායනයක් නොවැම්බර් 01 වැනිදා (සෙනසුරාදා) පෙරවරු 8.00 සිට පස්වරු 1.00 දක්වා කොළඹ ජාතික අක්ෂි රෝහලේදී පැවැත්වේ.

එදින පෙරවරු 8.00 සිට FBS පරීක්ෂාව සිදුකරන අතර ඊට සහභාගි වීමට අපේක්ෂා කරන මාධ්‍යවේදීන් පෙර දින රාත්‍රී 10.00 සිට නිරාහාරව සිට පැමිණෙන ලෙස සංවිධායකයෝ ඉල්ලා සිටිති.

ඊට අමතරව රුධිර පීඩනය පරීක්ෂා කිරීම මෙන්ම ඇස් කණ්ණාඩි නොමිලේ ලබාදීමක් ද එදින සිදුකෙරේ.

ඝාතනයට ලක්වූ වැලිගම සභාපති ලසන්තගේ දේහය මිදිගම නිවසට

ඝාතනයට ලක්වූ වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති ලසන්ත වික්‍රමසේකර මහතාගේ දේහය ඊයේ (23දා) අලුයම 1.00 ට පමණ වැලිගම, මිදිගම පිහිටි ඒ මහතාගේ නිවසට රැගෙන එනු ලැබීය. එම දේහය රැගෙන එන අවස්ථාවේ විශාල පිරිසක් එම නිවසට එක්රොක්ව සිටියහ.

බිරිඳ, දරුවන්, ඥාතීන් හා හිතවතුන් කම්පාවට පත්ව සිටින අයුරු ද දක්නට විය.

ඒ මහතාගේ දේහය පිළිබඳ අවසන් කටයුතු ඉරිදා (26දා) සවස සිදු කිරීමට නියමිතය. ලසන්ත වික්‍රමසේකර මහතා තිදරු පියෙකි.

රුහුණු කතරගම මහා දේවාලයේ බස්නායක නිලමේ තෝරන නිලවරණය 5 වැනිදා

නිලවරණයේදී කතරගම ගම නියෝජනය වන ලෙස පුරවැසියන් වෙත ද කැමැත්ත දීමට අවස්ථාවක් දෙන්නැයි ඉල්ලීමක්

කතරගම - ජේ. සී. දේවප්‍රිය

ඓතිහාසික රුහුණු මහා කතරගම දේවාලයේ 13 වැනි බස්නායක නිලමේවරයා (නිලවරණයෙන්) තෝරාපත් කරගැනීමේ නිලවරණය ලබන දෙසැම්බර් 05 වැනි දින සිදු කිරීමට කටයුතු යොදා ඇති බව බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරියකු සඳහන් කළේය.

හිටපු බස්නායක නිලමේ ඩිෂාන් ගුණසේකර මහතාගේ නිල කාලය පසුගිය මස 22 වැනි දින අවසන් විය. මේ වනවිට දෙවිනුවර මහා විෂ්ණු දේවාලයේ බස්නායක නිලමේ තිළිණ මධුසංඛ මහතා වැඩ බලන බස්නායක නිලමේ ලෙස පත් කර තිබේ. කතරගම දේවාලයේ බස්නායක නිලමේ තෝරන්නේ කතරගම වැඩසිටි කන්ද රාජමහා විහාරය, කතරගම කිරිවෙහෙර රාජමහා විහාරය, ශ්‍රී අභිෂේකාරාම විහාරය, සෙල්ල කතරගම මහාසෙන් රාජමහා විහාරය, කතරගම දේවාලයේ වැඩ බලන බස්නායක නිලමේ, කිඹුල කොටබෝව කුඩා කතරගම දේවාලයේ බස්නායක නිලමේවරයාගේ සහ මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් 11 දෙනාගේ ඡන්ද 17 තුළිනි.

කතරගම ජනතාව සඳහන් කළේ මහනුවර දළදා මාලිගාවේ නිලමේ තේරීමේදී ඡන්ද 318 දිවයිනේ පිහිටි බෞද්ධ විහාර වෙත ඇති අයුරින් කතරගම විහාරස්ථාන 04ට පමණක් සීමා නොකර තිස්සමහාරාම, කතරගම, විහාරස්ථාන මෙන්ම දේවාලයේ පාරම්පරිකව පූද පූජා සිදු කරනු ලබන කපු මහතුන් වෙත හා කතරගම ගම නියෝජනය වන පුරවැසියන් වෙත ද කතරගම දේවාලයේ බස්නායක නිලමේ තෝරාපත් කරගැනීමට සම්බන්ධ මෙම අවස්ථාව ලබාදෙන ලෙසයි. මේ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට සහ බෞද්ධ කටයුතු කොමසාරිස් වෙත සන්දේශයක් භාරදීමට කතරගම ස්වේච්ඡා සංවිධාන ක්‍රියා කරමින් ඇත.

ඕකයි තත්ත්වේ

වැලිගම සභාපති පාහාලය නාමෙන්
වැඩ කර ඇතැයි මැතිසබයෙදි පැවසීමෙන්
විජේපාල නිදහස් වුණි වගකීමෙන්
වෙඩි හඬ මැදත් ඔහු සතුටෙන් සැනසීමෙන්

- අනුරාධ

හොරණ සම්බාහන මධ්‍යස්ථානයට පොලිසියෙන් පනියි

කාන්තාවෝ තිදෙනෙක් අත්අඩංගුවට

හොරණ නයනදූල සේනානායක

හොරණ නගරයේ ප්‍රසිද්ධ පාසලකට නුදුරින් සම්බාහන මධ්‍යස්ථානයක් මුවාවෙන් පවත්වාගෙන ගිය ගණිකා නිවාසක් වටලා එහි මුදලට සේවය සැපයූ බවට සැකපිට කාන්තාවන් දෙදෙනකු සහ කළමනාකාරිනිය අත්අඩංගුවට ගත් බව පානදුර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය පවසයි. සැකකාරියන් වයස අවුරුදු තිස් දෙක සහ පනස් හත අතර වයසේ පසුවන්නියන් වන අතර කොළඹ, මාතර සහ නිවිටිගල යන ප්‍රදේශවල පදිංචිකාරියන් බව පොලිසිය පවසයි.

කළුතර දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිනි පද්මිණි වීරසූරිය මහත්මියට තොරතුරු ලැබී ඇත්තේ පාසල් සිසුන් ද මෙම ස්ථානයට යන එන බවටය. ඒ අනුව පානදුර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් විසින් උපාය දූතයකු යොදවා තොරතුරු තහවුරු කරගැනීමෙන් පසු මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත.

කළුතර දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිනි පද්මිණි වීරසූරිය මහත්මියගේ උපදෙස් මත පානදුර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක විෂ්වජිත් මහතාගේ මෙහෙයවීමෙන් උප පොලිස් පරීක්ෂක ජී. ආර්. ගුරුසිංහ, පො. සැ. (72156) නිශ්ශංක සහ කා පො. කො. (2666) අනුෂ්කා යන නිලධාරීහු මෙම වැටලීම සිදුකළහ. සැකකාරියන් ඊයේ (23 දා) හොරණ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

හදන්න වැය කළ මුදල මිලියන 450ක්ඃ

හෝලුවාගොඩ කෘෂි පාරිසරික උද්‍යානය මුල් වරට ජලයෙන් යටවෙයි

ලලිත් චාමින්ද සහ
එස්. කේ. කළුආරච්චි ගාල්ල

ධාරානිපාත වර්ෂාවත් සමග පෝද්දල හෝලුවාගොඩ කෘෂි පාරිසරික උද්‍යානය ද ජලයෙන් යටවිය.

හෝලුවාගොඩ ඇළ පිටාර ගැලීම නිසා මෙම පාරිසරික උද්‍යානය ජලයෙන් යටව තිබුණි. ඇවිදින මංතීරු, සෙල්ලම් උයන ඇතුළු ප්‍රදේශය ජලයෙන් යටවී තිබුණි. මෙකී පාරිසරික උද්‍යානය ඉදිකිරීමෙන් පසු ජලයෙන් යටවූ පළමු අවස්ථාව මෙය වෙයි. මේ වන විට ගිංතොට මෝය කට පුළුල් කොට ඇති අතර ජලය බැසයමින් පවතින බව වාරිමාර්ග බලධාරීහු පවසති.

කෘෂි පාරිසරික උද්‍යානය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 450.56ක මුදලක් වැයකර තිබුණි. එය මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත මුදලට වඩා සියයට 131ක මුදලක වැඩිවීමකි. 2022 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල තීරණයක් මත මෙකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ විසින් රුපියල් මිලියන 341.96 වටිනාකමකට ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සමග ගිවිසුමකට එළඹ තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂය පරයට අයත් කාර්යභාරයක් ද එකතු කර මෙකී ව්‍යාපෘතිය හෝලුවාගොඩ කෘෂි පාරිසරික උද්‍යාන ව්‍යාපෘතිය ලෙස නම් කර තිබුණි. මෙලෙස අමාත්‍යාංශයේ විෂය පරයට අයත් නොවන කාර්යයක් වෙනුවෙන් මුදල් වැයකිරීමේ අවශ්‍යතාවය විගණනයේ දී මතභේදාත්මක වී තිබුණි.

මෙකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ඇතැම් ඇළ මාර්ග වසා දමා ඇති නිසා සුළු වර්ෂාවකටත් හෝලුවාගොඩ, ඕපාත යන ප්‍රදේශ ජලයෙන් යටවන බව ද ගොවිහු පවසති.

නුවරඑළිය රෝස තැපෑලේ වහලේ හිල් ගොඩයි

අගාධයට යන්න හරින්නේ පෞද්ගලීකරණයට ද - ජනතාව ප්‍රශ්න කරති

නාලක රත්නායක නුවරඑළිය





නුවරඑළිය ඓතිහාසික තැපැල් කාර්යාලය අධික වර්ෂාව සහිත කාලවලදී තෙමෙන බව ජනතාව කියති. එහි වහලයේ ඇති අබලන් තත්ත්වයෙන් මුළු තැපැල් කාර්යාලයම වැසි ජලයෙන් තෙමී යෑමේ අවදානම් තත්ත්වයක් උදාවී ඇත.

මෙම තත්ත්වය හේතුවෙන් තැපැල් සේවකයන් මෙන්ම නුවරඑළිය ඓතිහාසික තැපැල් කාර්යාලය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයෝ ද දැඩි ලෙස අපහසුතාවයට පත්වෙති.

හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ කාලවකවානුවේ දී මෙම තැපැල්හල විකුණා දමන බව කියමින් තැපැල් සේවකයෝ වර්ජනය සටන් කළහ. එම සටන් දිගින් දිගටම සිදු කෙරිණි. නව රජය පත්වීමත් සමගම එම යෝජනාව නැවත හරවා ගැනීමට නව රජය කටයුතු කළේය.

එය එසේ වූ නමුත් නුවරඑළිය තැපැල් කාර්යාලයේ ප්‍රධාන නිලධාරිනියක ජාතික ජනබලවේගයේ අපේක්ෂිකාවක හැටියට නුවරඑළිය මහ නගර සභාවට තරග වැදි නමුත් මේ වන විටත් නුවරඑළිය තැපැල් කාර්යාලයේ ගොඩනැගිල්ලේ ඇති අඩුපාඩු සැකසීමට වත්මන් රජය කටයුතු කර නොතිබීම කනගාටුවට කරුණක් බව තැපැල් සේවකයෝ කියති.

අඩුපාඩු සකසා දීමට රජය කටයුතු නොකිරීමෙන් ඓතිහාසික තැපැල් කාර්යාල ගොඩනැගිල්ල අගාධයට යමින් පවතින බව නුවරඑළිය රැක ගැනීම වෙනුවෙන් වූ සංවිධාන චෝදනා කරයි. මෙලෙස කරන්නේ මෙම තැපැල් කාර්යාලය පෞද්ගලික ආයතනයකට පැවරීමේ උත්සාහයකට දැයි සැක සිතෙන බව ද ඔවුහු කියති.

මුහුණු ආවරණය කළ පිරිසක් සමග විත් සැමියා බිරිඳ පැහැරගෙන ගිහින්

කළුතර විශේෂ එස්. ආරච්චිගේ

සැමියකු පිරිසක් සමග විත් බිරිඳ වෑන් රථයකින් පැහැරගෙන යෑමේ සිද්ධියක් සම්බන්ධයෙන් බේරුවල පොලිසිය පරීක්ෂණ පවත්වයි.

බේරුවල, කරඳගොඩ, දිනාවත්තේ පදිංචි 65 හැවිරිදි කාන්තාවක විසින් පොලිසියට කර තිබූ පැමිණිල්ල අනුව මේ පිළිබඳ පරීක්ෂණ ආරම්භ කර තිබේ.

තම දියණිය සැමියා සමග ආරවුලක් ඇති කරගෙන මාස කිපයක සිට තම නිවසට පැමිණ සිටින බවත්, ඉකුත් 21 වැනිදා දහවල් 11.00 ට පමණ දුවගේ ස්වාමි පුරුෂයා මුහුණු ආවරණය කරගත් තවත් කිපදෙනකු සමග සුදු වෑන් රියකින් පැමිණ දුව බලහත්කාරයෙන් ඇදගෙන ගොස් වෑන් රථයට නංවාගෙන පලා ගිය බවත් ඇය පොලිසියට කර තිබූ පැමිණිල්ලේ සඳහන් වෙයි.

මේ පිළිබඳව පොලිසිය පරීක්ෂණ පවත්වමින් සැකකරු පදිංචි උතුරු කළුතර, පැල්පොල නිවස සෝදිසි කළ ද සැකකරු එහි සිට නැත. දුරකථනය මගින් ඔහු සම්බන්ධ කළ විට ඔහු දුරකථනය තම බිරිඳට යොමු කර ඇති බවත්, තමා ස්වාමි පුරුෂයා සමග කැමැත්තෙන් සිටින බවත්, පොලිසියට පැමිණ ප්‍රකාශයක් ලබා දෙන බවත් ඇය ප්‍රකාශ කළේ යැයි පොලිසිය කියයි.

මුහුණු ආවරණය කරගෙන පැමිණි එක් අයකු ළඟ පිස්තෝලයක් ද, තවත් අයකු ළඟ මන්නයක් හා තවත් අයකු ළඟ කිනිස්සක් ද තිබූ බවට පැහැර ගැනීමට ලක්වූ කාන්තාවගේ පියා පොලිසියට කර තිබූ ප්‍රකාශය සහ පොරොන්දු වූ 22 වැනිදා දිනයේ අදාළ දියණිය හා සැමියා ප්‍රකාශයක් ලබාදීමට පොලිසියට නොපැමිණීම යන කරුණු මත මේ පිළිබඳ පරීක්ෂණ ආරම්භ කර තිබේ.

බේරුවල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්. ආර්. නවරත්න මහතාගේ මෙහෙයවීම යටතේ මේ පිළිබඳව වැඩිදුර පරීක්ෂණ පැවැත්වෙයි.

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පණතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි.

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී ප්‍රසිද්ධ වෙන්දේසියක්

කැළණිය වෙවැල්දූව සහ ඊරියවැටිය ග්‍රාමයන්හි පිහිටි පර්චස් 13.36 ක් විශාලැති නිවසක් සහිත අගනා දේපළක්.

බස්නාහිර පළාතේ ගමපහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවෙ කැලණිය ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඊරියවැටිය අංක. 259A දරන ග්‍රාම නිලධාරි වසමේ වෙවැල්දූව සහ ඊරියවැටිය ග්‍රාමයන්හි පිහිටියාවූ "මාරගහවත්ත අළුබෝගහකුඹුර සහ ඔවිට" යනුවෙන් හැඳින්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. කේ. හේරත් විසින් 2018 පෙබරවාරි මස 25 වන දින සාදන ලද අංක. 351/2018 දරණ පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටස සමග එහි පිහිටි පස, ගහකොළ වැවිළි ගොඩනැගිලි යනාදී සියළු දේ සමග.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වයි. කේ. කස්තුරිආරච්චි විසින් 2019 පෙබරවාරි මස 6 වන දින සහතික කරන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ අංක. 124 දරන බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීමට පනාගොඩගේ රන්ජන් නිරන්ජලා ණයකරු වශයෙන් ගෙවීම පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී වර්ෂ 2025 ක්වූ නොවැම්බර් මස 20 වන දින පස්වරු 12.00 දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2024.03.07 වන දින ශ්‍රී ලංකාණ්ඩුවෙ ගැසට් පත්‍රය සහ 2024.02.27 වන දින "ද අයිලන්ඩ්" "දිවයින" සහ "තිනකුරල්" යන පුවත් පත් බලන්න.

දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය : කිරිබත්ගොඩ එන්. ඩී. බී. බැංකුව අසළ සිට නව නුණුපිටිය මාර්ගයේ මීටර් 800 ක් පමණ ඉදිරියට ගමන් කර දකුණට හැරී ඊරියවැටිය පාරේ කුඩා දුරක් ගමන් කර දකුණට හැරී ලුම්බිනි පටු මගේ මීටර් 75 ක් පමණ ගමන් කිරීමෙන් පාර අවසානයේ අදාළ දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. :- (1) ගැණුම් මුදලින් 10% ක්ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක්ද සහ වැට බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක්ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද (5) ලිපිකරු සහ සෝතක ගාස්තු වශයෙන් රු. 1,500/- ක්ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමෙ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000/- ක්ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02 නවම මාවතේ අංක. 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි කළමනාකරු මධ්‍යගත ණය අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක. 2448448, 0117448448

පී. කේ. ඊ. සේනාපති
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු

134, බැද්දගාන පාර
කෝට්ටේ
දුරකථන අංක 0112873656, 0777672082, 0112871184

සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක. 01 සහ 2011 අංක. 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

වයි. ආර්. ජයලත්

ගිණුම් අංකය : 0059 5000 8670

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025/07/30 වෙනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක. 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. එස්. කුලසිංහ විසින් ලියා සහතික කරන ලද 2020 මාර්තු 05 දාතම හා අංක 247 දරන, 2020 ජූනි 30 දාතම හා අංක 311 දරන, 2021 ජූනි 29 දාතම හා අංක 392, 396 සහ 398 දරන උකස් බැඳුම්කර සියල්ල, 2022 ජනවාරි 06 දාතම හා අංක 636 සහ 638 දරන උකස් බැඳුම්කර දෙක, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ඩී. අබේවික්‍රම විසින් ලියා සහතික කරන ලද 2024 ජනවාරි 19 දාතම හා අංක 4970 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යශින්ද රුවන් ජයලත් [illegible] වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක. 247, 311, 392, 396, 398, 636, 638 සහ 4970 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අට කෝටි තිස් දෙලක්ෂ තිස් දෙදහස් නවසිය හැටයි සත තිස් එකක (Rs.83,232,960.31) මුදලක් 2025 අප්‍රේල් 06 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් අට කෝටි තිස් දෙලක්ෂ තිස් දෙදහස් නවසිය හැටයි සත තිස් එකක (Rs.83,232,960.31) මුදල ද 2025 අප්‍රේල් 07 වෙනි දින සිට අංක. 247, 311, 392, 396, 398, 636, 638 සහ 4970 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හත් කෝටි හාර ලක්ෂ පනස් අට දහසක (Rs.70,458,000.00) මුදලක් සඳහා වාර්ෂිකව Average Prime Lending Rate + සියයට එකයි දශම පහයි බින්දුවක් (AWPLR + 1.50% p.a.) බැගින් වූ පොලිය ද, හා තවත් රුපියල් හැත්තෑ දෙලක්ෂ පනස් දහසක (Rs.7,250,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයයි දශම බිංදුවක් (10.0%) බැගින් වූ පොලිය ද, දන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වේනම්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක. 247, 311, 392, 396, 398, 636, 638 සහ 4970 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

ඉහත කී උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණේ තල්පිටි දෙමැද්ද පානදුර නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ පට්ටිය දකුණ අංක 686 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පට්ටිය දකුණ පිහිටි මහ විදිය වර්තමාන අංක 504/12 දරන පරිශ්‍රයන් 'දොඹගහවත්ත' යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. මල්වැන්න විසින් සාදන ලද 2017 සැප්තැම්බර් 12 දාතම හා අංක 7245 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ගාල්ල පාරට නගර සභා පාර නැගෙනහිරට : දොඹගහවත්තහි කොටසක් දකුණට : දොඹගහවත්තහි කොටසක් සහ බස්නාහිරට : පාර සඳහා වෙන්කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටයි දශම නවයයි හතක් (A:0 R:1 P:8.97) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 7245 දරන පිඹුරට අනුවය.

එකී ලොට් A1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී පට්ටිය දකුණ පිහිටි 'දොඹගහවත්ත' යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. පී. ඒ. ජයවික්‍රම විසින් සාදන ලද 1973 පෙබරවාරි 20 (සාවද්‍ය ලෙස 1953 වශයෙන් ලියාපදිංචි කොට ඇති) දාතම හා අංක 4597 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ගාල්ල කොළඹ ප්‍රධාන පාරට දිවෙන පුද්ගලික පාර නැගෙනහිරට : ගිල්බට් ද මෙල් විසින් හිමිකම් කියන දොඹගහවත්තහි කොටසක් දකුණට : ගිල්බට් ද මෙල් විසින් හිමිකම් කියන දොඹගහවත්තහි කොටසක් සහ බස්නාහිරට : පාර සඳහා වෙන්කිරීම (අඩි 8 පළල) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් නවයයි දශම එකක් (A:0 R:1 P:9.1) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 4597 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රය D 431/112 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 247, 311, 398 සහ 636 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත)

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණේ තල්පිටි දෙමැද්ද පානදුර මණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ අළුබෝමුල්ල බටහිර අංක 691 A දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ අළුබෝමුල්ල ග්‍රාමයේ පිහිටි 'කැකුණගහලන්ද' යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. පී. රංජිත් ආනන්ද විසින් සාදන ලද 2017 පෙබරවාරි 16 දාතම හා අංක 2402 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් X වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් සාදන ලද අංක 2724 දරන පිඹුරේ ලොට් 10) නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් සාදන ලද අංක 2724 දරන පිඹුරේ ලොට් 1A දකුණට : [illegible] විසින් හිමිකම් යන ඉඩම සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් සාදන ලද අංක 2724 දරන පිඹුරේ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම හතයි පහක් (A:0 R:0 P:13.75) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 2402 දරන පිඹුරට අනුවය.

එකී ලොට් X බලයලත් මිනින්දෝරු එච්. පී. ඒ. ජයවික්‍රම විසින් සාදන ලද 2010/03/02 දාතම හා අංක 12374 දරන පිඹුරේ ලොට් 1B හි නැවත මිනුමක් ද තවත් අයුරකින් පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමක් ද වේ.

එකී අළුබෝමුල්ල ග්‍රාමයේ පිහිටි 'කැකුණගහලන්ද' යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් සාදන ලද 1982 මැයි 17 දාතම හා අංක 2724 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 10 නැගෙනහිරට : ලොට් 1 හි ලොට් 1A දකුණට : [illegible] සහ බස්නාහිරට : ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (A:0 R:0 P:15) විශාල ඉඩම් කොටස සමග එකී අංක 2724 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රය E 188/295 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 2724 දරන එකී පිඹුරේ ලොට් 10 (අඩි 12 පළල පාර) දිගේ හා ඒ මගින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.
(උකස් බැඳුම්කර අංක 396 සහ 4970 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත)

3. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණේ තල්පිටි දෙමැද්ද පානදුර මණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ අළුබෝමුල්ල බටහිර අංක 691 A දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ අළුබෝමුල්ල පිහිටි 'පොල්ගහකනත්ත' යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එම්. ආර්. ජයසේකර විසින් සාදන ලද 2014 සැප්තැම්බර් 22 දාතම හා අංක 9785 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම ඉඩමේ සීමා නිර්ණය කොට ඇති උතුරු 8/14TH නැගෙනහිරට : අංක 3457 දරන පිඹුරේ ලොට් A2 දකුණට : ඇටව්වත්ත පාර සහ බස්නාහිරට : ඇටව්වත්ත පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම හතයි පහක් (A:0 R:0 P:09.75) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 9785 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී අළුබෝමුල්ල පිහිටි 'පොල්ගහකනත්ත' යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් සාදන ලද 1983 දෙසැම්බර් 04 (සාවද්‍ය ලෙස පිඹුරු අංක 3454 ලියාපදිංචි කොට ඇති) දාතම හා අංක 3457 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම ඉඩමේ සීමා නිර්ණය කොට ඇති උතුරු 8/14TH නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් A2 දකුණට : ගම්සභා පාර සහ බස්නාහිරට : ගම්සභා පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A:0 R:0 P:10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 3457 දරන පිඹුරට අනුව වෙළුම/ පත්‍රය E 127/106 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 638 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත)

4. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ [illegible] පත්තුවේ මණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ කොටලෙවල අංක 661 A දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කොටලෙවල පිහිටි 'කඳානගේවත්ත, මීගහමිටිට සහ මීගහමිටිට හි දකුණු කොටස' යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඩී. ජේ. ආර්. පී. [illegible] විසින් සාදන ලද 2015 නොවැම්බර් 21 දාතම හා අංක 5391 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 1475 දරන පිඹුරේ ලොට් 2 සහ අංක 973 දරන පිඹුරේ ලොට් 11 නැගෙනහිරට : අංක 973 දරන පිඹුරේ ලොට් 11 සහ පාර (ප්‍රාදේශීය සභා) දකුණට : පාර (ප්‍රාදේශීය සභා) සහ එච්. ඒ. චාල්ස් පීරිස් විසින් හිමිකම් කියන දේපළ සහ බස්නාහිරට : එච්. ඒ. චාල්ස් පීරිස් විසින් හිමිකම් කියන දේපළ සහ අංක 1310 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම හතරයි බින්දුවක් (A:0 R:0 P:14.40) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 5391 දරන පිඹුරට අනුවය.

ලොට් 3A පහතින් විස්තර කොට ඇති ඉඩම්වල නැවත මිනුමකි :

එකී කොටලෙවල පිහිටි 'කඳානගේවත්ත, මීගහමිටිට සහ මීගහමිටිට හි දකුණු කොටස' යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු සිරි මෙන්ඩිස් ආරච්චි විසින් සාදන ලද 1993 දෙසැම්බර් 31 දාතම හා අංක 1475 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 2 නැගෙනහිරට : ලොට් 4 (අඩි 15 පළල පාර) දකුණට : අංක 973 දරන පිඹුරේ ලොට් 13 (අඩි 15 පළල පාර) සහ බස්නාහිරට : එච්. ඒ. චාල්ස් පීරිස් විසින් හිමිකම් කියන ඉඩම සහ අංක 1310 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (A:0 R:0 P:15) විශාල ඉඩම් කොටස සමග පස ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 1475 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රය B 317/123 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මිනින්දෝරු සිරි මෙන්ඩිස් ආරච්චි විසින් සාදන ලද 1991/03/16 දාතම හා අංක 973 දරන පිඹුරේ ලොට් 11 (අඩි 15 පළල පාර) සහ ලොට් 13 (අඩි 15 පළල පාර), එකී අංක 1475 දරන එකී පිඹුරේ ලොට් 4 (අඩි 15 පළල පාර) සහ බලයලත් මිනින්දෝරු සිරි මෙන්ඩිස් ආරච්චි විසින් සාදන ලද 1993/07/09 දාතම හා අංක 1354 දරන පිඹුරේ ලොට් 5 (අඩි 15 පළල පාර) දිගේ හා ඒ මගින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

(උකස් බැඳුම්කර අංක 392 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,
සමාගම් ලේකම්

දිවයින

2025 ඔක්තෝබර් මස 24 වැනිදා සිකුරාදා
අංක 223, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 13.
කර්තෘ මණ්ඩලය - 2448402, 2497500
ෆැක්ස් - 2344253, 2438750

වෙබ් අඩවිය - www.divaina.com
ඊමේල් - divaina@unl.upali.lk
divainapro@unl.upali.lk

www.facebook.com/divainanewspaper
www.instagram.com/divaina_newspaper

දැන්වීම් අංශය - 0112497537, (ප්‍රධාන කාර්යාලය)
0112497531, 0112497539
ෆැක්ස් - 2344252, 2330024
බෙදාහැරීම් අංශය - 2497568, 2497519, 2497580
ෆැක්ස් - 2334564
කොටුව කාර්යාලය - 011 2334565

ඒ නාඳුනන තුවක්කුකරු ඔබ හඳුනනවා ද?

බ්‍රසීලය සහ කොලොම්බියාව වැනි ලතින් ඇමෙරිකානු රටවල ඉතාම භයානක චාරිත්‍රයක් තිබේ. ඒ රටවල ආණ්ඩුවේ නිලධාරියකුගෙන් වැඩක් කර ගැනීමට ගිය මිනිහකුට ඒ නිලධාරියා වැඩේ කර නොදුන්නොත් වැඩේ කර ගැනීමට පැමිණි මිනිහා කෙළින්ම ගෙදර ගොස් පිස්තෝලයක් රැගෙනවිත් නිලධාරියාට වෙඩි තබයි. බ්‍රසීලය සහ කොලොම්බියාව වැනි රටවල කුඩු මුදලාලිලා බහුල ය. මේ මුදලාලිලා සමග ජනතාවට ලොකු සම්බන්ධයක් තිබේ. මිනිසුන්ගේ හදිසි ඕනෑ එපාකම් බලන්නේ මේ මුදලාලිලා විසිනි. එසේම සාමාන්‍ය කෙනකුට අසාධාරණයක් වුණොත් කුඩු මුදලාලිලා එයට විරුද්ධව කෙළින්ම වැඩට බසිති. කුඩු මුදලාලිලාට ඒ රටේ ආණ්ඩු සමග ලොකු සම්බන්ධයක් තිබේ. බ්‍රසීලයේ සාවෝ පාවුලෝ අගනුවර මෙන්ම කොලොම්බියාවේ බොගෝටා අගනුවර ද පාලනය කරන්නේ කුඩු ජාවාරම්කාරයන් සහ ආණ්ඩුවේ නිලධාරීන් හවුලේ ය. ඒ නිසා නාඳුනන තුවක්කුකරුවකු වෙතින් පමණක් නොව දන්නා හඳුනන තුවක්කුකරුවන් වෙතිනුත් ආණ්ඩුවේ නිලධාරීන් ඝාතනය වීම ඉතාම සරල සිද්ධියකි.

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති ලසන්ත වික්‍රමසේකර හෙවත් මිදිගම ලසා නමැති අය පෙරේදා උදේ සිය කාර්යාලයේ නිල අසුන මතදීම වෙඩිතබා මරණ ලදී. පිස්තෝලකරුවකු කිසිදු කලබලයක් නැතිව ඔහුගේ නිල කාමරයට පැමිණ වෙඩි තබන හැටිත්, ඉන් පසු එම පිස්තෝලකරුවා තවත් පුද්ගලයකුගේ මෝටර් සයිකලයේ නැඟී පලාගිය අයුරුත් සී.සී.ටී.වී. කැමරාවල සඳහන් වී ඇත. මීට සති කිහිපයකට පෙර දවසේ වෙඩිල්ල නමැති සංකල්පයක් මේ රටේ තිබිණි. එහෙත් දවසේ වෙඩිල්ල හදිසියේම නැවතුණේ ය. ඒ කෙහෙල්බද්දර පද්මේ ඇතුළු පිරිසක්, ඉෂාරා සෙව්වන්දික් පිටරට දී අත්අඩංගුවට ගෙන මෙරටට ගෙනඒමෙන් පසුව ය. ඒ නිසා දවසේ වෙඩිල්ල පිටුපස කෙහෙල්බද්දර පද්මේලා සිටින බව සියලු දෙනාම කල්පනා කළහ. එහෙත් වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිගේ මරණයෙන් පෙනී යන්නේ කෙහෙල්බද්දර පද්මේගේ කණ්ඩායම පමණක් නොව තවත් පාතාල කණ්ඩායම් ගණනාවක්ම මේ රටේ ක්‍රියාත්මක වන බව ය. මේ මරණය ආරංචි වූ සැණින් ඒ මොහොතේ දී පාර්ලිමේන්තුවේ සිටි මහජන ආරක්ෂක ඇමැති ආනන්ද විජේපාල කියා සිටියේ මිදිගම ලසාට විරුද්ධව නඩු හයක් තිබෙන බවත්, ඔහු මේ දක්වා සිටියේ අත්හිටුවූ සිරදඬුවම් මත බවත් ය. මේ කියමන කොතරම් දුරට යුක්තිසහගත ද යන්න අපි නොදනිමු. මිදිගම ලසා පාතාලකාරයකු බවට චෝදනා මිස ඒ සම්බන්ධයෙන් ඔප්පු වූ නඩු නැත. ඔහු අත්හිටුවූ සිරදඬුවම් මත එළියේ සිටියා නම් ඒ නඩුව ද ඉතා බරපතළ නඩුවක් නොවේ. සාපරාධී ක්‍රියාවලට වැරදිකරුවන් වන අයට අත්හිටුවූ සිරදඬුවම් දෙනු නොලැබේ.

ලංකාව සාපරාධී රාජ්‍යයක් බවට පත්වීම විශාල ඛේදවාචකයකි. මේ සාපරාධී රාජ්‍යය තුළ ගැහැනු පිරිමි දෙගොල්ලොම මිනී මරති. තවමත් මිනී මැරීමට "යකඩ කැල්ලක්" අතට නොගත්තේ පාසල් දරුවන් පමණි. මේ තත්ත්වය දරුණු වීමට පෙර දැඩි ලෙස මර්දනය කිරීම ආණ්ඩුවේ වගකීමක් වේ. ආණ්ඩුව අපරාධ මර්දනය සඳහා මොනදේ කළත් කවුරුත් එයට විරුද්ධවන්නේ නැත. එබැවින් අපරාධ මර්දනය සඳහා, අපරාධකරුවන්ගේ මිනිස් අයිතිවාසිකම් කොපමණ කැඩුණත් ආණ්ඩුව නීතිය ක්‍රියාත්මක කළ යුතුම ය. මිදිගම ලසා අපරාධ කර ඇත්නම් ඔහුට දඬුවම් ලැබිය යුත්තේ උසාවියෙනි. කාගෙන් හෝ ගාණක් කපාගත් කොන්ත්‍රාත් මිනීමරු මදාවිකාරයකු අතින් ඔහු මිය යා නොයුතු ය. මාකඳුරේ මධුෂ් පවා මිය යා යුතුව තිබුණේ සාක්ෂිකයන් අතින් නොව උසාවි තීන්දුවකට අනුව අලුගෝසුවා වෙතිනි. මේ රටේ මිනීමරුවන් එල්ලා නොමැරීම බරපතළ තත්ත්වයක් බවට පත්ව තිබේ. සියදෙනකු මැරුවත් තමන් එල්ලුම්ගස් නොයන බව අපරාධකරු දනී. ඔහු සිය සිර ජීවිත කාලය යහපත් සේ ගතකළොත් පොදු සමාවක් ලැබ නිවසට පැමිණීමට ද ඉඩකඩ ඇත.

වැලිගම යනු ඉතාම සංවේදී ප්‍රාදේශීය සභාවක් තිබූ පළාතකි. රාජපක්ෂ යුගයේ දී මේ ප්‍රාදේශීය සභාව ඉතාම දූෂිත විය. වැලිගම පළාතේ හෝටල් හිමියන්ට බාර් ලයිසන් දීම සඳහා පහසුකම් සැපයූ ලොක්කෙක් එකල මේ ප්‍රාදේශීය සභාවේ සිටියේ ය. ලයිසමක් ගැනීමට හෝටල්කාරයකු ආ විට මේ ලොක්කා ප්‍රාදේශීය සභාවේ කටයුතුවලට පුටු 100 ක් හෝ 200 ක් මිලට ගෙන දෙන ලෙස එම හෝටල්කාරයාට කියයි. බැලූ බැල්මට මෙය පොදු වැඩකි. ඒ නිසා හෝටල්කාරයා මේ පුටු තොගය ප්‍රාදේශීය සභාවට ගෙනගොස් බායි. එවිට ඔහුට බාර් ලයිසම ද දෙනු ලැබේ. ඉන් පසු ප්‍රාදේශීය සභා ලොක්කා අර පුටු 100 ට හෝ 200 ට හොර බිලක් සාදා එම පුටු තමාගේ මුදලින් ගෙනා බව සභාවට පෙන්වා මුදල් ගනු ලැබේ. මෙවැනි හොරු දකුණු පළාතේ ප්‍රාදේශීය සභා බොහොමයක සිටිති. මිදිගම ලසාගේ පෞද්ගලික චරිතය ගැන අපට අවබෝධයක් නැත. ඔහු හොරෙක් ද මිනීමරුවෙක් ද යන්න අපි නොදනිමු. කෙසේ වුවද ඔහු ප්‍රාදේශීය සභාවේ ආසනයකට තේරී පත්වුණේ මහජන ඡන්දයෙනි. මේ සභාවේ බලය ලබාගැනීමට මාලිමාවට බැරි විය. අන්තිමේ දී එහි සභාපති වන්නේ සමගි ජන බලවේගයේ ලසන්ත වික්‍රමසේකර ය. මේ අනුව මේ මරණය සම්බන්ධයෙන් සැකසංකා බොහොමයක් නිර්මාණය වී තිබේ. ඒ සැකසංකා සියල්ල ඉවත් කර සිය දෑත පිරිසිදු කර ගැනීම ආණ්ඩුවේ යුතුකම ය. එසේම ලසන්ත වික්‍රමසේකරගේ ඝාතකයා ද ඒ සඳහා කුමන්ත්‍රණය කළ අය ද වහා අත්අඩංගුවට ගත යුතු ය. මෙවැනි අයගෙන් සත්‍ය හෙළිදරව් කිරීමට රහස් පොලිසියට විශේෂ හැකියාවක් තිබේ.

පෑලියගොඩ විද්‍යාලඞ්කාර පිරිවෙන

150 වෙනි විද්‍යාලඞ්කාර දිනය (1875-2025)


1875
අතිගරු රත්මලානේ ශ්‍රී ධර්මාලෝක නාහිමි
1887
අතිගරු රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමි
1918
අතිගරු ලුණුපොකුණේ ශ්‍රී ධම්මානන්ද නාහිමි
1945
අතිගරු කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නාහිමි
1959
අතිගරු යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමි
1986
අතිගරු [illegible] ශ්‍රී ප්‍රඥාසාර නාහිමි
1990
අතිගරු වැලමිටියාවේ ශ්‍රී කුසලධම්ම නාහිමි
2021
අතිගරු නාවින්නේ ශ්‍රී සුගුණධම්ම නාහිමි
2022
වත්මන් පරිවේණාධිපති
අතිගරු වැලමිටියාවේ ශ්‍රී ඤාණරතන නාහිමි

බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ විද්‍යාලංකාර භූමිකාව

'විදුලකර යෙළසිය අභිමන්' සැමරුම් උළෙල ඔක්තෝබර් 27දා සිට නොවැම්බර් 2 දක්වා පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේදී පැවැත්වේ. මේ ඒ නිමිත්තෙනි.

ශ්‍රී ලංකාවේ බෞද්ධ පුනරුදය යථාවත්වීම සිදු වුයේ විද්‍යාලංකාර පිරිවෙන වැනි ශ්‍රේෂ්ඨ බෞද්ධ අධ්‍යාපන ආයතනවල මැදිහත්වීමෙනි. 1875 දී පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන් විසින් ආරම්භ කරන ලද මෙම ආයතනය, 19 වන සියවසේ අගභාගයේදී බෞද්ධ අධ්‍යාපනය, වටිනාකම් සහ ජාතික විඥානය යථා තත්ත්වයට පත් කිරීමට උත්සාහ කළ පුනරුදයක බුද්ධිමය හා සංස්කෘතික කේන්ද්‍රස්ථානයක් බවට පත්විය. බෞද්ධ පුනරුදය යනු ආගමික පිබිදීමක් පමණක් නොව, යටත් විජිත ආධිපත්‍යය සහ ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාප්තිය හමුවේ සමාජීය හා සංස්කෘතික පුනර්ජීවනයේ ව්‍යාපාරයක් ද විය. එය ශ්‍රී ලාංකිකයන්ගේ පරම්පරා සඳහා අධ්‍යාපනය, භාෂාව සහ අනන්‍යතාවය නැවත අර්ථ දැක්විය. එහෙව් අද්විතීය බෞද්ධ අධ්‍යයන කේන්ද්‍රයට මේවන විට වසර 150ක් සපිරෙද්දී ආපසු හැරී බැලීම අප කාගේත් යුතුකමක් හා වගකීමකි.

විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කරන ලද කාල පරිච්ඡේදය දැවැන්ත පරිවර්තනයකින් යුක්ත විය. බ්‍රිතාන්‍ය පාලනය යටතේ ක්‍රිස්තියානි මිෂනාරි පාසල්වලට වැඩිමත් අධ්‍යාපනයේ ආධිපත්‍යය හිමි විය. ඉංග්‍රීසි භාෂාව යනු බලය සහ වරප්‍රසාද සඳහා වූ ස්වර්ණමය දොරටුව විය. බෞද්ධ උරුමයේ සාරය ගිලිහෙමින් තිබිණි. සිංහල සහ පාලි අධ්‍යයනයන් ආන්තිකකරණයට ලක් විය. මෙම සංස්කෘතික ඛාදනය හඳුනා ගනිමින්, බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ විද්වතුන් බුද්ධාගම සහ පෙරදිග සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය ආරක්ෂා කර ඉදිරියට ගෙන යා හැකි දේශීය ඉගෙනුම් මධ්‍යස්ථාන නැවත ස්ථාපිත කිරීමට උත්සාහ කරමින් සිටියහ. ධර්මාලෝක හිමියන් විසින් විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කිරීම මෙම අභියෝගයට දැක්වූ සෘජු ප්‍රතිචාරයක් විය. එය හුදෙක් පැවිදි පන්සලක් හෝ පාසලක් ලෙස නොව පැවිදි සහ ගිහි විද්වතුන් සඳහා උසස් අධ්‍යාපනයේ නවීන ආයතනයක් ලෙස අධ්‍යාත්මික විනය මෙන්ම බුද්ධිමය දෙපළක් ලෙස සංකේතවත් විය.

පුනර්ජීවනය හෝ නව උපත යන අර්ථය ඇති බෞද්ධ පුනරුදය, ශ්‍රී ලංකා සමාජය තුළ බුද්ධාගමට හිමි නිසි ස්ථානය නැවත තහවුරු කිරීම අරමුණු කරගත් බහුවිධ ව්‍යාපාරයකි. එය පාලි, සංස්කෘත, බෞද්ධ දර්ශනය සහ පෙරදිග භාෂා පිළිබඳ පුළුල් අධ්‍යයනයන් පිරිනමන පිරිවෙන් ජාලයක් නිර්මාණය කිරීමෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට සහාය විය. අනෙක් අතට සදාචාරාත්මක හා ජාතික උපදෙස් සඳහා මධ්‍යස්ථාන බවට පත් වූ අතර, ආගමික ගුරුවරුන් පමණක් නොව සංස්කෘතික නායකයින් ද වූ භික්ෂූන් පරම්පරාවක් හැඩගස්වන ලදී. අධ්‍යාපනය හා සන්නිවේදනය සඳහා සිංහල සහ පාලි භාෂාව භාවිතා කිරීම කෙරෙහි ව්‍යාපාරයේ අවධාරණය, භාෂාමය අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමට සහ යටත්විජිත රාජ්‍යයේ සංස්කෘතික ආධිපත්‍යයට එරෙහි වූ දැවැන්ත අරගලයක පුරෝගාමීත්වයේ කොටසක් විය. බෞද්ධ අයිතිවාසිකම් පිළිගැනීම, පැවිදි ස්වාධීනත්වය සහ විදේශීය ආධිපත්‍යය යටතේ පීඩාවට පත් වූ ආගමික ආයතන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ද පෙරමුණ ගැනීම සිදුවිය.

දේශීය අධ්‍යාපනය ශාස්ත්‍රීය හා අධ්‍යාත්මික වශයෙන් පදනම් විය හැකි ආකාරය පෙන්නුම් කරමින් පිරිවෙන අනෙකුත් ආයතන සඳහා ආදර්ශයක් බවට පත්විය. එහි විෂය මාලාව හරහා, එය පාලි සහ සංස්කෘත ඉගෙනීම තර්කනය, දර්ශනය සහ ආචාර ධර්ම පිළිබඳ වැඩෙන උනන්දුව සමග ඒකාබද්ධ කළ ශාස්ත්‍රීය සම්ප්‍රදායක් පෝෂණය කළේය. කාලය ගෙවී යත්ම, එහි බුද්ධිමය දායකත්වය සහ එහි ආදි ශිෂ්‍යයන්ගේ බලපෑම ශ්‍රී ලංකාවේ බෞද්ධ උසස් අධ්‍යාපනය සඳහා නිල පිළිගැනීමක් ලබා ගැනීමට උපකාරී විය. මෙම පිළිගැනීම 1959 දී විද්‍යාලංකාර පිරිවෙන විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කරන ලද අතර, එකල ශ්‍රේෂ්ඨ බෞද්ධ විශ්වවිද්‍යාල දෙකෙන් එකක් වූ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය බවට පත්විය. පසුව, එය කැලණිය විශ්වවිද්‍යාලය ලෙස පරිණාමය විය.

විද්‍යාලංකාරයේ බලපෑම සමාජ හා දේශපාලන ක්ෂේත්‍ර දක්වා ව්‍යාප්ත විය. එමගින් බෞද්ධ පුනර්ජීවනය, සිංහල භාෂාමය අභිමානය සහ සංස්කෘතික ආත්ම විශ්වාසය යළි බලගැන්විණි. 20 වන සියවසේ මැද භාගය වනවිට මෙම සංස්කෘතික බලවේගය රටේ ජාතික පරිවර්තනයකට දායක විය. රාජ්‍ය භාෂාවක් ලෙස සිංහල භාෂාව පිළිගැනීම සහ ශ්‍රී ලාංකික අනන්‍යතාවයේ කේන්ද්‍රීය ලෙස බුදුදහම ස්ථානගත කිරීම සිදුවිය. මෙම වටිනාකම් තහවුරු කළ 1956 දේශපාලන පරිවර්තනයේ දෘෂ්ටිවාදී සමාජ සැකසුම සහ නායකත්වය ගොඩනැගීම විද්‍යාලංකාරය විසින් පෝෂණය කරන ලද බුද්ධිමය හා අධ්‍යාත්මික පසුබිම සෘජුව හෝ වක්‍රව බලපාන ලදී. මෙම යථාර්ථය අප අදට ගලපා ගත යුතුම ය.

විද්‍යාලංකාර පිරිවෙන වටා ඇති ව්‍යාපාරය මෙහෙයවනු ලැබුවේ ශාස්ත්‍රීයත්වය සහ දුරදර්ශී නායකත්වය ඒකාබද්ධ කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ චින්තකයින් විසිනි. රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන්ගේ උත්සාහයන්, විද්‍යෝදය පිරිවෙනේ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් වැනි සමකාලීනයන් විසින් පවා අනුගමනය කරන ලදී. මෙම භික්ෂූන් වහන්සේලා එක්ව ලෞකික හා ලෝකෝත්තර යන දෙඅංශයෙන්ම දැනුම හා සංස්කෘතික සහජීවනය රටට ලෝකයට දායාද කරන ලද බව අමුතුවෙන් කිව යුතු නොවේ.

ජාතික ජන බලවේගයේ ජනාධිපතිවරණ ජයග්‍රහණය යනු ඉතිහාසයේ පළමුවැනි වතාවට සාමාන්‍ය ජනයා වෙත බලය මාරුවූ ඓතිහාසික මොහොතකි. ඉක්බිතිව පැවති මහ මැතිවරණයෙන් එය වඩ වඩාත් තහවුරු කෙරිණි. පූර්ව මැතිවරණ සමයේ එනම් 2024 නොවැම්බර් මස 06 දින මහවැලි කේන්ද්‍රයේදී ජාතික ජන බලවේගයට සහය පළකරමින් එමගින් රටට අලුත් උපතක් සනිටුහන් කරනු ඇතැයි සංකේතවත් කරමින් "පුනරුදය උදෙසා ජනතා ව්‍යාපාරය" නමින් සංවිධානයක් බිහි විය. එහි සමාරම්භක උළෙලට එක්වෙමින් ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා පළ කළ අදහසක මෙසේ සඳහන් විය.

"අත්හැරුණු දේ වේගයෙන් උකහා ගැනීමත්, ජනතාව නව පරිවර්තනීය යුගයක් කරා, මෙහෙයවීමත් අපි දැන් කළ යුතුයි. එහිදී අපි සංවාදයට ලක්කළ යුතුයි. ජාතික පුනරුදයක ලක්ෂණ මොනවාද කියලා. අපේ රටේ තිබෙන විභවතාවන් සැලකිල්ලට ලක්කර ගනිමින්, අපේ විශිෂ්ටතාවයින් උත්සාහ කරන ලද, නිෂ්පාදනය මත ආර්ථික ප්‍රවේශයකට වේගයෙන් අවතීර්ණ විය යුතුයි. මූලික වශයෙන් අපේ ප්‍රාථමික නිෂ්පාදනයන් වර්ධනය කර ගත යුතුයි. කොවිඩ්වලින් පසු රාජ්‍යයන්වලට තමන්ගේ ආර්ථික ප්‍රතිපත්තීන් ගැන නැවත සලකා බලන්න බලකර තිබෙනවා. කොවිඩ් කාලේ වරායවල්වල ඉඩ මදිවෙන තරමටම නැව් ඇන්කර් කර තබන්න සිදුවුණා. ගුවන් යානා ගොඩගැස්සෙන ඉඩ මදිවෙන තරමට ගුවන් යානාවලින් පිරෙන්න පටන් ගත්තා. සයිබර් ලෝකයේ අපි ඒකාබද්ධ වුණාට ලෝකයේ සෑම රාජ්‍යයක්ම තමන්ගේ ජාතික සීමාවන් ඇතුලේ හුදෙකලා වෙන්න පටන් ගත්තා. හැමෝටම බල කළා තමන්ගේ මූලික අවශ්‍යතා වන ආහාර නිෂ්පාදනය කිරීමට අවධානය යොමු කිරීමට.

ඒ වගේම යටත් වුණු නිහඬ වුණු පුරවැසියන් වෙනුවට නව පුරවැසි ක්‍රියාකාරීත්වයක් සහිත ජනතාවක් අපේ රටට අවශ්‍යයි. ස්ත්‍රී, පුරුෂ ආදී වශයෙන් සමාජයේ සියලු බෙදීම් ඉවත් කළ සමාජයක් ගොඩනැගීම අවශ්‍යයි. ඒ වගේම විසිවැනි සියවසේ අධ්‍යාපනය සහ සෞඛ්‍යය ක්ෂේත්‍රයේ ලබාගත් මහා ජයග්‍රහණ අපේ ජනතාවට අත්කර දී නැහැ. එනිසා අධ්‍යාපනයේ සෞඛ්‍යයේ පුනරුදයක් අවශ්‍යයි. ප්‍රවාහනය ගත්තත් පුරවැසියන්ගේ ආදායමෙන් 35% - 40% ක් අතර වැය කිරීමට සිදුවෙලා තිබෙනවා. එතරම් ප්‍රමාණයක් වැය කළත් බොහෝ වේලාවක් පාරේ බස් එකේ නැත්නම් තමන්ගේ වාහනයේ රස්තියාදු වීමට සිදුවී තිබෙනවා. යහපත් පොදු ප්‍රවාහනයක් අපිට අවශ්‍ය නැද්ද? අද රටේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් දෙමාපියන් කොතරම් කැපකිරීම් කරනවද? ආහාර වේල නොගෙන දරුවන්ට උගන්වන දෙමාපියන් ඉන්නවා. දරුවන්ට යහපත් අධ්‍යාපනයක් ලැබෙන සියලු පුරවැසියන්ට සෞඛ්‍ය ආරක්ෂාවක් තහවුරු වෙන ඉතා දියුණු ප්‍රවාහන පද්ධතියක් සහිත සේවාවක් තහවුරු කරන නව යුගයක් නිර්මාණය කළ යුතුයි."

එවක ජනාධිපතිවරණ අපේක්ෂකයා වූ අනුර කුමාර දිසානායක මහතා එම පුනරුද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ජනවරමක් හිමිවී තිබේ. සමානුපාතික නියෝජන ක්‍රමයක් තුළ ඉතිහාසයේ නොවූ විරූ බලයක් සහිත ආණ්ඩුවක් තමා සමග සිටියදී, පාලන බලයේ මෙහෙයුම්කරු ලෙස ජනාධිපතිවරයාගේ ධුර කාලයෙන් වසරකට පසු ආපසු හැරී බැලීමේදී අතපසුවී ඇත්තේ කුමක්දැයි සිහිකල්පනාවෙන් බැලිය යුතු ය. වසර 150ක් ගතවිද, විද්‍යාලංකාර පිරිවෙන කේන්ද්‍ර කරගත් පුනරුද ව්‍යාපාරයෙන් අදටත් රටට ඉතිරි කර ඇති මහඟු දායාදයන් මෙන්ම සංස්කෘතික කතිකාවෙන් ජනාධිපතිවරයා ප්‍රමුඛ වත්මන් ආණ්ඩුවේ ක්‍රියාකාරීන්ට ගත හැකි ආදර්ශ බොහෝ ය.

පෑලියගොඩ විද්‍යාලංකාරයේ මහ පරිවේණාධිපති සහ අධ්‍යක්ෂක මෙන්ම කැලණිය විශ්වවිද්‍යාලයේ කුලපති ලෙස කටයුතු කළ පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම හිමියන් සහ සසුනටත්, රටටත් කළ සේවය කිසිවෙකුටත් අමතක කළ නොහැකි ය. උන්වහන්සේගේ අපවත් වීමෙන් පසු විද්‍යාලංකාර පිරුවෙන්හි අධ්‍යක්ෂ පදවියට සහ උපපරිවේණාධිපති පදවියට පත් වැලමිටියාවේ ඥාණරතන හිමියන්, 2022 දී කොළඹ හලාවත දෙදිසාවේ උපප්‍රධාන සංඝනායක පදවියෙන් පුද ලැබිය. නාවින්නෙ සුගුණධම්ම නාහිමිපාණන් වහන්සේගේ අපවත්වීමෙන් පුරප්පාඩු වූ විද්‍යාලංකාර පරිවේණාධිපති පදවිය අද දවසේ වැලමිටියාවේ ඥාණරතන නාහිමියන් විසින් හොබවනු ලබයි. කීර්තිමත් පඬිරුවන් වන උන්වහන්සේගේ අවවාද, අනුශාසනා හා මගපෙන්වීම් වත්මන් පාලනයට බෙහෙවින් වැඩදායී වනු ඇති බව අපගේ විශ්වාසය යි.

විද්‍යාලංකාර පිරිවෙන වටා ඇති ව්‍යාපාරය මෙහෙයවනු ලැබුවේ ශාස්ත්‍රීයත්වය සහ දුරදර්ශී නායකත්වය ඒකාබද්ධ කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ චින්තකයින් විසිනි. රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන්ගේ උත්සාහයන්, විද්‍යෝදය පිරිවෙනේ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් වැනි සමකාලීනයන් විසින් පවා අනුගමනය කරන ලදී. මෙම භික්ෂූන් වහන්සේලා එක්ව ලෞකික හා ලෝකෝත්තර යන දෙඅංශයෙන්ම දැනුම හා සංස්කෘතික සහජීවනය රටට ලෝකයට දායාද කරන ලද බව අමුතුවෙන් කිව යුතු නොවේ. ඔවුන්ගේ බලපෑම ආරාම බිත්තිවලින් ඔබ්බට සමාජයට විහිදුණු අතර, සංස්කෘතික අව්‍යාජභාවය සහ සදාචාරාත්මක ශක්තිය තුළ මුල් බැසගත් ජාතික අනන්‍යතාවයක් ගොඩනැගීමට උත්සාහ කළ ගිහි බෞද්ධයන්, ලේඛකයින් සහ දේශපාලන ප්‍රතිසංස්කරණවාදීන්ට ආභාසය හා මගපෙන්වීම නොමඳව ලබා දුන් බව නොරහසකි.

රටකට යම් පුනරුදයක් උදා කළ යුතු නම් එහි ජාතික අනන්‍යතාව හා සංස්කෘතික පදනම නොතකා කිසිදු වැඩපිළිවෙළක් ඉහළින් කෘත්‍රිමව පැටවිය හැකි නොවේ. පටවන ලද නමුත් ඒවා කිසිසේත්ම පාදම සමග පෑහෙන්නේ නැත. බටහිරින් ආනයනය කරන ලද සංකල්ප හා වැඩසටහන් මෙරට ජනජීවිතය හා චෛන්ද්‍රිය බැඳීමක් නොමැතිව පාවෙන සංකල්ප බවට පත්ව ඇත්තේ එබැවිනි. වත්මන් ආණ්ඩුවට ඉදිරිගාමී ලෙස සිතන ජාතික ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළක් ඇති බවත්, එය ක්‍රියාවට නැංවීමට අව්‍යාජ උත්සාහයක් ඇති බවත් පිළිගත යුතු ය. එහෙත් එය යථාර්ථයක් බවට පත් කර ගැනීමට නම් බෞද්ධ උරුමය, සංස්කෘතික සාරය තුළින් සුපුෂ්පිත ජන විඥානය වටහා ගත යුතු ය. එහි ජන විඥානය සමග ගනුදෙනු කළ හැකි භාෂාවක්, අන්තර් සම්බන්ධයක් ගොඩනගා ගනිමින් එය ශක්තිමත් කළ යුතුය. වසර 150ට පසුව වුව විද්‍යාලංකාර පිරිවෙන තුළින් රටට දායාද කළ පුනර්ජීවනය, වත්මන් ආර්ථික, සමාජ, දේශපාලනික, සංස්කෘතික ගෝලීය සන්දර්භය තුළ නැවත අර්ථ දක්වා ගත යුතු ය. සැබෑ සාධනීය වෙනසක්, පුනරුදයක් උදාකරගත හැක්කේ එවැනි දුර දක්නා වැඩපිළිවෙළකින් පමණි.

ආචාර්ය
රංග ජයකොඩි



ආතා අපේ

ඝාතනය	වැලිගම
නෙත යොමුවුණා	සැමගෙම
සිතාලා	දුරටම
ආතගෙන් මතු වුණා	කවිකම
ඇති බවට	තර්ජන
ලියා ඇතිමුත්	පෙරදින
නොතැකීම එය	ගැන
පොලිස්පති පහදන්න අද	දින

- මුණුබුරා

යුක්රේනයට සටන් විරාමයක් ඉල්ලමින්

ට්‍රම්ප් රජයෙන් රුසියානු තෙල් සමාගම් දෙකකට සම්බාධක



යුක්රේන යුද්ධය නතර කිරීම සඳහා වහාම සටන් විරාමයකට එකඟ වන ලෙස රුසියානු ජනාධිපති ව්ලැදිමීර් පුටින් හට බල කරමින් රුසියාවේ විශාලතම තෙල් සමාගම් දෙකකට එරෙහිව සම්බාධක පැනවීමට ඇමෙරිකානු රජය විසින් පෙරේදා (22දා) පියවර ගෙන තිබේ. රුසියාවට එරෙහිව පැනවූ නව සම්බාධක සම්බන්ධයෙන් මාධ්‍යයට කරුණු අනාවරණය කර ඇති ජනාධිපති ට්‍රම්ප් එය පැනවීමට සුදුසු කාලය මෙය බව හැඟී යෑම නිසා සම්බාධක පැනවූ බව සඳහන් කර තිබේ. කෙසේ වුවද රුසියාවට එරෙහිව සම්බාධක පැනවීමට තමා දිගු කලක් බලාගෙන සිටි බවත්, යුක්රේන යුද්ධය නිමවීමට නියමිත නිසා මෙම සම්බාධක වැඩිකල් බල නොපවත්වනු ඇති බවත් ඇමෙරිකානු ජනාධිපතිවරයා අවධාරණය කර තිබේ. ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් සති ගණනාවක් මුළුල්ලේ යුක්රේන යුද්ධයට දායකත්වය ලබා දීම හේතුවෙන් රුසියාවට එරෙහිව දඬුවම් පනවන බවට තර්ජනය කර තිබුණද පෙරේදා වන තෙක් එය ඉටුකිරීමට ඔහු විසින් පියවර ගෙන නොතිබිණි.

මේ අතර හංගේරියාවේ පැවැත්වීමට නියමිතව තිබූ යුක්රේන යුද්ධය නතර කිරීමේ සාකච්ඡා අවලංගු කිරීමට තමා පියවර ගත්තේ 'අපට යෑමට අවශ්‍ය වූ ස්ථානයට යෑමට නොහැකි බව හැඟී ගිය නිසා' යැයි ට්‍රම්ප් ජනාධිපතිවරයා පවසා තිබේ. රුසියාවට එරෙහිව ඇමෙරිකාව විසින් සම්බාධක පැනවීම යහපත් සංඥාවක් ලෙස හඳුන්වා දී ඇති යුක්රේන ජනාධිපති වොලොදිමීර් සෙලෙන්ස්කි සෙසු රටවල්ද රුසියාවට දැඩි පීඩනයක් එල්ල කළහොත් යුක්රේන යුද්ධය නිම කිරීමේ සටන් විරාමයක් කඩිනමින් ක්‍රියාත්මක වනු ඇතැයි පවසා තිබේ.

ලූව්රේ කෞතුකාගාරයෙන් ආභරණ පැන්නූ සොර මුල හඳුනාගෙන නැත්තේ සීසීටීවී කැමරා දුර්වල නිසාලු



ප්‍රංශයේ ලූව්රේ කෞතුකාගාරයෙන් ආභරණ කට්ටලයක් සොරකම් කරන ලද සොර කල්ලිය හඳුනාගැනීමට තවමත් අපොහොසත් වී ඇත්තේ කෞතුකාගාරය අවට සවිකර ඇති සී සී ටී වී කැමරා පද්ධතිය පැරණි හා දුර්වල වීම නිසා බව කෞතුකාගාරයේ අධ්‍යක්ෂ ලවුරන්ස් ඩෙස්කාස් පවසා තිබේ. අධ්‍යක්ෂවරියට අනුව සොර කල්ලිය ලූව්රේ කෞතුකාගාරයට කඩා වැදී තිබූ බාහිර බිත්තිය නිරීක්ෂණය කිරීම සඳහා තිබී ඇති එකම කැමරාවද සොරකම් කරන ලද ආභරණ තැන්පත් කර තිබූ ඇපලෝ ගැලරියට මඟපෙන්වන පළමු මහලෙහි සඳලුතලයෙන් ඉවතට යොමු වී තිබී ඇත.

දරුණු අපරාධකරුවන්ගෙන් කිසිවෙකුටත් ආරක්ෂා විය නොහැකි අතර එය ලූව්රේ කෞතුකාගාරයට ද අදාළ බව එහි අධ්‍යක්ෂවරිය වැඩිදුරටත් පවසා තිබේ.

ඉකුත් සති අන්තයේදී ලූව්රේ කෞතුකාගාරයෙන් සොර කල්ලියක් විසින් සොරකම් කර තිබූ ආභරණ 8කින් යුතු කට්ටලයෙහි වටිනාකම යුරෝ මිලියන 88ක් බව ඇස්තමේන්තු කර ඇති අතර එම ආභරණ අතර ප්‍රංශයේ හිටපු මාරි ඇමෙලි හා හොටෙන්සේ යන රැජිනියන්ගේ කරාබුද වන බව අනාවරණය වී තිබේ.

විදෙස

සංස්කරණය
ඒමන්ති මාරඹේ

එංගලන්ත සිසුවෙකු ඝාතනය කළ 15 හැවිරිදි ශිෂ්‍යයා දිවි ඇති තෙක් සිරගෙට

එංගලන්තයේ ෂෙෆීල්ඩ් නගරයේ 16 හැවිරිදි යෞවනයකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් වරදකරු වූ 15 හැවිරිදි මුස්ලිම් ජාතික පිරිමි ළමයකුට වසර 16ක අවමයකට යටත්ව ජීවිතාන්තය දක්වා වූ සිර දඬුවමක් නියම කිරීමට එංගලන්ත අධිකරණයක් විසින් පියවර ගෙන තිබේ. මොහොමඩ් උමාර් ඛාන් යනුවෙන් නම් කර ඇති ඝාතකයා ඉකුත් පෙබරවාරි මස 03 වැනිදා ෂෙෆීල්ඩ් නගරයේ සියලු සාන්තුවරයන්ගේ කතෝලික උසස් පාසලේදී හාවි විල්ගූස් නමැති ශිෂ්‍යයාගේ පපුවට පිහියෙන් ඇන මරණයට පත් කර තිබූ බව වාර්තා වී තිබිණි.

පාසල් දිවා කාලය තුළදී සිදුව ඇති මෙම ඝාතනයට මුල් වී ඇත්තේ එම ඝාතකයා හා මියගිය සිසුවා අතර හරක් මාංශ සම්බන්ධයෙන් හුවමාරු කරගත් පණිවිඩ බව අනාවරණය වී තිබේ. අනතුරුව එම පණිවිඩ හුවමාරුව ගැටුමක් දක්වා දුරදිග ගොස් ඇති බව හෙළි වී තිබේ.

ඉකුත් අගෝස්තු මාසයේදී සිසුවකු මරා දැමීමේ චෝදනාවට වරදකරු වී ඇති උමාර් ඛාන් පාසලට පිහි රැගෙන ඒමේ පුරුද්දක් තිබී ඇති බව අධිකරණ නඩු විභාගයේදී අනාවරණය කර තිබේ.

ශාන්තිකර සාගරයේ යාත්‍රා කළ යාත්‍රාවකට එල්ල වූ ඇමෙරිකානු ප්‍රහාරවලින් 3ක් මරුට

ශාන්තිකර (පැසිෆික්) සාගරයේ යාත්‍රා කරමින් තිබූ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කළ බවට චෝදනා එල්ල වී තිබූ යාත්‍රාවකට ඇමෙරිකානු හමුදාවන් විසින් එල්ල කර ඇති ප්‍රහාරයක් හේතුවෙන් එම යාත්‍රාවේ ගමන් ගත් තිදෙනකු මියගොස් තිබේ. මෙම ප්‍රහාරයට දිනකට පෙර ඇමෙරිකානු හමුදාවන් විසින් ශාන්තිකර සාගරයේ යාත්‍රා කරමින් තවත් බෝට්ටුවකට ප්‍රහාර එල්ල කර තිබූ අතර ඉන් පුද්ගලයන් දෙදෙනකු මියගොස් තිබිණි.

ඇමෙරිකානු හමුදා විසින් ප්‍රහාරයන් එල්ල කර ඇති අදාළ යාත්‍රා දෙකම මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා යොදාගනු ලබන ජාත්‍යන්තර මුහුදු මාර්ගවල ගමන් කරමින් තිබූ අතර ඒවා මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරමින් තිබූ බවට විශ්වාස කරන බව ඇමෙරිකානු ආරක්ෂක ලේකම් පීට් හෙග්සෙත් පවසා තිබේ. ඇමෙරිකානු හමුදාවන් විසින් ඉකුත් සැප්තැම්බර් 02 වැනිදා සිට මේ දක්වා ගතවූ කාලයේදී ජාත්‍යන්තර මුහුදේ ගමන් කරමින් තිබූ යාත්‍රා 9කට මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන බවට චෝදනා කරමින් ප්‍රහාරයන් එල්ල කර තිබේ.

යාල වනෝද්‍යානයේ සතුන් දඩයම් කළ 3ක් දැලේ

දෙබරවැව - ඒ. ඒ. ප්‍රේමසිරි

යාල ජාතික වනෝද්‍යානයේ කොට්ඨපාන ප්‍රදේශයේ සිදුකළ හදිසි වැටලීමකදී ගිනි අවියක් සමඟ මරණ ලද වල් ඌරකු, මුවකු සහ වියළන ලද මස් තොගයක් සමඟ සැකකරුවන් තිදෙනකු වනජීවී නිලධාරීන් අත්අඩංගුවට ගෙන තිබේ.

වනෝද්‍යානය තුළ දඩයමේ යෙදෙන පිරිසක් පිළිබඳව ලැබුණු තොරතුරක් මත මෙම වැටලීම සිදුකර ඇති අතර, අත්අඩංගුවට ගත් සැකකරුවන් රැකියාව ලෙස දඩයමේ යෙදෙන පිරිසක් බවට ඔවුන්ගෙන් කළ ප්‍රශ්න කිරීමේ දී අනාවරණය කර ගෙන තිබේ.

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ සැකකරුවන්ට එරෙහිව චෝදනා ගොනුකර ඔවුන් තිස්සමහාරාම අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

පෙදරේරු ශිල්පියා මහමඟදී ඇහිලූ රු. 80,000 ක් සහිත පසුම්බිය හිමිකරුට

බඩල්කුඹුර - රවිඳු ගුණතිලක

කුඩාඔය පොලිස් වසමට අයත් සමකිපුර පදිංචි පෙදරේරු ශිල්පියකු වන ජී.ඩබ්ලිව්. ලක්ෂ්‍රිය ලාල් මහතා විසින් කුඩාඔය බලහරුව මාර්ගයේදී වැටී තිබී අහුලා ගත් රුපියල් අසූදහසක් සහිත මුදල් පසුම්බියක් පොලිසියට භාරදීමෙන් අනතුරුව අයිතිකරුට භාරදී ඇත.

ඌව පැල්වත්ත ප්‍රදේශයේ පදිංචි මව සහ පියා කුඩාඔය බලහරුව මාර්ගයේ යමින් සිටියදී පියාගේ මුදල් පසුම්බිය නැතිවී ඇත.

එම මාර්ගයේ ගමන් කරමින් සිටි මෙම පෙදරේරු ශිල්පියා මුදල් පසුම්බියා අහුලාගෙන ඇති අතර එය කුඩාඔය පොලිසියට භාරදීමෙන් අනතුරුව පසුම්බියේ තිබූ ඩබ්ලිව්.එම්. අසිල අනුහස් නැමති ඔහුගේ දරුවාගේ සිසු උදාන සාමාජික කාඩ් පතේ තොරතුරු අනුව දරුවාගේ පාසල පැල්වත්ත නවෝදා පාසල බවට හඳුනාගෙන ඇත.

ඒ අනුව පොලිසිය මඟින් එම පාසලේ විදුහල්පතිවරයා දැනුවත් කර ඔවුන් පොලිසියට ගෙන්වා ගෙන මුදල් පසුම්බිය අහුලාගත් පුද්ගලයා ඉදිරියේ අයිතිකරුවන්ට භාරදී තිබේ.

පසුම්බියේ තිබූ මුදල් ඇතුළු කිසිවක් අඩුවී නොමැති බව පැවසූ අයිතිකරුවන් පසුම්බිය අහුලාගත් පෙදරේරු ශිල්පියාට සිය ප්‍රණාමය පුදකර සිටි බව කුඩාඔය පොලිස් ස්ථානාධිපති ජේ.ඒ.පී. කුමාරසිංහ මහතා පැවසීය.

අක්කර විසිපන්දහසක වී වගාවට කිරිඳිඔය ජලාශයෙන් ජලය

කේ. ජයසිංහ,දෙබරවැව - ඒ. ඒ. ප්‍රේමසිරි

2025/26 මෙවර මහ කන්නයේ කිරිඳිඔය ව්‍යාපාරයේ කුඹුරු අක්කර විසිපන් දහසක වී වගා කිරීම සඳහා ජලය නිකුත් කරන බව කිරිඳිඔය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු කේ. ජයසිංහ මහතා පැවැසීය.

තිස්සමහාරාම හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති කන්න රැස්වීමේදී ගොවි සංවිධාන හා තිස්සමහාරාම වාරිමාර්ග ඉංජිනේරුවරයා සමඟ ගත්තා ලද තීන්දු තීරණවලට අනුව දින නියම කරගත් පරිදි කිරිඳිඔය ව්‍යාපාරයේ නව සංවර්ධන ප්‍රදේශයට අයත් දකුණු ඉවුර හා වම් ඉවුර ප්‍රදේශයට අයත් කුඹුරු අක්කර පහළොස් දහසකට සහ තිස්සමහාරාම පැරණි වාරි පද්ධතියට අයත් ප්‍රධාන වැව් පහ යටතේ පෝෂණය වන කුඹුරු අක්කර දහදාහකට මෙලෙස ජලය නිකුත් කරන බවද නේවාසික ව්‍යාපාර කළමනාකරු පැවැසුහ.

ඒ අනුව වීරවිල වැව යටතේ පෝෂණය වන කුඹුරු අක්කර 3000 කට මංගල දියවර නිකුත් කිරීම 27 දින සිදුකරන බව ඔහු සඳහන් කළේය.

බිබිල දිස්ත්‍රික් කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථානයට සිසුන් බඳවා ගැනේ

බඩල්කුඹුර - රවිඳු ගුණතිලක

ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් බිබිල දිස්ත්‍රික් කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථානයට සිසුන් බඳවා ගැනීම මේ දිනවල සිදුකෙරේ.

එක් අවුරුදු පාඨමාලාවක් වන කෘෂිකර්ම ක්ෂේත්‍ර සහායක පාඨමාලාව සඳහා අපොස සාමාන්‍ය පෙළ විභාගය සම්මාන දෙකක් සහිතව සමත් අවුරුදු 18 වැඩි තරුණ තරුණියන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකි බැව් ගොවිපළ කළමනාකරු පාලිත බුලත්සිංහල මහතා පැවසීය. වැඩිදුර විස්තර 055-2265423 දුරකථන අංකයෙන් ලබා ගත හැක.

දීපාවලී සැමරීම සඳහා සෙල්ලම් තුවක්කු යොදාගත් දරුවෝ 122ක් රෝහලේ - 14ක් අන්ධ වෙලා

ඉකුත් සඳුදා හින්දු භක්තිකයන් විසින් සැමරූ දීපාවලි උත්සවයේදී ඉන්දියාවේ ළමුන් අතර ප්‍රකට 'කාබයිඩ්' හා රතිඤ්ඤා තුවක්කු පත්තු කිරීමට යෑමෙන් මධ්‍ය ප්‍රදේශ් ප්‍රාන්තයේ ළමුන් 122කට වැඩි පිරිසක් දරුණු අක්ෂි තුවාල සහිතව රෝහල්ගත කර ඇති බව වාර්තා වී තිබේ. එසේ රෝහල්ගත කර ඇති ළමුන්ගෙන් 14 දෙනකුගේ ඇස්වල පෙනීම නැති වී ගොස් ඇති බව ඉන්දීය මාධ්‍ය විසින් වාර්තා කර තිබේ.

ඉන්දියාවේ විශාල පිරිසක් සමරනු ලබන දීපාවලි උත්සවයට නැතිවම බැරි භාණ්ඩයක් ලෙස කුඩා දරුවන් අදාළ 'කාබයිඩ්' හා රතිඤ්ඤා තුවක්කු සලකන බව වාර්තා වේ.

සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක. 01 සහ 2011 අංක. 19 මඟින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

එම් එස් එල් පෙරේරා

ගිණුම් අංකය : 1003 5774 1489

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025/07/30 වෙනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක. 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වයි එන් දෙල්පෙච්චිත්‍ර විසින් ලියා සහතික කරන ලද 2018 නොවැම්බර් 15 දාතම හා අංක 3692 දරන උකස් බැඳුම්කරය සහ 2023 මාර්තු 24 දාතම හා අංක 5811 දරන උකස් බැඳුම්කරය යන උකස් බැඳුම්කර දෙක මඟින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මෙහි [illegible] ලසන්ත පෙරේරා බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින්ද, එකී අංක 3692 සහ 5811 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැට හය ලක්ෂ පනස් නව දහස් අනූ තුනයි ශත හැත්තෑ එකක (රු 6,659,093.71) මුදලක් 2025 අප්‍රේල් 06 වෙනි දිනට, එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැට හය ලක්ෂ පනස් නව දහස් අනූ තුනයි ශත හැත්තෑ එකක (රු 6,659,093.71) මුදල ද 2025 අප්‍රේල් 07 වෙනි දින සිට එකී අංක 3692 සහ 5811 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස් හය ලක්ෂ විසි හය දහස් හාරසිය විසි හතරයි ශත අනූ දෙකක (රු 5,626,424.92) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම බිංදුවක් (12.0%) මඟින් වූ පොලියද, දන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, නඩුගාස්තුවට ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 3692 සහ 5811 දරන උකස් බැඳුම්කර මඟින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී කේ ඊ සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

ඉහත කී උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවන් තුළ මහරගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාශයේ පන්නිපිටිය දකුණ 531 A දරන ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පන්නිපිටිය පිහිටි අවිස්සාවේල්ල පාර වරිපනම් අංක 536/35 දරන "කඩවලදෙණිය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සී විතුමගේ විසින් සාදන ලද 2017 දෙසැම්බර් 23 දාතම හා අංක 4609A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට මෙදාවෙන්කොට ලොට් X වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් - උතුරට - අංක 4609 දරන පිඹුරේ ලොට් 2A නැගෙනහිරට - අඩි 10 පළල පාර (අංක 1067 දරන පිඹුරේ ලොට් 3) දකුණට - ලොට් Y සහ බස්නාහිරට - දොඩන්ගොඩ ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම අටක් (0A-0R- P -9.8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ පිඹුරු අංක 4609 A පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව B 485/107 යටතේ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී පන්නිපිටිය පිහිටි අවිස්සාවේල්ල පාර වරිපනම් අංක 536/35 දරන "කඩවලදෙණිය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන සී විතුමගේ විසින් සාදන ලද 2017 දෙසැම්බර් 23 දාතම හා අංක 4609A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට මෙදාවෙන්කොට ලොට් Y වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් - උතුරට - ලොට් X නැගෙනහිරට - අඩි 10 පළල පාර (අංක 1067 දරන පිඹුරේ ලොට් 3) දකුණට - පෞද්ගලික පාර සහ බස්නාහිරට - දොඩන්ගොඩ ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයක් (0A-0R- P-6.0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ පිඹුරු අංක 4609 A පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව B 485/108 යටතේ දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එම් සමරනායක විසින් සාදන ලද 1984 නොවැම්බර් 01 දාතම හා අංක 1067 දරන පිඹුරේ ලොට් 3 දිගේ හා ඒ මඟින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,
සමාගම් ලේකම්

ප්‍රසිද්ධ වෙන්දේසියක් යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමෙ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම කෝරළේ, පල්ලේ පත්තුවෙ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවෙ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර මාගම්මන ග්‍රාම නිලධාරී වසමෙ, හෝමාගම පිහිටි "අඹගහලන්ද" නමැති ඉඩමට මිනුම්පති විසින් මැන සාදන ලද අංක 520004 සහ 2016.09.14 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 0058 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටස

ප්‍රමාණය හෙක්ටයාර් බිංදුවයි දශම බින්දුවයි හයයි තුනක් (හෙක්. 0.063)

විශාල ඉඩම් කැබැල්ල සහ එහි තිබෙන ගොඩනැගිලි, තිරවුරු සහ සවිකිරීම සහ ඒ මත පිහිටි ගහකොළ, වැවිලි, පලතුරු ආදී සැම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 00030015428 දරන හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත.

දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඕවිටිගම ග්‍රාම නිලධාරී වසමෙ, ඕවිටිගම පිහිටි මිනුම්පති විසින් මැන සාදන ලද අංක 520025 දරන කඩඉම් සිතියමෙ නිරූපිත කලාප අංක 07 හි ඉඩම් කැබලි අංක 0030 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස

හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි නවයයි දෙකයි තුනක් (හෙක්. 0.0923)

විශාල ඉඩම් කැබැල්ල වන අතර, අංක 00030066030 හිමිකම සහතිකයේ සඳහන් මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මීගොඩ, පරණ පාර, අංක 635/7 දරන ලිපිනයේ සිට ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන, ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංක 5795 දරන, ඇල්ෆා එන්ටර්ප්‍රයිසස් ආයතනයේ හිමිකරු වන කපු ආරච්චිගේ ජානක ප්‍රදීප් චන්ද්‍රකුමාර (ජාතික හැඳුනුම්පත් අංක 782130480V දරන) (මෙහි මින්මතු ඇතැම් තැනක බන්ධනදායී වශයෙන් හඳුන්වන) යන අය විසින් සමාගම ලියාපදිංචි කිරීමේ අංක PB676PQ දරන, යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වන) වෙතින් මූල්‍ය ණය පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී විසින්, පිළිවෙලින් ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. ඩබලිව්. මලෙවිපතිරණ සහ කේ. පී. නයන්ත්‍රා සහතික කරන ලද පිළිවෙලින් අංක 520004 දරන කඩඉම් සිතියමෙ නිරූපිත ලොට් (ඉඩම් කැබලි අංක) 0058 සහ අංක 520025 දරන කඩඉම් සිතියමෙ නිරූපිත ලොට් (ඉඩම් කැබලි අංක) 0030 දරන ඉඩම් කැබලි සම්බන්ධයෙන් ප්‍රාථමික උකස් බැඳුම්කර 02ක් ලියා අත්සන් කොට තබා, ඉහත කී මූල්‍ය පහසුකම් ආපසු ගෙවීම සඳහා එකී කපු ආරච්චිගේ ජානක ප්‍රදීප් චන්ද්‍රකුමාර යන අයට (මෙහි මින්මතු ඇතැම් තැනක "බන්ධනදායී" වශයෙන් හඳුන්වන) සහ ෆ්ලෝරි මෝසස් යන අයට (මෙහි මින්මතු ඇතැම් තැනක "උකස්කරු" වශයෙන් හඳුන්වන) (ජාතික හැඳුනුම්පත් අංක 768002487V දරන) අයිති මෙම පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව,

පළමු උපලේඛනයේ දැක්වෙන දේපළ වර්ෂ 2025 ක්වූ නොවැම්බර් මස 26 වැනි දින පෙ.ව. 11.30 ට ද දෙවන උපලේඛනයේ දැක්වෙන දේපළ වර්ෂ 2025 ක්වූ නොවැම්බර් මස 26 වැනි දින ප.ව. 1.00ට ද දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ වෙත පිවිසීම් :-

පළමු උපලේඛනය හෝමාගම නගරයේ සිට හෝමාගම - දියගම පාරට හැරී කිලෝමීටර් 3.2 ක් පමණ ගමන් කර අඩි 10 පළල අතුරු පාරට දකුණට හැරී (බටහේන පාර ඉදිරිපිට පාර) මීටර් 75 ක් පමණ ගමන් කළ විට විෂයගත දේපළ එකී පාරට මුහුණලා වම් අත පැත්තේ පිහිටා ඇත. (පාරේ දකුණු වංගුවේදී) - (අංක 152, මාගම්මන, හෝමාගම)

දෙවන උපලේඛනය

ගොඩගම හංදියේ සිට පාදුක්ක පාර ඔස්සේ (මාර්ග අංක 125) මීගොඩ දක්වා කිලෝමීටර් 1.5ක් පමණ ගමන් කර දාමපේ පාරට දකුණට හැරී කිලෝමීටර් 1 ක් පමණ ගමන් කර වමට හැරී මීටර් 400_ක් ගමන් කර තවත් මීටර් 200 ක් ගමන් කළ විට විෂයගත දේපළ වම් පැත්තේ පිහිටා ඇත.

ගෙවීම් කළ යුතු ආකාරය - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%
02. ඉතිරි සියයට අනුව 90% ගෙවීම ස්ථිර කළ දින සිට දින 30 ක් ඇතුළත යූනියන් බැන්ක් ඔෆ් කලම්බෝ පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%)
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%
06. ලිපිකරු හා සෝතක වේතනය රු. 1500/-
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3500/-

වෙනත් කරුණු සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න.

නීති දෙපාර්තමේන්තුව,
යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී,
අංක 64, ගාලු පාර,
කොළඹ 03.
දුරකතන 0112347100

එල්. බී. සේනානායක
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
සහ උසාවි කොමසාරිස්
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 7/1/10, 1 වන මහළ, සුපර් මාර්කට් කමප්ලෙක්ස්, බොරැල්ල, කොළඹ 08.
දුරකතන 0112396520

දෙණියාය රජයේ ආයුර්වේද රෝහලේ නව තෙමහල් ගොඩනැගිල්ල විවෘත කිරීම 25 වැනිදා

මුලටියන කේ. වසන්ත

කොළඹ ප්‍රදේශයේ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයකු වන දේශමාන්‍ය එච්. ජී. සියසිරි මහතා සහ ඔහුගේ පුතණුවන් වන ප්‍රියන්ත, සංජීව හා විනෝමි යන අයගේ ධන පරිත්‍යාගයෙන් මාතර, දෙයියන්දර ප්‍රදේශයේ ඉදිකරන ලද රජයේ ආයුර්වේද රෝහලේ නව තෙමහල් ගොඩනැගිල්ල 25 වැනිදා ප.ව. 2.30ට අගමැතිනි ආචාර්ය හරිනි අමරසූරිය මෙනෙවිය අතින් විවෘත වේ. දේශීය ජනතාවට හා විදේශීය සංචාරකයන්ට පහසු ගෙවීමේ ක්‍රම යටතේ නේවාසික හා බාහිර ප්‍රතිකාර ලබාගත හැකි මෙම රෝහල විවෘත කරන අවස්ථාවට දකුණු පළාත් ආණ්ඩුකාර බන්දුල හරිශ්චන්ද්‍ර ඇතුළු ආරාධිතයෝ ද එක්වෙති.

සූරියමල් මාවත ළඟ වැවේ මළ සිරුරක කොටසක්

කිඹුලකුගේ ප්‍රහාරයට ලක්වූවා දැයි සැකයක්

ඥානතිස්ස ජයවර්ධන
බොරලැස්ගමුව

බොරලැස්ගමුව, දිවුල්පිටිය, සූරියමල් මාවතේ ඇවිදින මංතීරුවට යාබද වැවේ තිබී කිඹුල් ප්‍රහාරයකට ලක්ව ඇතැයි සැලකිය හැකි පුද්ගල මළසිරුරක් ඊයේ (23 වැනිදා) උදෑසන හමුවූ බව බොරලැස්ගමුව පොලිසිය පැවසීය.

මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 55ක් වන මොරටුව කටුබැද්ද පදිංචිව සිටි කුමාර් ප්‍රනාන්දු නමැත්තකු බව පොලිසිය විසින් අනාවරණය කරගෙන තිබේ. මෘතදේහය හමුවන විට දකුණු අත සහ දකුණු කකුල ඇතුළුව සිරුරේ භාගයක් පමණ නොතිබූ බව පොලිසිය සඳහන් කළේය.

මොහු පසුගිය 21 වැනිදා මාළු ඇල්ලීම සඳහා බැහැරව ගිය බව නිවැසියන් පොලිසියට පවසා ඇත. ඒ අනුව මෙම පුද්ගලයා මාළු අල්ලමින් සිටියදී කිඹුල් ප්‍රහාරයකට ලක්වන්නට ඇතැයි පොලිසිය සැක කරයි. මළ සිරුර තිබුණේ නිතර කිඹුලන් දෙදෙනකු ගැවසෙන ස්ථානය බව එහි රැස්ව සිටි පිරිස පැවසූහ. මෘතදේහය පිළිබඳව මහෙස්ත්‍රාත් පරීක්ෂණය පැවැත්වීමට නියමිතව තිබිණි.

බොරලැස්ගමුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමේධ විමලගුණරත්න මහතාගේ අධීක්ෂණයෙන්, පොලිස් සැරයන් (67941) ගුණතිලක, පොලිස් කොස්තාපල්වරුන් වන (74833) මධුෂ, (92527) මාලන් යන නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ සිදුකරති.

උතුරු හෝකන්දර රත්නාරාමයේ කඨින පින්කම

උතුරු හෝකන්දර ශ්‍රී රත්නාරාමයේ වාර්ෂික මහා කඨින පින්කම සාමච්චිසුරු විනයාචාර්ය රැලපනාවේ අරියසාර නායක හිමියන්ගේ අනුශාසනාව පරිදි ජී. ගමගේ සහ සුජීවා ගමගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ලබන 1 වැනිදා රාත්‍රියේ පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම කඨින පෙරහැර පසුදින අලුයම දක්වා වීථි සංචාරය කරනු ඇත.

අජිත් ක්‍රිෂාන්ත සේරම් හතළිස් වසක නිර්මාණ ඇගයුම 26 දා

'සංහිඳ පාතේ' ගී දැහැන සහ 'සියක් ගී', 'පුරගම්රාල' ග්‍රන්ථයන් දොරට වැඩුම 26 ඉරිදා දහවල් 2.00ට මීරිගම යොවුන් නිකේතන රඟහලේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. වෘත්තියෙන් කථිකාචාර්යවරයෙක් වන අජිත් ක්‍රිෂාන්ත සේරම් නාට්‍යවේදියකු, අධ්‍යක්ෂවරයකු, ගායකයකු ඇතුළු ක්ෂේත්‍ර විශාල සංඛ්‍යාවක කටයුතු කරමින් කරන ලද නිර්මාණ මෙහෙවර ඇගයීම මෙම උළෙලේ අරමුණයි.

අජිත් ක්‍රිෂාන්ත සේරම් විසින් රචනා කරන ලද ස්වතන්ත්‍ර ගී පද රචනා ඔහු විසින්ම ගායනා කෙරෙන 'සංහිඳ පාතේ' ගීත දැහැන පළමු ප්‍රසංගය මෙය වන අතර සහෘද ආරාධනා මත මෙම ප්‍රසංගය දිවයින පුරා සංවිධානය කිරීමට අදහස් කර ඇත. අජිත් ක්‍රිෂාන්ත සේරම් විසින් රචිත ගී පද රචනා ඇතුළත් 'සියක් ගී' ග්‍රන්ථය සහ ජාතික රූපවාහිනිය වෙනුවෙන් අජිත් ක්‍රිෂාන්ත සේරම් විසින් රචනා කළ කතන්දර රැසක් ඇතුළු 'පුරගම්රාල' ළමා කතන්දර පොත ද මෙදින දොරට වැඩීමට නියමිතය. මෙම වැඩසටහනේ සංගීතය මෙහෙය වීම චාමර ලක්මාල් සංගීතවේදියාණෙනි. ඇගයුම් උළෙල සංවිධානය කරන්නේ මීරිගම 'තිගුසර' නාට්‍ය කණ්ඩායම සහ 'මුතුහර' රූපවාහිනී ළමා සමාජය යන අජිත් ක්‍රිෂාන්ත සේරම් පුරෝගාමිත්වය ලබාදුන් සංවිධාන ද්විත්වයෙනි.

සුජාතා ජයරත්න

හම්බන්තොට අඩවි ආරක්ෂක කාර්යාලයේදී පුණ්‍යානුමෝදනාවක් සහ දානමය පිංකමක්

දෙබරවැව ඒ.ඒ. පේමසිරි

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතුවලදී මියගිය වනජීවී නිලධාරීන්ට හා මියගිය වන සතුන්ට මෙන්ම, වන සතුන්ගේ ප්‍රහාරයන්ට ලක්ව මියගිය ලක්වැසියන්ට පුණ්‍යානුමෝදනා එක් කිරීමටත් සේවයේ නියුතු වනජීවී නිලධාරී හා සමස්ත රාජ්‍ය නිලධාරීන්ට සෙත් ප්‍රාර්ථනා කිරීමේ සර්ව රාත්‍රික පිරිත් දේශනාවක් හෙට (25දා) හම්බන්තොට අඩවි ආරක්ෂක කාර්යාලයේදී පැවැත්වේ. 26 දින උදෑසන මහා සංඝරත්නය උදෙසා පිදෙන හීල් දානමය පින්කමකි. හම්බන්තොට වන සත්ව අඩවි ආරක්ෂක ඩී.බී.එම්. සඳකුවන් මහතා ප්‍රධාන හම්බන්තොට වන සත්ව අඩවි කාර්යාලයේ කාර්ය මණ්ඩලය මෙම පින්කම සංවිධානය කර තිබේ.

කුලියාපිටිය රෝහලේ ඕපීඩී සේවය හවසටත්

රෝහල් අධ්‍යක්ෂවරයාත් හවස ඕපීඩී සේවයට

අධ්‍යක්ෂවරයාට කමිටුවේදී ප්‍රශංසා

කුලියාපිටිය රෝහලේ ගැටලු නිරාකරණයට පිළියම් යොදනවා

කමිටු සභාපති මේජර් ජෙනරාල් සූරියබණ්ඩාර

කුලියාපිටිය උපේන්ද්‍ර සේරසිංහ

කොළඹ ජාතික රෝහල, යාපනය, මඩකලපුව මහ රෝහල්වල පමණක් ක්‍රියාත්මක සවස ඕපීඩී සේවය කුලියාපිටියේ ඇරඹීමත් සමඟින් සතියේ දිනවල සවස 4.00 සිට රාත්‍රී 8.00 දක්වා ඉතා විශාල රෝගීන් පිරිසක් ඉන් සේවය ලබන බවත් රෝහලට පැමිණ ඇති විශේෂඥ වෛද්‍යවරුන්ටත් වාඩිවූ නැති නිසා සතියට දිනක් පැමිණෙන්න යෝජනා කිරීමට සිදුව ඇති බවත් කුලියාපිටිය ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂ කේ. ඒ. ආර්. ජී. ජයලත් මහතා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී පැවසීය.

ඉකුත් සිකුරාදා කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කුලියාපිටිය ජාතික ජනබලවේගයේ ආසන සංවිධායක මේජර් ජෙනරාල් සූරියබණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති සම්බන්ධීකරණ කමිටුවේදී රෝහල් අධ්‍යක්ෂවරයා මෙසේද පැවසීය.

අපේ වෛද්‍ය, හෙද හා කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සහයෝගය මත මේ වන විට බාහිර රෝගී අංශයේ ප්‍රතිකාර සිදුකරනවා. සවස 4.00 පටන් ලියාපදිංචිය 7.00 වෙනකල් සිදුකරමින් 8.00 වෙනතෙක් ප්‍රතිකාර සේවය සිදුකරනවා. ඒ සඳහා බොහෝ සහපත් ප්‍රතිචාර ලැබෙනවා. එන්න එන්න රෝගීන් ප්‍රමාණයත් වැඩි වෙමිනුයි තියෙන්නේ. අධ්‍යක්ෂවරයා ලෙස මමත් කාර්යාල වේලාවෙන් පසුව රෝගී ප්‍රතිකාරයට යනවා. ඒ හරහා අහිංසක ජනතාවට ලොකු සේවයක් සිදුවෙනවා.

මේ මෑතක අපේ විකලාංග විශේෂඥ ශල්‍ය වෛද්‍ය චානක සෙල්ලංගආරච්චි මහතා කොඳු ඇට පෙළේ සැත්කමක් සාර්ථකව කරලා වාර්තාවක් තිබ්බා. මේ වනවිට එවන් රෝගී පිරිස් විට පළාත්වල සිට පවා ආවත් ඒ සඳහා අවශ්‍ය වන අවම පහසුකම් හෝ අපි සතුව නැහැ. ඒ සැත්කමට අවශ්‍ය ශල්‍ය ඇඳක් අනිවාර්යයෙන් දුන් අවශ්‍යම වෙනවා. මොකද ඒ තරම් පිරිසක් කුලියාපිටිය ශික්ෂණ රෝහලට එනවා. ඒ වගේම තමයි අපේ රුධිර කාන්දුකරණ ඒකකය සිදුවන්නේ කොරිඩෝවක. තවදුරටත් ඊට ඇඳන් එකතු කරන්න බැහැ. රෝගීන් වැඩි නිසා අපි දුන් පුටුවලත් රුධිර කාන්දුකරණය කරනවා. ඒක එච්චර සුභදායී දෙයක් නෙවෙයි. ලෝකයේ ඉහළම පුහුණුකම් සහිත හෘද රෝග විශේෂඥයන් දෙදෙනෙක් රෝහලට ඇවිත් ඉන්නවා. ඒ අයට ප්‍රතිකාර කරන්න ඒ සඳහා ඒකකයක් නැතිව ඒකත් කොරිඩෝවක් පාවිච්චි කරලා තාවකාලිකව සිදුකරගෙන යන්නේ. එකෝ කාඩියලොජි යන්ත්‍රයක් නැහැ. ඒ නිසා අපිට එන රෝගීන් වෙනත් රෝහල් වලට යවන්න වෙනවා. ඒකෙ ලොකු අවදානමක් තියනවා. ඒ යන්ත්‍රයක් වෙන්නෙනත් රුපියල් මිලියන 30ක් වගේ. රාජ්‍ය අනුග්‍රහයෙන් හෝ එවන් යන්ත්‍රයක් අවශ්‍ය බවත් දනුම් දෙනවා. ස්වසන රෝග විශේෂඥ වෛද්‍යවරියක් ඇවිත් තිබුණට ඒ සඳහා කිසිදු පහසුකමක් අපි සතුව නැහැ. එතුමිය ඇවිත් නිකං ඉඳලා යන නිසා මම කිව්වා සතියකට වරක් ආවොත් ඇති කියලා. රක්තවාහිනීවේදී එක්කෙනෙක් වාඩිවූ සංකීර්ණ ගැටලු නිසා ඒ අයට දෙන්න තැන් නැහැ.

එමෙන්ම කුරුණෑගල පාරේ විච්පුණ්ම් තියන අබිලං පැරණි ගොඩනැගිලි වෙනුවට රුධිර කාන්දුකරණ ඒකකයකට හා මානසික සායනයට ගොඩනැගිලි සංකීර්ණයක් වෙන්කරවා දෙන්නෙන්නම් ඉතා අගෙයි. කච්චු ගොඩනැගිල්ල අවදානමක් තියනවා මානසික රෝගී අය දෙදෙනෙක් තට්ටු 5 කින් පැනලා ජීවිතක්ෂයට පත්ව තිබුණා. ඒ අයට ඇඳේ බැන්දහම ෆේස්බුක් වීරයො ලියනවා මෙන්න රෝහලේ සැලකිල්ල කියලා. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමුකරන්නැයි ඉල්ලා සිටියේය.

එහිදී කමිටු සභාපති මේජර් ජෙනරාල් සූරියබණ්ඩාර මහතා පැවසුවේ මෙම යෝජනා සියල්ල තමන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට දැනුම් දී ඇති බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයත් සමග බොහෝ සාකච්ඡා කළ බවත් පැවසීය. ඇතැම් යන්ත්‍රෝපකරණ ලබාදීමේ යම් යම් එකඟතා එහිදී මතුවූ බවත් මානසික සායනය සඳහා ගොඩනැගිල්ල ඉතා කඩිනමින් ඉදිකිරීමට අවශ්‍ය අනුමැතිය ලබාගෙන කඩිනමින් වැඩ ආරම්භ කළ හැකි බවත් පැවසීය. එමෙන්ම අධ්‍යක්ෂවරයාගේ පැමිණීමෙන් අනතුරුව සන්ධ්‍යා වරුවේ ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් කමිටුවේ ස්තුතිය හා ප්‍රශංසාව හිමිවිය.

කුලියාපිටිය ප්‍රා. සම්බන්ධීකරණ කමිටුව

මාබෝපිටිය විදුහලේ දරුවෝ ළමා කෘති 10 ක් එළි දක්වති

වසන්ත සමරවර්ධන බලන්කොහුපිටිය

කියවීමේ මාසය වෙනුවෙන් මාබෝපිටිය මහා විදුහලේ දූ දරුවන් විසින් රචනා කරනු ලැබූ ළමා කෘති 10 ක් එළිදැක්වීම එම පාසලේ දී සිදුකෙරිණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයන් වශයෙන් ළමා කථා පරිවර්තක සුදත් රෝහණ සහ ලේඛක කුසුම්සිරි විජේවර්ධන යන මහත්වරු සහභාගි වූහ. මෙම අවස්ථාවට පාසලේ විදුහල්පති බන්දුල ධර්මතිලක මහතා ඇතුළු ආචාර්යවරු ද සහභාගි වී සිටියහ.

මන්දකට හිර වූ සුනඛයකු බේරීමට ගිය අය සුනඛයා සපා කෑමෙන් මරුට

බලන්ගොඩ එන්. එච්. පියසේන

මගේ සැමියා මීට දින ගණනාවකට පෙර කුඹුරේ වැඩට ගොසින් ආපසු එනවිට මන්දකට ගෙල හිර වී සිටි සුනඛයෙක් ඉන් මුදාහැරීමට ගිය අතරේ දී එම සුනඛයා සපා කෑ බව ගෙදරදී කිව්වා. නමුත් බෙහෙත් විද්දේ නැහැ. තුවාලය සෝදා මුරුංගා පොතු තලා තුවාලයට බැන්දා. නමුත් ඉකුත්දා හුස්ම ගැනීමේ අපහසුතාවයක් මතු වූ නිසා රෝහල්ගත කළා. ඉන් පසු ඔහු මියගියා යැයි ජලභීතිකා රෝගයෙන් මියගිය ආර්.ඒ. අනුර නන්දකුමාර (46) නැමැති දෙදරු පියාගේ මරණය පිළිබඳ පරීක්ෂණයේ දී සාක්ෂි දුන් මියගිය අයගේ බිරිඳ වූ ආර්. එම්. නයනා ප්‍රභා කුමාරි නැමැති අය ඉහත ප්‍රකාශය කළාය.

මෙම මරණය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය බලන්ගොඩ මූලික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී ජී. ඊ. රණසිංහ මහතා විසින් සිදු කළ අතර සාක්ෂි මෙහෙයවීම පින්නවල පොලිසියේ පො.සැ. (60507) ජේ. මිල්ලගොඩ මහතා සිදු කළේය.

බල්ලකු සපා කෑ විටකදී සබන් ගා තුවාලය සේදීමෙන් පසුව අදාළ එන්නත් ලබාගත යුතු බව දන්වා තිබුණත් එම කරුණු ගැන අවධානය යොමු නොකිරීම නිසා මෙම කනගාටුදායක මරණය සිදු වූ බව බලන්ගොඩ හදිසි මරණ පරීක්ෂක පත්මේන්ද්‍ර විජයතිලක මහතා තීන්දුව ලබාදෙමින් ප්‍රකාශ කළේය. මෙම පවුලේ අනෙකුත් සාමාජිකයන්ටද ජලභීතිකා රෝග ප්‍රතිශක්ති එන්නත ලබාදීමට ද කටයුතු කර ඇත.

බළපිටිය ගල්මන්ගොඩ තුඩුව ගංගාරාමයේ කඨින පින්කම හෙට සහ අනිද්දා

බළපිටිය අනුර යසමින්

බළපිටිය මහා ගල්මන්ගොඩ තුඩුව ගංගාරාම විහාරස්ථානයේ වාර්ෂික කඨින පින්කම 25 සහ 26 යන දිනවලදී විහාරාධිපති දෙමටගොඩ සුමේධ හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

25 වැනිදා සවස පහන් පින්කමක් සහ 26 වැනිදා අලුයම වැල්ලගේ කරුණාදාස සහ ඇම්. රත්නසිලි මහත්මියගේ නිවෙසේ සිට කඨින චීවරය රැගත් පෙරහැර පිටත්වේ. මෙදින දහවල අෂ්ඨ ශතාධික සංඝගත දක්ෂිණාවක් ද පැවැත්වේ.

තිරප්පනේ සුදර්ශනාරාමයේ කඨිනය අද හෙට සහ අනිද්දා

තිරප්පනේ සමන් පෙරේරා

තිරප්පනේ ශ්‍රී සුදර්ශනාරාම පුරාණ රජමහා විහාරස්ථානයේ වාර්ෂික කඨින මහා පූජෝත්සවය අද (24), හෙට (25) හා අනිද්දා (26) යන තෙදින පැවැත්වීමට විහාරස්ථ දායක සභාව හා විහාර සංවර්ධන සමිතිය කටයුතු සංවිධානය කර ඇත.

විහාරාධිපති පූජ්‍ය කණ්ඩලමේ නන්දාරාම ස්වාමීන් වහන්සේගේ පූර්ණ අනුශාසනා මත මෙම කඨින පිංකම සංවිධානය කරයි. මෙවර කඨින චීවර පූජෝත්සවය සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබන්නේ තිරප්පනේ අලුත් පාර කලාපයේ දායක පින්වතුන් විසිනි.

පහළ ඇල්ලේවැව ප්‍රාථමිකයට ශිෂ්‍යත්ව ජයග්‍රහණ තුනක්

දිඹුලාගල ප්‍රසන්න සිල්වා

දිඹුලාගල අධ්‍යාපන කලාපයට අයත් පහළ ඇල්ලේවැව ප්‍රාථමික විදුහලේ මෙවර ශිෂ්‍යත්ව හපනුන් තිදෙනකු සිටින බව විදුහල්පති හපුරන්නෙත ගෝතමාලංකාර හිමියෝ පවසති. ජී. සෙනුකි දහමිසා කිරුවිය පාසලේ මෙවර වැඩිම ලකුණු ප්‍රමාණය වූ 159 ට හිමිකම් කියයි. එම්.ඒ. තේජාන් මධුසංඛ ලකුණු 145 කි. එච්.ඒ. යදිදි දිනෙත්මා ලකුණු 137 කි. එස්.ඩී. ප්‍රියදර්ශනී කුලසිංහ ගුරුතුමිය ශිෂ්‍යත්වය සඳහා මෙම දරුවන්ට මඟපෙන්වීම සිදු කළාය.

පහළ ඇල්ලේවැව ප්‍රාථමික විදුහල දිඹුලාගල අධ්‍යාපන කලාපයේ දුෂ්කර පාසලක් වුවත් විදුහල්පති ස්වාමීන් වහන්සේ ඇතුළු ඇදුරුමඬුල්ල සහ දෙමව්පියන්ගේ කැපවීම මත ඉතා ප්‍රියමනාප කීර්තිමත් පාසලක් බවට පත් වී ඇත.

අලව්ව සල්පිලේදී පලතුරු වට්ටිය දාසය ලක්ෂ පන්දහසකට වෙන්දේසි වෙලා

මහරච්චිමුල්ල සිසිර සරත් අබේකෝන්

අලව්ව ශක්ති ත්‍රිරෝද රථ සංගමය අලව්ව නගරයේ දී සංවිධානය කළ සල්පිල් වෙන්දේසියේ පලතුරු වට්ටිය පමණක් වෙන්දේසි කිරීමෙන් දහසය ලක්ෂ පන්දහසක මුදලකට වෙන්දේසි වූ බව ශක්ති ත්‍රිරෝද රථ සංගමයේ ලේකම් එච්. ඒ. අනුර හෙට්ටිආරච්චි මහතා පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් පවසා සිටියේ ත්‍රිරෝද රථ සංගමයෙහි සාමාජිකත්වය 123 දෙනකු ලබා සිටින බවත්, සියලු සාමාජිකයන්ගේ උනන්දුව හා උත්සාහය මත ශක්තිමත් ත්‍රිරෝද රථ සංගමයක් බවට පත්ව ඇති බවයි. මෙවැනි ආධාර උපකාරවලින් සමාජ සත්කාර වැඩසටහන් රැසක් ඉටුකර ඇති අතර සල්පිල් වෙන්දේසියෙන් උපයාගත් මුදලින් ප්‍රදේශයේ දුෂ්කර පාසල් දරුවන්ගේ අවශ්‍යතා අනුව පාසල් උපකරණ ඇතුළු වෙනත් පහසුකම් ලබාදීමට කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව තවදුරටත් පැවසුවේය.

ප්‍රවීණ දහම් විරුදු ශිල්පී අලව්ව චමින්ද කුමාර මහතා විසින් මෙම සල්පිල් වෙන්දේසිය මෙහෙයවූ අතර සත්සරණි නාට්‍ය කලා සංගමය නර්තන අංග රැසක් මෙහිදී ඉදිරිපත් කෙරිණ.

ආදර්ශමත් ක්‍රියාවක් වාද්දුව පොලිස් ස්ථානාධිපතිවරයාට ප්‍රදේශවාසීන්ගෙන් ප්‍රශංසා

වාද්දුව දුමින් පොහුපිටිය

මේ දිනවල පවතින අධික වැසි හේතුවෙන් වාද්දුව නගරය මධ්‍යයේ බසයක් අපේක්ෂාවෙන් තෙමී තෙමී සිටින මගීන්ට සහනයක් ලෙසින් වාද්දුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ලින්ටන් පියුමරත්න මහතාගේ මූලිකත්වයෙන් තාවකාලික බස් නැවතුම්පළක් ඉදිකර තිබේ.

ඒ අනුව කොළඹ දෙසට ගමන් කිරීමට වාද්දුව පොලිස් ස්ථානය ඉදිරිපිට රැඳී සිටින මගීන්ට වැස්සෙන් ආරක්ෂාවීමට හැකිව ඇත.

වාද්දුව පොලිස් ස්ථානාධිපතිවරයාගේ මූලිකත්වයෙන් සිදුකළ මෙම ප්‍රජා සත්කාරය ප්‍රදේශවාසීන්ගේ පැසසුමට ලක්ව තිබේ.

ප්‍රවීණ කලාකරු බන්දුල විජේවීර ජන්ම දිනයට උපහාර

බෝයවලාන ජයන්ත කුමාර දිසානායක

ප්‍රවීණ ගීපද රචක හා ගායනවේදී බන්දුල විජේවීර මහතාගේ ජන්ම දිනයට උපහාර පුදා ඔහුව ඇගයීමේ අරමුණින් අලව්ව ශ්‍රී රාහුල ජාතික පාසලේ ආදි ශිෂ්‍ය සංගමය හා කලාකරුවන් පිරිසක් එක්ව ඔහු දිවි ගෙවන වැත්තෑව ප්‍රදේශයේ නිවසට ගොස් උපහාර දැක්වීම සිදු කෙරිණි.

සංගීත ක්ෂේත්‍රය වෙනුවෙන් බන්දුල විජේවීර මහතා කළ මෙහෙය අගයමින් උපහාර පුද කර ජන්ම දිනයට දිඝාසිරි පතා ඔහුගේ ගීත එකතුවක් ගයා එහිදී සුබපැතුම් එක් කිරීම සිදු විය.

එම අවස්ථාවට ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජික සාමාජිකාවන් ප්‍රවීණ කලාකරු සමන් ගුණවර්ධන මහතා ඇතුළු පිරිසක් ද සහභාගි වූහ.

සෝමාවතිය චෛත්‍ය ආසන්නයේ සැරිසරමින් සිටි වෙඩි වැදුණු වන අලියාට ප්‍රතිකාර

ඇලහැර නිශ්ශංක
වෙලගෙදර



සෝමාවතිය චෛත්‍යය ආසන්නයේ සැරිසරමින් සිටි වෙඩි වැදී තුවාල ලැබූ වන අලියකුට සෝමාවතිය චෛත්‍ය අඩවි ආරක්ෂක වනජීවී කාර්යාලයේ නිලධාරීන් විසින් ප්‍රතිකාර ලබාදීමට කටයුතු කරන ලදී.

අවුරුදු 35 ක් පමණ වයසැති අඩි 9 පමණ උසැති වන අලියාගේ වම් අතට දකුණු පාදයට වෙඩි වැදී තුවාල ලබා ඇති බවද සෝමාවතිය චෛත්‍ය අඩවි ආරක්ෂක වනජීවී කාර්යාලයේ නිලධාරියකු සඳහන් කළේය.

අලියාට ප්‍රතිකාර ලබා දීමට ගිරිතලේ පශු වෛද්‍ය සමීර කලිතුආරච්චි මහතා ප්‍රධාන සෝමාවතිය චෛත්‍ය අඩවි ආරක්ෂක කාර්යාලයේ නිලධාරීන් කටයුතු කරන ලදී.

ප්‍රතිකාර ලබමින් සිටින වන අලියා පිළිබඳ විමර්ශනය කරමින් අඛණ්ඩව ප්‍රතිකාර ලබා දීමට කටයුතු කරන බවද සෝමාවතිය චෛත්‍ය වනජීවී අඩවි ආරක්ෂක කාර්යාලයේ නිලධාරියකු පැවසීය.

මත් උවදුර සදහටම රටින් තුරන් කිරීමේ ජාතික මෙහෙයුම ලබන 30 දා අරඹනවා

- මහජන ආරක්ෂක ඇමැති ආනන්ද විජේපාල

වැලිගම සභාපති ඉල්ලපු ආරක්ෂාව රජය නුදුන්නේ ඇයි

- විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස

අකිත පෙරේරා සහ රනිල් ධර්මසේන

රටේ අනාගත පරපුර මත්ද්‍රව්‍ය උවදුරෙන් ඉවත් කිරීම සඳහා සියලු පියවර ගන්නා බවත්, ඒ සඳහා ඇති සියලු ආයතන ඒකාබද්ධ ව්‍යුහයක් සකසා මත්ද්‍රව්‍ය ව්‍යසනයෙන් රට බේරා ගැනීමේ දැවැන්ත වැඩපිළිවෙළකට ආණ්ඩුව යොමුව තිබෙන බව මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු ඇමැති ආනන්ද විජේපාල මහතා පාර්ලිමේන්තුවේ දී ඊයේ (23 දා) ප්‍රකාශ කළේය. ආණ්ඩු පක්ෂය විසින් ගෙන එනු ලැබූ කල්තැබීමේ විවාදයට එක්වෙමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

වේත්‍රධාරී කුෂාන් සම්පත් ජයරත්න මහතා විසින් සෙංකෝලය තැන්පත් කිරීමෙන් පසුව ඊයේ පෙරවරු 9.30ට කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතාගේ මූලාසනයෙන් යුතුව රැස්විණ. ප්‍රථමයෙන් නිවේදන, වාර්තා, ලිපිලේඛන, පෙත්සම් ආදිය ඉදිරිපත් කිරීමෙන් පසුව මන්ත්‍රීවරු විසින් වාචික පිළිතුරු අපේක්ෂා කරනු ලබන ප්‍රශ්න සඳහා අදාළ ඇමැතිවරු පිළිතුරු සැපයූහ. පසුව 27 (2) යටතේ ප්‍රශ්න විමසීම හා ඒවාට පිළිතුරු සැපයීම ඉන් අනතුරුව සිදුවිය. පසුව සංවිධානාත්මක අපරාධ කල්ලි සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මර්දනය කිරීමට අදාළව නීති සහ ක්‍රමෝපාය සැකසීමට ආණ්ඩුව ඉදිරිපත් කර ඇති 'රටම එකට වැඩපිළිවෙළ' සම්බන්ධයෙන් කල්තැබීමේ විවාදය ආරම්භ කෙරිණ.

විවාදය ආරම්භ කරමින් ආණ්ඩු පක්ෂ මන්ත්‍රී ධර්මප්‍රිය විජේසිංහ මහතා (ජා.ජ.බ.) -

අද බරපතළ ලෙස විශාල මුදලක් කුඩු ජාවාරම ඇතුළේ සංසරණය වෙනවා. ඒකයි දැන් මේ අය මරාගනිමින් සිටින්නේ. මේවා සියල්ල මර්දනය වෙනුවෙන් ලබන 30දා ජනාධිපතිතුමා විසින් සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී රටම එකට විෂ මත්ද්‍රව්‍ය විරෝධී වැඩපිළිවෙළට මේ සභාවේ සහය අවශ්‍යයි. (නියෝජ්‍ය කථානායක රිද්මි පාලි මහතා මූලාසනයට පැමිණිණි)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු ඇමැති ආනන්ද විජේපාල මහතා මත්ද්‍රව්‍ය ව්‍යසනය රටපුරා විශාල ව්‍යසනයක් බවට පත්ව තිබෙනවා. මත්ද්‍රව්‍ය භාවිතා කරන රාජ්‍ය නිලධාරීන්, පාසල් සිසුන් ඉන්නවා. මේක අපි නතර කළයුතු වෙනවා. අපි හිතුවේ මත්ද්‍රව්‍ය විදේශ රටවලින් එනවා කියලයි. නමුත් මේ රටෙත් නිෂ්පාදනය වෙනවා.

අපි මේ වෙනුවෙන් ජාතික සභාවක් නිර්මාණය කළා. ඒ සඳහා සියලු ආගම්වල නායකයින් මේ තුළ ඉන්නවා. මේ සියලු ආයතන ඒකාබද්ධ ව්‍යුහයක් සකස් කොට මත්ද්‍රව්‍ය ව්‍යසනයෙන් මේ රට බේරා ගැනීමේ දැවැන්ත වැඩපිළිවෙළකට අපි යොමුව තිබෙනවා. ලබන 30 දා මෙහි ජාතික උත්සවය ආරම්භ වෙනවා. ඒ අනුව සදහටම මත්ද්‍රව්‍ය මේ රටින් තුරන් කරන්න අවශ්‍ය පියවර ගෙනවා.

මේ රට අපරාධකරුවන්ගේ දේශයක් බවට පත්ව තිබුණා. ජනතාව ඒක දන්නවා. පසුගිය කාලය පුරාම පැවැති රජයන් මේවා පෝෂණය කළා. ගෝනවල සුනිල්ට විවිධ තනතුරු ලබා දුන්නා. සාම විනිසුරුකම් ලබා දුන්නා. මේ සඳහා මත්ද්‍රව්‍ය සම්බන්ධ වුණා. බැද්දගානේ සංජීව, පොත්ත උපාලි ගැන අපි දන්නවා. කිසිදු ජීවිතයක් අපි අවතක්සේරු කරන්නේ නැහැ. ඊයේ වැලිගම සිදුවීම සිදුවූ පසුව පොලිස් කණ්ඩායම් 4 ක් පරීක්ෂණ ආරම්භ කළා.

අපි මේ රටේ ජනතාවට පොරොන්දු වී තිබෙනවා නීතිගරුක සමාජයක් හදන්න. ආයුධ 1947 ක් මේ වනවිට අපි අත්අඩංගුවට ගෙන තිබෙනවා. මේක අපරාධකරුවන්ගේ දේශයක් බවට පත්ව තිබුණා. මේ රටේ ජනතාව දන්නවා පාතාලයට අපරාධකරුවන්ට සම්බන්ධ වුණේ කවුද කියලා.

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා

අද රටත් සමාජයත් ඝාතන සංස්කෘතියකට යොමු වෙමින් තිබෙන අවස්ථාවක මේ ඝාතන රැල්ල රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියන කාරණය පිළිගන්නෙ නැද්ද? මහජන නියෝජිතයෙකුට තමන් පත්කළ ජනතාවට සේවය කරන්න නොහැකි වාතාවරණයක් අද නිර්මාණය වෙලා. ලසන්ත වික්‍රමසේකර කියන්නේ සියයට 66.3ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන තිබෙන කෙනෙක්. විවිධ අභියෝග මැද විපක්ෂයේ සියලු දෙනා එකට මැතිවරණයේ දී නායකත්වය දී තිබෙනවා. ජනතාවට සේවය කරන්න යන අවස්ථාවේ වෙඩි තබා මරා දමනවා.

වැලිගම සභාපතිවරයා මේ වසරේ අගෝස්තු මාසයේ දී පොලිස්පතිවරයාට ලිපියක් යොමු කරමින් ජීවිත තර්ජන තිබෙන බවට සඳහන් කර තිබෙනවා. අධිකරණයට පැමිණෙන අවස්ථාවක දී හෝ සභාවට යන අවස්ථාවක ඝාතනය කරන්න සැලසුමක් තිබෙන බවට පොලිස්පතිවරයාට ලියා තිබෙනවා. සුදුසු ආරක්ෂාවක් ලබා දෙන්න කියා ඉල්ලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තිබිය දී ඔහුට නිසි ආරක්ෂාව ලබාදෙන්න රජය අපොහොසත් වුණේ ඇයි?

බදුල්ල දිස්ත්‍රික් මන්ත්‍රී චාමර සම්පත් දසනායක (න.ප්‍ර.ජා.ස.) -

වැලිගම සභාපතිවරයාට පාතාලයට එක් කරලයි පොලිස් ඇමැති කතා කළේ. එහෙම නම් අනිත් අය ගැනත් අපිට කියන්න පුළුවන්. අපි ඔක්කොම එකතු වෙලයි මහින්ද රාජපක්ෂ බලයට ගෙනාවේ. ජුලම්පිටියේ අමරේ ගැන ඉතින් අපි හැමෝම දන්නවා. හරියට පොලිසිය ගැන බලලා රාජකාරි කරන්න. අපිට බය කරන්න බැහැ. පුළුවන්නම් අපිට මරන්න. හොල්මනක් වෙලා හරි ඇවිත් පළි ගන්නවා. අපේ ආරක්ෂාව අයින් කළා. දිනලා සභාපති වූ කෙනාට පාතාලයට දැම්මා. පුළුවන් නම් වෙඩික්කරු අල්ලන්න.

ඇමැති ආනන්ද විජේපාල -

අපි කවදත් සිංහයෝ වගේ වැඩ කළා. එතුමන්ලගෙ ආණ්ඩු කිහිපයක් 89 වටම තිබුණා. අපි කිසි දවසක ත්‍රස්තවාදී වැඩ කරලා නැ. පොලිසිය හොඳ විධියට කටයුතු කළා. අපිට කවුරුවත් මරන්න අවශ්‍ය නැ. මේ ආණ්ඩුව මිනීස්සු මරණ ආණ්ඩුවක් නොවෙයි ජීවිත ආරක්ෂා කරන ආණ්ඩුවක්.

අධිකරණ ඇමැති හර්ෂණ නානායක්කාර -

පාතාලය නතර කරනවා කිව්වම ශිෂ්ට සම්පන්න පුද්ගලයො කලබල විය යුතු නැ. කලබල වෙනවා නම් ඔවුන් ගැන වෙනම කියවීමක් හදාගමු. සමහරු කියනවා අපිට මරන්න යනවලු. ඔබතුමා හොල්මනක් වෙලා එන්න එපා. සැබෑ ජීවිතයෙදීත් බය හිතෙන මුහුණක් තියෙන්නෙ.

අපි කවුරුත් මත්ද්‍රව්‍ය නවත්වන්න ඕන කියල පිළිගෙන තියෙනවා. නමුත් ක්‍රියාත්මක වීම ගැන බැලිය යුතුයි. මේ රටේ 77න් පස්සේ ආපු හැම ආණ්ඩුවකම මේක දිහා බලන්නේ නැතිව අහක බලාගෙන හිටියා. පසුකාලීනව තමන්ගේ යෝල්ලයන් හරහා පාතාලය මත්ද්‍රව්‍ය හා සම්බන්ධ වෙමින් ප්‍රතිලාභ ලැබුවා. ගෝනවල සුනිල්, පොත්ත උපාලි සම්බන්ධ මොන ආණ්ඩුවටද? මත්ද්‍රව්‍ය හා පාතාලය එකට ගැටගැහිලා තියෙන්නේ. අද රජය පාතාලය සම්බන්ධත් නැ. උදව් කරන්නෙත් නැ. ඒ නිසයි පාතාලය සම්පූර්ණයෙන්ම නැති කරන්න ක්‍රියා කරන්නේ. අපි අල්ලන පාතාලකාරයන් මැරෙන්නෙ නැ. මධූෂ් මැරෙනකොට චාමර හිටියේ මොන ආණ්ඩුවේද? කැබිනට් එකේ ඉඳල කප්පම් ගත්ත අය මේ පාර්ලිමේන්තුවේ හිටියෙ නැද්ද? හිටියා. අපි ඒක වෙනස් කරනවා.

පත්කළ මන්ත්‍රී නාමල් රාජපක්ෂ (ශ්‍රීලපොපෙ) - මත්ද්‍රව්‍ය පිටුදැකීමට නම් මුලින්ම අපේ ගොඩබිමත්, මුහුදෙත් බුද්ධි අංශ ශක්තිමත් කරන්න. ඒ වගේම ජාත්‍යන්තර බුද්ධි අංශ වාර්තා ලැබෙන ඒවා ක්‍රියාත්මක කරන්න. ඒ වගේ පණිවුඩ ලැබිලත් කන්ටේනර් දෙක නිදහස් කළා. කවුද මේවා නිදහස් කළේ? හෙළි කරන්න. අවුරුද්දක් වෙන්න එනවා තාම හොයාගෙන නැ.

ආරක්ෂක නියෝජ්‍ය ඇමැති අරුණ ජයසේකර -

බන්ධනාගාර රැඳවියන්ගෙන් සියයට 70ක් පමණ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා. සියයට 15ක් 20ක් පමණ පොලිසියෙත් ඉන්නවා. මත්ද්‍රව්‍යවලට සම්බන්ධ වෙලා. වාර්තා වන ආකාරයට පොලිස් නිලධාරීන් 68 දෙනෙක්ගේ සේවය අත්හිටුවා තිබෙනවා. අනීතික මුදල් ගනුදෙනුවලට කල්ලි සම්බන්ධවී තියෙනවා. මේක නැවැත්විය යුතුයි. මීට සියලු දෙනා සම්බන්ධවිය යුතුයි.

ආරක්ෂක අංශ වෙත විශාල කාර්යයක් පැවරී තියෙනවා. පාසල්, ආගමික පාර්ශ්වයන්ද මීට දායක කරගත යුතුයි. තොරතුරු හුවමාරු කර ගැනීමට බුද්ධි අංශවලට විශාල කාර්යභාරයක් තියෙනවා. මොන නීතිය ක්‍රියාත්මක වුවත් මහජන සහාය මීට අත්‍යවශ්‍යයි.

යුද්ධය අවසන් වූ පසුව පැමිණි ආණ්ඩුවලට මේ මත් ජාවාරම නවත්වන්න හොඳටම ඉඩ තිබුණා. ඔවුන් කළේ නැ. ඒ නිසයි අපට ජනතාව ඒ වගකීම භාර දුන්නේ.

මාතර දිස්ත්‍රික් මන්ත්‍රී චතුර ගලප්පත්ති (ස.ජ.බ.)

ලංකා ඉතිහාසයේ පළමුවරට තමයි මහජන ඡන්දයෙන් පත්වූ සභාපතිවරයාගේ නිල කාමරය තුළදී ඝාතනය කළේ. ඊයේ දිනය වන විට වෙඩි තැබීම් ශතකය ඉවරයි.

මහජනයා ආරක්ෂාව හා මේ ආණ්ඩුව ගැන කියන කතා බැලිය යුතුයි. සභාපතිවරයාට නඩු හයක් තියෙන එක ඇත්ත. ඒත් අපරාධකරුවෙක් වෙලා නැ. උසාවියේ තීන්දුවක් නැ. නඩු කාටත් තියෙනවා.

නියෝජ්‍ය ඇමැති මහින්ද ජයසිංහ-

මුළු රටක් එකට ගෙන මේ උවදුරට එරෙහිව සටන් කිරීමට අපි කටයුතු කරනවා. කවුරු මොන දේ කිව්වත් අපි ඉදිරියට තබපු පියවර ආපස්සට යන්නෙ නැ. මේක යුගයේ වගකීම ඉටු කරන්න කිසියෙක් පසුබට වන්නෙ නැ. මුළු මහත් සමාජයේම දරු පැටව් මේ උවදුරට ගොදුරු වෙමින් තිබෙනවා. මේ රට මත්ද්‍රව්‍යයෙන් නිදහස් රටක් බවට පත් කිරීම අපේ වගකීමක්. විපක්ෂය කොහොමද රෙදි ඇඳගෙන අපරාධකරුවන් වෙනුවෙන් පෙනී සිටින්නේ. අයි.ආර්.සී. ලේඛනයේ ලියාපදිංචි අපරාධකරුවෙක් මියගිය පුද්ගලයා. අපි කිසිවකු ඝාතනය කිරීමට එකඟ නැ. අපි එය වැළැක්වීමට උපරිම පියවර ගනිමින් ඉන්නවා.

(පාර්ලිමේන්තුව යළි අද (24දා) පෙරවරු 9.30ට රැස්වේ.)

මත්ද්‍රව්‍ය පිටුදැකීමට බුද්ධි අංශ ශක්තිමත් කළ යුතුයි

- නාමල් රාජපක්ෂ

වැලිගම සභාපතිව පොලිස් ඇමැති පාතාලයට දැම්මා

- චාමර සම්පත් දසනායක

'තවත් ටිකක් පරිස්සමින්'

මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතියට ජාතික ලොතරැයි මණ්ඩලයේ අනුග්‍රාහකත්වය

මේ දිනවල නිතර අසන්නට ලැබෙන රිය අනතුරු වළකාලීමට රජය දියත් කරන 'තවත් ටිකක් පරිස්සමින්' මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතියට අනුග්‍රාහකත්වය ලබාදීමට ජාතික ලොතරැයි මණ්ඩලය පියවර ගෙන තිබේ. ඊට අදාළ අවබෝධතා ගිවිසුමට ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපති එම්. ඩී. සී. ජේ. පෙරේරා මහතා හා ඇල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වෙනුවර මලින්ද දිසානායක මහතා අතර සිදුවිය. ප්‍රවාහන හා මහාමාර්ග නියෝජ්‍ය ඇමැති වෛද්‍ය ප්‍රසන්න ගුණසේන, ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමැති නිශාන්ත ජයවීර, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා, ලොතරැයි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී ඒ. එම්. අරීෆ්, අතිරේක සාමාන්‍යාධිකාරී නීතිඥ සංජීව එදිරිසිංහ, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපති මංජුල කුලරත්න සහ ජාතික ලොතරැයි මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ද එක්වූහ.

දශක 6කට වැඩි කාලයක් සුවහසක් වූ පාරිභෝගිකයන්ගේ විශ්වාසය රැකගනිමින් දෛනිකව විශාල ජයග්‍රාහකයන් පිරිසක් බිහිකරමින්, ඒ වගේම ලංකා ඉතිහාසයේ ලොතරැයියකින් දුන් වැඩිම මුදල වූ රු. කෝටි 47ක් ඉක්මවූ ජයග්‍රාහී මුදලක් ලබාදුන් එකම ආයතනය ජාතික ලොතරැයි මණ්ඩලය බව සඳහන් කළ හැකිය.

රු. 40කින් මිලදී ගනු ලබන ලොතරැයි පතකින් මුදල් ජයග්‍රාහකයන් බිහිකරමින් ජාතික ලොතරැයි මණ්ඩලය ජාතික වකුගඩු අරමුදල, ගොවිජන අරමුදල, ක්‍රීඩා සංවර්ධන අරමුදල, ශ්‍රම වාසනා අරමුදල් වැනි විවිධ අරමුදල්වලට දායකත්වය දෙන අතර රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා දායකත්වය ලබාදෙන්නේ රටේ සාමාන්‍ය ජන ජීවිතය ඉහළට ඔසවා තැබීමේ අරමුණ පෙරදැරිවය.

අඹතලේ පොම්පාගාරය අසළ ඇළ ඉවුරේ විශාල කිඹුලෙක්

විමසිලිමත්ව සිටින්නැයි ප්‍රදේශවාසීන්ට අවවාද

කඩුවෙල සුගත් ප්‍රේමතිලක

මාලබේ චන්ද්‍රිකා කුමාරතුංග මාවතේ, අඹතලේ ජල පොම්පාගාරය අසළ ඇළ ඉවුරේ විශාල කිඹුලෙකු සිටිනු දුටු ප්‍රදේශවාසීහු ඒ පිළිබඳව ඊයේ (23 දා) වනජීවී නිලධාරීහු දැනුවත් කළහ.

මෙම ප්‍රදේශයේ ගවයන් බලාගන්නා අය, තණකොළ කපන අය මෙන්ම ක්‍රීඩා කරන පිරිස්ද නිතර ගැවසෙන නිසා විමසිලිමත්ව සිටිය යුතු වේ. මෙම ඇළ මාර්ගය කැළණි ගඟට විවෘත වන නිසා මේ කිඹුලා කැළණි ගඟෙන් පැමිණි එකෙක්ද නැතිනම් දියවන්නා ඔයෙන් පැමිණි එකෙක්ද යන සැකය මතුවී තිබේ.

කෙසේ වෙතත් වනජීවී නිලධාරීන් පැමිණ පරීක්ෂා කළත් කිඹුලා සොයා ගැනීමට නොහැකි වී තිබේ. මේ දිනවල පවතින අධික වැසි නිසා ගංවතුර තත්ත්වයක් ඇති වුවහොත් මේ කිඹුලා ගම්මානවලට පැමිණීමේ ඉඩකඩක්ද පවතී.

ආගිය අතක් නෑ

තොරතුරක් වෙතොත් 0741861553ට කියන්න



අංක 24/25/ඒ. 1 ජේදවත්ත පාර, කිරිකොටුව යන ලිපිනයේ පදිංචිව සිටි කුලේන්ඩේ ජේසු සෙනෝ නමැති අවුරුදු 24ක් වයසැති තරුණයා පසුගිය සෙනසුරාදා (18 දා) රාත්‍රියේ සිට ආගිය අතක් නොමැත.

එදින ඔහු නිවසින් පිටවී ඇත්තේ තම නිවස ආසන්නයේ ජේදවත්ත පාරේ වාහන සේදීමේ සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා සූදානමින් සිටින මරදාන ප්‍රදේශයේ පදිංචි මිතුරා මුණගැසීමටයි. තවත් මිතුරන් කිහිපදෙනකු සමඟ රාත්‍රියේ එම ස්ථානයේ සිට මත්පැන් පානය කර තිබේ.

පසුදින සිට එනම් ඉරිදා සිට ඔහුගේ ජංගම දුරකථනයද ක්‍රියාත්මක කර නොමැත. මේ පිළිබඳව ඔහුගේ මිතුරාගෙන් විමසූ විට ඔහු පවසා ඇත්තේ පසුදින ඔහු නිවසට යන බව පවසා තමාගෙන් සමුගත් බවයි.

අතුරුදන්වීම සම්බන්ධයෙන් ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් දමා ඇත. ඉහත ඡායාරූපයේ සිටින අතුරුදන්වූ පුද්ගලයා පිළිබඳ යම් තොරතුරක් ලැබුණහොත් 0741861553 යන දුරකථන අංකයට හෝ ළඟම ඇති පොලිස් ස්ථානයකට දැනුම් දෙන ලෙස ඔහුගේ පවුලේ උදවිය ඉතා කාරුණිකව ඉල්ලා සිටී.

ශ්‍රී ලංකාවේ ලොකුම මත්ස්‍යයා හැඳල කැලණි ගංමෝයෙන් අල්ලයි

බර කිලෝ 19කට අධිකයි



හැඳල ජේ ස්ටැනිස්ලස් පයස්

යාන්ත්‍රික බිලිපිත්තක් මගින් ව්‍යාජ ප්ලාස්ටික් ඇමක් යොදා කාස්ටින් ක්‍රමයට මෙතෙක් මුහුදු ආශ්‍රිතව අල්ලා ගත් ශ්‍රී ලංකාවේ විශාලතම මත්ස්‍යයා හැඳල කැලණි ගංමෝය ආශ්‍රිතව ඉකුත් 20දා අල්ලා ගැනීමට විනෝදාංශයක් ලෙස මසුන් ඇල්ලීමේ නිරත වත්තල - හැඳල, පල්ලියවත්තේ පදිංචි තිස්එක් හැවිරිදි රවිඳු නිමේෂ නමැති තරුණ මහතා සමත් වී ඇත.

කිලෝග්‍රෑම් 19ක් සහ ග්‍රෑම් 600ක් බරැති, දිගින් අඟල් 57ක් වූ සහ බඩ වට ප්‍රමාණය අඟල් 24ක් වූ මෙම මත්ස්‍යයාගේ කුසේ බිත්තර කිලෝග්‍රෑම් 2.6ක් තිබී හමුවී ඇත.

ගෙවල්වල ඇතිකර විශාල වූ පසු ගංගා ඇතුළු ජලාශවලට මුදාහරින මත්ස්‍ය විශේෂයක් ලෙස සැලකෙන "ඇලිගේටර් ගාර්" යන මත්ස්‍ය විශේෂයට අයත් බැව් **Sri Lanka Fishing Club** සාමාජිකයෙක්ද වූ රවිඳු නිමේෂ මහතා පවසයි.

අපරාධ රැල්ල වැඩිවීමෙන්

ශ්‍රී ලාංකික පුරවැසියන්ට ජීවිතය පිළිබඳ විශ්වාසය නැතිවෙලා

- සජබ පාර්ලිමේන්තු මන්ත්‍රී සුජීව සේනසිංහ

අකිත පෙරේරා

''වත්මන් පාලනය හමුවේ රටේ ජීවත්වන කිසිදු පුද්ගලයෙකුට ජීවිතය පිළිබඳ විශ්වාස කරන්න නොහැකි තත්ත්වයක් ඇතිවී රටේ ජාතික ආරක්ෂාව පහත වැටී තිබෙනවා'' යැයි සමගි ජන බලවේගය පාර්ලිමේන්තු මන්ත්‍රී සුජීව සේනසිංහ මහතා පැවසීය. එම පක්ෂ ප්‍රධාන කාර්යාලයේ ඊයේ (23 දා) පැවැති මාධ්‍ය හමුවට සහභාගී වූ මන්ත්‍රීවරයා එහිදී වැඩිදුරටත් මෙසේද කීය.

ජාතික ජනබලවේගය සහ ජනතා විමුක්ති පෙරමුණු ආණ්ඩුව බලයට පත්වූවාට පසුව රටේ අපරාධ රැල්ල විශාල ලෙස ඉහළ ගොස් තිබෙනවා. ඒ වගේම පසුගිය දිනක උසාවියක් තුළදී අපරාධවලට සම්බන්ධ පුද්ගලයෙකු වෙඩි තබා ඝාතනය කළා. ඒ වගේම මහජන දිනයදා වෙඩි ප්‍රහාරයකට ලක්ව වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති, ලසන්ත වික්‍රමසේකර මහතාත් ඝාතනයට ලක්වුණා. මෙවැනි තත්ත්වයක් හමුවේ රටේ ජීවත්වන කිසිදු පුද්ගලයෙකුට ජීවිතය පිළිබඳ විශ්වාස කරන්න නොහැකියි. ඒ වගේම රටේ ජාතික ආරක්ෂාව පහත වැටී තිබෙනවා. කෙසේ නමුත් ජාතික ජනබලවේගයේ හෝ ජනතා විමුක්ති පෙරමුණේ පුද්ගලයෙකුට වෙඩි ප්‍රහාරයක් එල්ල වුවහොත් එය අපරාධකරුවකු විසින් සිදුකළ දෙයක් නොවන බවටත් විරුද්ධ පක්ෂයක පුද්ගලයෙකුට වෙඩි ප්‍රහාරයක් එල්ල වුවහොත් එය අපරාධකරුවන් සමග පැවැති ආරවුලක් නිසා සිදුවූවක් බවට වන මතයක් සමාජගත කරන්න ආණ්ඩුව දැඩි උත්සාහයක නිරත වෙනවා. කෙසේ නමුත් රටේ ඇති වී තිබෙන මෙම තත්ත්වය හමුවේ මනුෂ්‍යයෙකුට අදහස් ප්‍රකාශ කිරීමට, දේශපාලනයේ නිරත වීමට, නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගතවෙලා තිබෙනවා. රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් බරපතළ තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා.

ලසන්ත වික්‍රමසේකර මහතා පසුගිය පළාත් පාලන ඡන්දයේදී සමගි ජනබලවේගයෙන් තරග වැද ජයග්‍රහණය කළ අතර ඔහු එහි සභාපති ධුරයට පත්වූයේ ඒ සඳහා පාර්ශ්ව දෙකක් අතර පැවති මතභේදාත්මක තත්ත්වයක් තුළයි. ඒ වගේම එම අවස්ථාවේදී පැහැරගැනීම් සහ වෙඩි තැබීම් පවා සිදුවුණා. නමුත් ලසන්ත වික්‍රමසේකර මහතා ප්‍රජාතන්ත්‍රවාදීව වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස පත්වුණා. කෙසේ නමුත් ලසන්ත වික්‍රමසේකර මහතාට විවිධ අපරාධ චෝදනා තිබෙන බව ආණ්ඩු පාර්ශ්වය චෝදනා කළා. එසේ නම් ඔහු පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වුණ අවස්ථාවේ එම චෝදනා සඳහා නීතිමය පියවර ගැනීමට අවස්ථාව තිබුණා.

අද වනවිට ශ්‍රී ලංකාව අපරාධ රාජ්‍යයක් බවට පත්වී තිබෙනවා. කෙසේ නමුත් ආණ්ඩුව රටේ ඇතිවී තිබෙන අපරාධ රැල්ල මඩින්න කටයුතු නොකර රටේ සිදුවන අපරාධ හරහා රටේ අනෙකුත් ප්‍රශ්න සියල්ල වසා ගැනීමට උත්සාහ දරනවා.

රට ගිහින් අපරාධකරුවන් ගේන රජයට

වැලිගම මන්ත්‍රීවරුන් පැහැරගැනීමට නීතිය ක්‍රියාත්මක කරන්න බැරිවෙලා

- හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරළ



ඉන්දුනීසියාවට ගොස් ජාත්‍යන්තර පොලිසියේ සහාය ඇතිව අපරාධකරුවන් ලංකාවට රැගෙන ආ රජයට අද වනවිට තම පක්ෂයේ වැලිගම මන්ත්‍රීවරිය සහ මන්ත්‍රීවරයා පැහැරගත් පිරිසට නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරළ මහතා පැවසීය.

ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂ මූලස්ථානයේ ඊයේ (23 දා) පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවට එක්වෙමිනි.

එහිදී හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරළ මහතා -

"ඉතිහාසයේ පළමුවනි වතාවට මහජන නියෝජිතයෙක් වෙඩිතබා මරා දමනවා තමන්ගේ මහජන හමුව සිදුකරන අවස්ථාවේදී. මේ රටේ නීති ආධිපත්‍ය ආරක්ෂා කරන්න පැමිණි ආණ්ඩුවක් යැයි කියාගත් මේ ආණ්ඩුව බලයේ සිටින මොහොතක මහජන ඡන්දයෙන් පත්වුණ මහජන නියෝජිතයකුට තමන්ගේ ජනතාව හමුවෙන්නට ආරක්ෂාව නොමැතිනම් මේ ආණ්ඩුව කෙතරම් පාරම්බෑවත් ජනතාවගේ ආරක්ෂාව රැකලා තිබෙනවා කියලා, එය සිදුවී නැහැ.

වැලිගම ප්‍රාදේශීය සභාවට පත්වුණු මන්ත්‍රීවරුන් විවිධ විදිහට කිලිබා ගැනීම සඳහා මේ ආණ්ඩුව කටයුතු කරමින් සිටියා. නමුත් මේ වර්තමාන රජයට වැලිගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු කිලිබා ගැනීමට අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ විතරක් නොවේ එහි මංගල සභාවාරය පවත්වන දිනයේදී ඔවුන්ගේ මන්ත්‍රීවරියක් සහ මන්ත්‍රීවරයෙක් මේ මියගිය සභාපතිවරයා පැහැරගත්තා යනුවෙන් චෝදනාවක් සිදුකළා. ඒ චෝදනාවට අදටත් වුණු දෙයක් නැහැ.

දිවයින ගනුදෙනු ලොව

සංස්කරණය - ප්‍රභාත් විතාන

ලංකා බැංකුවේ පේරාදෙණිය උද්භිද උද්‍යාන සීමිත සේවා ශාඛාව විවෘත කිරීම සහ කෙසෙල්වත්ත ශාඛාව නව පරිශ්‍රයක් වෙත ගෙන යාම සිදු කෙරෙයි

සිය වටිනා ගනුදෙනුකාර භවතුන්ට නවතම බැංකුකරණ අත්දැකීමක් සහ කාර්යක්ෂම සේවාවක් ලබා දීමේ අරමුණින් ලංකා බැංකුවේ පේරාදෙණිය අධි ශ්‍රේණි ශාඛාවට අනුබද්ධිත පේරාදෙණිය උද්භිද උද්‍යාන සීමිත සේවා ශාඛාව විවෘත කිරීම සහ කෙසෙල්වත්ත ශාඛාව නව පරිශ්‍රයක් වෙත ගෙන යාම පසුගියදා සිදු කෙරිණි.

මෙම ශාඛා හරහා පේරාදෙණිය හා පානදුර කෙසෙල්වත්ත යන ප්‍රදේශවල සහ එම ප්‍රදේශ අවට ජීවත් වන ජනතාවට කාර්යක්ෂම බැංකු සේවා ලබා දෙමින් ආර්ථික වශයෙන් ඔවුන් සවි බල ගැන්වීම ලංකා බැංකුවේ අරමුණයි. දිවයින පුරා පිහිටා ඇති 660කට අධික ලංකා බැංකු ශාඛා ජාලය හා 2400කට අධික පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සම්බන්ධ වී ඇති නිසා ගනුදෙනුකරුවන්ට මෙම ශාඛා හරහා රටේ ඕනෑම ප්‍රදේශයක් සමග බැංකු ගනුදෙනු සිදු කිරීමේ හැකියාව ලැබී ඇත.

RDB බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ලෙස ආචාර්ය අසංග තෙන්නකෝන් පත් කෙරේ

ශාඛා 272 ක ශාඛා ජාලයකට හිමිකම් කියනු ලබන දිවයිනේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ (RDB)සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ලෙස ආචාර්ය අසංග තෙන්නකෝන් මහතා 2025/10/13 දින පත්විය.

අසංග තෙන්නකෝන් මහතා බැංකු ක්ෂේත්‍රය සම්බන්ධව පුළුල් දැනුමක් සහිත වසර 25 කට අධික කාලයක් දේශීය මෙන්ම විදේශීය මූල්‍ය ආයතන වල සේවය නියුතුව සිටි පිළිගත් නායකයෙකු වන අතර ක්ෂුද්‍ර හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රය මෙන්ම අවදානම් කළමණාකරනය, දේපළ කළමණාකරන, ව්‍යාපෘති මූල්‍යකරණය වැනි ක්ෂේත්‍ර වල විශේෂ නිපුණතාවයක් දක්වයි.

RDB බැංකුව සමග සම්බන්ධ වීමට පෙර ඔහු යුනියන් බැංකුවේ ආයතනික බැංකුකරණ අංශයේ උප සභාපතිවරයා ලෙස කටයුතු කළ අතර එහිදී විශාල ගනුදෙනුකරුවන් ප්‍රමාණයක් හට සාර්ථක මූල්‍ය සේවාවන් ගොඩනැගීම සඳහා නායකත්වය ලබා දී ඇත. ඊට අමතරව ඔහු ඩුබායි හා කටාර් හි ඩෝහා බැංකුවේ මූල්‍ය සේවා කළමණාකරනය සඳහා විශාල දායකත්වයක් ලබා දී ඇත.

ඔහු **Univesidade Azteca** විශ්ව විද්‍යාලය වෙතින් ව්‍යාපාර කළමණාකරනය සම්බන්ධ ආචාර්ය උපාධියත්, කොළඹ විශ්ව විද්‍යාලයේ මූල්‍ය ආර්ථිකය සම්බන්ධ ශාස්ත්‍රපති උපාධියත්, ඊට අමතරව බැංකුකරණය හා මූල්‍ය ක්ෂේත්‍රයට අදාළව වෘත්තීය සුදුසුකම් රාශියක් හිමිකරගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ උප සභාපතිවරයෙකු හා තවත් ජාත්‍යන්තර වෘත්තීය ආයතන කිහිපයක ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙසද කටයුතු කරනු ලබයි.

ගුණාත්මක ව්‍යාපාරික වර්ධනය මෙන්ම නව්‍යත්වය පදනම්ව බැංකු කටයුතු හරහා තිරසාර සංවර්ධනය දැක්ම කරගනිමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හරහා දේශීය ආර්ථිකය ඉදිරියට ගෙන යාම අරමුණු කරගනිමින් සියලුම ශ්‍රී ලාංකිකයින් සවිබල ගැන්වීම ඔහුගේ මූලික අරමුණ බව පෙන්වා දෙන ලදී.

කාගිල්ස් ආයතනය ලෝක ළමා දිනය අති උත්කර්ෂවත් අන්දමින් සමරයි

කාගිල්ස් ආයතනය, ඔක්තෝබර් 01 වැනිදා විහාරමහාදේවි සතුටු උයනේදී, අති උත්කර්ෂවත් අන්දමින් ලෝක ළමා දින සැමරුම් උත්සවයක් සංවිධානය කර තිබූ අතර මෙම ලෝක ළමා දින උත්සවය දූවා දරුවන්ට මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ටද සතුට සහ උද්යෝගය පිරුණු, අමතක නොවන අත්දැකීම් සහිත දිනයක් බවට පත් කිරීමට කටයුතු කර තිබුණි.

කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල පෙර පාසල් දරුවන් විසින් ගායනයෙන් සහ නර්තනයෙන් පැමිණ සිටි සියලු දෙනා තම දක්ෂතා එළිදැක් වූ අතර රත්මලාන බිහිරි පාසලේ සහ දෙහිවල පුනේරා පදනමේ දරුවන්ද ඔවුන්ගේ සුවිශේෂී කුසලතා ප්‍රදර්ශනය කරන ලදී. මෙම ප්‍රසංගවලට අමතරව, විනෝදජනක ක්‍රියාකාරකම් සහ ක්‍රීඩා මගින් දරුවන්ට තම පවුලේ සාමාජිකයන් සමඟ ක්‍රීඩා කිරීමට, ඉගෙනීමට සහ ගුණාත්මක කාලයක් ගත කිරීමට අවස්ථාව හිමි විය. කාගිල්ස් ෆුඩ් සිටි, කාගිල්ස් ඔන්ලයින්, කොත්මලේ, මැජික්, කිස්ට්, රයිඩ්, නකල්ස්, KFC සහ ගෝල්ඩි යන සියලුම කාගිල්ස් සන්නාමයන්ගේ සහභාගිත්වයෙන් පැවැත් වූ විශේෂාංග සහ ක්‍රියාකරම් රැසක්ද මෙම උත්සවය තුළ දැකගත හැකි වූ අතර, කාගිල්ස් බැංකුවේ අනුග්‍රහය යටතේ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කරමින්, දෙමාපියන්ට ඔවුන්ගේ දරුවන් සඳහා ඉතුරුම් ගිණුම් විවෘත කිරීමටත්, සුරක්ෂිත මූල්‍ය අනාගතයක් ඇති කර ගැනීමට සහාය දැක්වීමත් කැපී පෙනිණි.

කොමර්ෂල් බැංකුව 'Coolest Projects ශ්‍රී ලංකා 2025' වැඩසටහන සමග එක්වෙයි

නවීන තාක්ෂණය තුළින් සැබෑ ලෝකයේ ගැටලුවලට නව්‍ය විසඳුම් නිර්මාණය කිරීම උදෙසා තරුණ දරුවන් දිරිමත් කිරීමේ වැඩසටහනක් සඳහා කොමර්ෂල් බැංකුව සහය ලබාදී ඇත.

තාරුණ්‍යයේ අභිලාෂයන් බලගැන්වීම හා ඔවුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම වෙනුවෙන් බැංකුව දක්වන කැපවීම තවත් ඔප්නංවමින් කොමර්ෂල් බැංකුවේ අනුග්‍රහයෙන් Coolest Projects ශ්‍රී ලංකා 2025 වැඩසටහන සාර්ථකව පැවැත්විණ.

කොමර්ෂල් බැංකුව සහ Raspberry Pi පදනම එක්ව STEMUP අධ්‍යාපනික පදනම විසින් සංවිධානය කළ මෙම අවස්ථාවට දිවයින පුරා ඉදිරිපත් කරන ලද අයදුම්පත් 200 කට අධික සංඛ්‍යාවකින් තෝරාගත් කැපී පෙනෙන ව්‍යාපෘති 100ක් එක් විය. මෙමගින් ඔවුන්ගේ නිර්මාණශීලී හැකියාවන්, තාක්ෂණික දැනුම, සහ ගැටලු විසඳීමේ කුසලතා ප්‍රදර්ශනය කිරීමට ගෝලීය වේදිකාවක් ලැබුණි.

Raspberry Pi පදනමේ නිලධාරීන් හා රටවල් 20කට අධික සංඛ්‍යාවක නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්වූ මෙම වැඩසටහනට ජාත්‍යන්තර වැදගත්කමක් ලබා දෙමින් එම නිලධාරීන් දරුවන සමග සෘජුවම සම්බන්ධවී තාක්ෂණික නවෝත්පාදනයේ අනාගතය පිළිබඳව ඔවුන්ගේ ඉදිරි දර්ශනය බෙදාහදා ගන්නා ලදී.

ඩ්‍රැගන්ස් ඔෆ් ශ්‍රී ලංකා 2025 උළෙලේදී HNB ඇෂුවරන්ස් රිදී සම්මානය දිනා ගනී



HNB ඇෂුවරන්ස් කණ්ඩායම රිදී සම්මානය ලබමින්....

ඩිජිටල් කාණ්ඩය යටතේ වර්චුවල් අවුරුදු ගම්මාන ව්‍යාපෘතිය සඳහා ඩ්‍රැගන්ස් ඔෆ් ශ්‍රී ලංකා 2025 උළෙලෙදී රිදී සම්මානයක් දිනා ගැනීමට HNB ඇෂුවරන්ස් සමත් විය.

සම්ප්‍රදායන් සහ තාක්ෂණය සංකලනය විය හැක්කේ කෙසේදැයි ප්‍රදර්ශනය කළ මෙම ඩිජිටල් අත්දැකීම, සිංහල සහ දමිළ අලුත් අවුරුද්ද වැනි සංස්කෘතික උත්සවයක් ආකර්ෂණීය ඩිජිටල් අත්දැකීමක් බවට පත් කළේය.

මෙම සම්මානය ගැන සිය අදහස් දැක්වූ HNB ඇෂුවරන්ස්හි විධායක අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ලසිත විමලරත්න මහතා, ජනතාව සමග වන සබඳතාවය මනාව පවත්වාගෙන යාමට තම සමාගම නිර්මාණශීලී ක්‍රමෝපායන් නොකඩවා ගවේෂණය කරමින් සිටින බවට මෙම ජයග්‍රහණය කදිම නිදසුනක් බව අවධාරණය කළේය. සාම්ප්‍රදායික සැමරුමක් වර්චුවල් ෆෝමැට්‍යකින්, තරුණයන් ඇතුළු පුළුල් ප්‍රේක්ෂකයින්ට ආකර්ෂණීය අත්දැකීමක් නිර්මාණය කිරීමට අපට හැකි විය. මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඉදිරිපත් කිරීමට දායක වූ සියලුම කණ්ඩායම්වලට මගේ අවංක ස්තූතිය සහ හෘදයාංගම සුබ පැතුම් පළ කර සිටිමි යැයිද එම මහතා පැවසීය.

අනතුරුව සිය අදහස් බෙදා ගත් සමාගමේ ප්‍රධාන අලෙවිකරණ සහ පාරිභෝගික අත්දැකීම් නිලධාරී / සාමාන්‍යාධිකාරී දිනේෂ් යෝගරත්නම් මහතා මෙම සම්මානය දිනා ගැනීම මගින් වෙනස්වන ගනුදෙනුකාර ප්‍රවණතා සමග එක්ව ගමන් කිරීමේ වැදගත්කම තවතවත් ඉස්මතු වී ඇත යැයි පැවසූ අතර වර්චුවල් අවුරුදු ගම්මාන ව්‍යාපෘතිය සමග තම සමාගම නවෝත්පාදන ආදේශ කර ගත් බව පමණක් නොව ඩිජිටල් වේදිකාවකට අවුරුදු උත්සව ගෙන ඒම මගින් සාම්ප්‍රදායික මුල්වලට HNB ඇෂුවරන්ස් ලබා දෙන වැදගත්කමද තහවුරු වී ඇත යැයි පෙන්වා දුන්නේය.

ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය සඳහා කවර උපාය මාර්ග වෙත යා යුතුද?

පුවතක පසුබිම

ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය එහි ඉතිහාසයේ තීරණාත්මක මොහොතක සිටී. දශක ගණනාවක් පුරා ලංකා විදුලි බලමණ්ඩලය (CEB) ජාතික විදුලි බලපැපයුමේ කොඳු නාරටිය වී ඇති අතර, සමාජ ප්‍රගතිය හා ආර්ථික සංවර්ධනය සක්‍රීය කර ඇත. එහෙත් අද,ගැඹුරු ව්‍යුහාත්මක දුර්වලතා, දේශපාලන මැදිහත්වීම් සහ මූල්‍ය පීඩන එහි ස්ථායිතාවයට සහ ඵලදායිතාවයට තර්ජනයක් වී තිබේ.

මේ හේතුව නිසා, පෙර පැවති රජයන් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට උත්සාහ කර ඇත. මෙම උත්සාහයන් බොහොමයක් කනගාටුදායකව, මූලික පාලන හා පරිපාලන ගැටලු විසඳීම වෙනුවට හිමිකාරිත්වය සහ වෙළෙඳපොළ ප්‍රතිව්‍යුහගත කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙය ශ්‍රී ලංකාව ක්‍රමයෙන් පුද්ගලීකරණය කරා යන මාවතකට ගෙන යමින් සිටින බවටත් දිගුකාලීනව ජාතික බලශක්ති ස්වෛරීත්වය අඩපණ වියහැකිය බවටත් සාධාරණ මහජන බියක් මතු වී තිබේ.

විදුලිබල ක්ෂේත්‍රයට බරපතළ ප්‍රතිසංස්කරණ අවශ්‍ය බව අපි පිළිගනිමු,

නමුත් මෙම ප්‍රතිසංස්කරණ රාජ්‍ය වත්කම් විකිණීම හෝ උපාය මාර්ගික පාලනය අත්හැරීම වෙනුවට උපාය මාර්ගික, ජාතික අයිතිය සහිත සහ යහපාලනය කෙරෙහි අවධානය යොමු වූ ප්‍රතිසංස්කරණ විය යුතුය.

CEB තුළ ඇති අකාර්යක්ෂමතා රාජ්‍ය හිමිකාරිත්වයේම ප්‍රතිඵලයක් නොව, දුර්වල පාලන ව්‍යුහයන් සහ දේශපාලනීකරණය වූ තීරණ ගැනීම් නිසා සිදු වී ඇති බව හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ.

වසර දහයකට ආසන්න කාලයක්, රජයන් විසින් බොහෝ විට මැතිවරණ ප්‍රතිලාභ සඳහා, වැඩි වන නිෂ්පාදන පිරිවැය අනුව විදුලි ගාස්තු ගැළපීමෙන් වැළකී සිට ඇත. මෙය දැවැන්ත ආදායම් හිඟයක් ඇති කළ අතර, සිදුවන පාඩුව සඳහා භාණ්ඩාගාරයට මුදල් දීමට සිදු විය. ඒ හා සමානව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්, දේශපාලනික හේතූන් මත පත් කිරීම් සහ මූල්‍ය විනයේ ඌනතාව මෙම ගැටලු තවත් උග්‍ර කර ඇත.

සමහර තර්ක හා අදහස් යෝජනා කරන පරිදි, මෙම අසාර්ථකත්වයන් සඳහා සේවකයන්ට දොස් පැවරීම නොමඟ යවන සුලු සහ අසාධාරණ ක්‍රියාවකි. සැබෑ ගැටලුව වන්නේ මූලධර්මයක් ලෙස රාජ්‍ය හිමිකාරිත්වය නොව විදුලිබල ක්ෂේත්‍රය කළමනාකරණය කළ ආකාරය යි. නිසි ලෙස පාලනය කළවිට, රාජ්‍ය හිමි උපයෝගිතා ක්ෂේත්‍රයන් විශිෂ්ට ප්‍රතිඵල ලබාදිය හැකි බව බොහෝ රටවල් ඔප්පු කර ඇත.

2024 අංක 36 දරන විදුලිබල පනත නිර්භීත නවීකරණ උත්සාහයක් ලෙස හඳුන්වා දෙන ලදී. එහි පාරදෘශ්‍යතාව වැඩිදියුණු කිරීම, පුනර්ජනනීය බලශක්තිය දිරිමත් කිරීම සහ වැඩි වගකීමක් සඳහා CEB හි කොටස් වෙන් කිරීම ආදී වැදගත් අරමුණු ඇතුළත් වුවද, මෙම මූලික ආකෘතිය වෙළෙඳපොළ ලිහිල් කිරීම කෙරෙහි අනවශ්‍ය ලෙස වැඩි අවධානයක් යොමු කර ඇත.

මෙම පනතින් ව්‍යුහාත්මක වෙන්කිරීම සහ තරඟකාරී වෙළෙඳපොළ හරහා විදුලිබල ක්ෂේත්‍රය නැවත හැඩගස්වා ගැනීමට උත්සාහ කළ නමුත්, ගැටලුවේ හදවත ලෙස ඇති මූලික පාලන අඩුපාඩු විසඳුවේ නැත. එසේ කිරීමෙන්, කාලයත් සමඟ, අවසානයේ පුද්ගලීකරණය හෝ විදේශීය උපාය මාර්ගික බලපෑම සඳහා පහසු ඉලක්ක බවට පත් විය හැකි ඛණ්ඩනය වූ ආයතන නිර්මාණය කිරීමේ අවදානමක් ඇති කළේය.

රාජ්‍ය ආයතන ප්‍රතිසංස්කරණයේ අවශ්‍යතාව අප විසින් පිළිගනු ලබන නමුත්,

එය අධික වෙළෙඳපොළකරණය හරහා රාජ්‍ය ආයතන දුර්වල කිරීමෙන් නොව, රාජ්‍ය ආයතන සහ නියාමන රාමුවන් ශක්තිමත් කිරීමෙන් ආරම්භ විය යුතු බව විශ්වාස කරයි.

2025 සංශෝධනය: අවිනිශ්චිතතාවය සහ ප්‍රතිවිරෝධතා

2025 සංශෝධනය පවතින තත්ත්වය තවත් සංකීර්ණ කළේය. 100% රාජ්‍ය හිමිකාරිත්වය රඳවා ගනිමින් නමුත් පවතින පරිපාලන ව්‍යුහයන්ම පවත්වා ගැනීමෙන්, එය ප්‍රතිපත්ති ප්‍රතිවිරෝධතාවයක් ඇති කළේය.

එය වත්මන් පාලනයේ අකාර්යක්ෂමතා ව්‍යංගයෙන් පිළිගත්තේය. එහෙත් එය බරපතළ පාලන ප්‍රතිසංස්කරණයක් ඉදිරිපත් නොකළ අතර, ව්‍යුහාත්මක දුර්වලතා නොවෙනස්ව පැවතුණේය.

මෙවැනි කරුණු නිමිති කරගෙන සේවකයන් අතර අවිශ්වාසය ජනනය වී ඇති අතර, පැහැදිලිව සඳහන් නොකළත්, පුද්ගලීකරණය අවසාන ප්‍රතිඵලය විය හැකි බවට මහජන සැකය ඇති කර තිබේ.

කම්කරු විරෝධතා, වෘත්තීය සමිති ක්‍රියාකලාපයන් සහ මහජන විවාද මෙම වැඩෙන අසහනය පිළිබිඹු කරයි.

පුද්ගලීකරණය නිවැරදි පිළිතුර නොවේ

සමහර රටවල, රජයන් මූල්‍ය පාඩු සඳහා ඉක්මන් විසඳුමක් ලෙස විදුලි උපයෝගිතා පුද්ගලීකරණය ලුහුබැඳ ගොස් ඇත.

නමුත් ගෝලීය වශයෙන් මෙම ක්‍රියාව මිශ්‍රවල අත්දැකීම් පෙන්නුම් කරයි. පුද්ගලීකරණය සමහර අවස්ථාවල කෙටිකාලීන කාර්යක්ෂමතා ලාභ ගෙන ආවද, බොහෝ අවස්ථාවන්හිදී එය ගාස්තු ඉහළ යෑම, නියාමන පාලනය නැතිවීම සහ ලාභ විදේශයන්ට යෑම ද ඇති කර ඇත. වඩා වැදගත් කරුණ වනුයේ, බොහෝ විට පුද්ගලීකරණය ජාතික ප්‍රතිපත්ති නම්‍යශීලීත්වය අඩපණ කිරීමයි.

මෙහිදී විදුලි ගාස්තු, උත්පාදන ප්‍රභේද හෝ ග්‍රාමීය විදුලිකරණය පිළිබඳ තීරණ මහජන අවශ්‍යතා වෙනුවට වාණිජ ප්‍රමුඛතාවලට යටත් විය හැකිය.

බොහෝ සාර්ථක රටවල් රාජ්‍ය හිමිකාරිත්වය සහ කාර්යක්ෂමතාව අත්වැල් බැඳ යා හැකි ප්‍රායෝගික දෙයක් බව පෙන්වා දී ඇත.

Norway's Statkraft 100% රාජ්‍ය හිමි වන අතර යුරෝපයේ ප්‍රමුඛ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයෙකි.

France's EDF බහුතර රාජ්‍ය හිමිකාරිත්වය පවත්වා ගනිමින් ගෝලීයව ක්‍රියාත්මක වන අතර, දෙමුහුන් මූල්‍යකරණ ආකෘති භාවිත කරයි.

Singapore's SP Group සම්පූර්ණයෙන්ම රාජ්‍ය හිමි වන අතර එහි ක්‍රියාකාරී විශිෂ්ටත්වය පිළිබඳ ලෝකය පුරා ප්‍රසිද්ධය.

Vattenfall (Sweden) සහ KEPCO (දකුණු කොරියාව) පැහැදිලි පාලනය සහ උපායමාර්ගික එකමුතුකම, රාජ්‍ය උපයෝගිතා සමෘද්ධිමත් වීමට හැකි වන ආකාරය විදහා දක්වයි.

මෙම උදාහරණ මගින් කාර්යක්ෂමතාවයේ සැබෑ ධාවකයා යහපාලනය මිස පුද්ගලීකරණය නොවන බව ඔප්පු කරයි.

අප විසින් රාජ්‍ය හිමිකාරිත්වය අත්නොහැර විදුලිබල ක්ෂේත්‍රය නවීකරණය කිරීම සඳහා පැහැදිලි, ජාතික වශයෙන් මෙහෙයවන ලද උපායමාර්ගයක් යෝජනා කරන්නෙමු.

කළමනාකරණයෙන් දේශපාලනය ඉවත් කර කාර්ය සාධන පදනම් වූ වගකීම හඳුන්වා දෙන්න.

පැහැදිලි බලයලත් කිරීම් සහිත සුදුසුකම් ලත්, ස්වාධීන මණ්ඩල පත් කරන්න.

පාරදෘශ්‍ය විගණනය සහ අධීක්ෂණය සහතික කරන්න.

PUCSL හි ස්වාධීනත්වය තහවුරු කරන්න.

නිසි මහජන සන්නිවේදනය සහිත පිරිවැය පිළිබිඹු කරන ගාස්තු ක්‍රියාත්මක කරන්න.

තීරණ ගැනීම් පාරදෘශ්‍ය සහ සාක්ෂි පදනම්ව සිදු කරන්න.

දේශීය ප්‍රාග්ධන රැස් කිරීමට බැඳුම්කර, රාජ්‍ය ආයෝජන මාධ්‍ය හෝ අර්ධ පාලන නොවන ලැයිස්තුකරණ භාවිත කරන්න.

ලාභ ආපසු ගෙනයෑම සහ උපාය මාර්ගික යැපීම ඇති කරන විදේශීය මූල්‍යකරණ වළකින්න.

ඉන්ධන ආනයන පිරිවැය අඩු කිරීමට පිරිසිදු බලශක්ති ආයෝජන වේගවත් කරන්න.

විදුලි බලජාල නවීකරණය කරන්න, ඩිජිටල් පද්ධති භාවිත කරන්න සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන්න.

සේවකයන් බාධා ලෙස නොව ප්‍රතිසංස්කරණවල හවුල්කරුවන් ලෙස සලකන්න. සාධාරණ රැකියා පිළිවෙත් පවත්වා ගෙන යන්න සහ පාරදෘශ්‍ය සංවාදයේ වෘත්තීය සමිති සම්බන්ධ කරන්න.

පුද්ගලීකරණයේ සැඟවුණු අනතුරකින් එකක් වන්නේ ලාභ ආපසු ගෙනයාමයි. විදේශීය ආයෝජකයන් උපයෝගිතා පාලනය කරනවිට, සැලකිය යුතු මූල්‍ය ප්‍රවාහයන් වාර්ෂිකව රට හැර යයි. මෙය ගෙවුම් ශේෂය දුර්වල කර දේශීය සංවර්ධනය සඳහා ලබාගත හැකි අරමුදල් ප්‍රමාණය අඩු කළ හැකිය.

දේශීය ප්‍රාග්ධන බලමුළු ගැන්වීම සහ රාජ්‍ය හිමිකාරිත්වය පවත්වා ගැනීමෙන්, ශ්‍රී ලංකාවට විදේශයන්හි කොටස් හිමියන්ගේ ලාභාංශ වෙනුවට පාසල්, රෝහල් සහ යටිතල පහසුකම් සඳහා අරමුදල් සපයමින්, තම විදුලිබල ක්ෂේත්‍රය මගින් ජනනය කරන ලද ආර්ථික වටිනාකම තම දේශසීමා තුළ පවතින බව සහතික කළ හැකිය.

ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයට ප්‍රතිසංස්කරණ අවශ්‍ය ය. ඒ ගැන කිසිදු ප්‍රශ්නයක් නැත. නමුත් ප්‍රතිසංස්කරණ කිරීමේ තීරණයට සමානව ප්‍රතිසංස්කරණවල දිශාව වැදගත් වේ. පුද්ගලීකරණය අනිවාර්ය හෝ යෝග්‍ය නොවේ.

එක්සත් රාජධානියේ වරලත්
සුරැකුම්පත් සහ ආයෝජන
ආයතනයේ සාමාජික සහ
ශ්‍රී ලංකාවේ වරලත් වෘත්තීය
කළමනාකරුවන්ගේ
ආයතනයේ සාමාජික.

හීරියමුල්ලගේ
බුද්ධික ප්‍රසන්න
ශ්‍රී ලංකා ජනතා
පක්ෂයේ (SLJP) නායක

ෆ්ලයි ඇන්ඩ් හෙල්ප් පදනම සිය 1,000 වන ගෝලීය පාසල ශ්‍රී ලංකාවේදී විවෘත කරයි

ලොව පුරා රටවල් 50 කට අධික සංඛ්‍යාවක පාසල් ඉදිකර කර ඇති ජර්මනියේ ෆ්ලයි ඇන්ඩ් හෙල්ප් පදනම (Fly & Help Foundation) පසුගියදා ශ්‍රී ලංකාවේ හේමාස් අවුට්රීච් පදනම (Hemas Outreach Foundation) සමග එක් වී සිය 1,000 වැනි ගෝලීය පාසල වෙන්නප්පුවේදී විවෘත කළේය.

ගෝලීය අධ්‍යාපනයේ සුවිශේෂී සන්ධිස්ථානයක් වන මෙය ශ්‍රී ලංකාවේ මුල් ළමා විය අධ්‍යාපනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටුකරනු ඇත.

තනිව ලොව පුරා සිදුකරන ලද සංචාරයකින් අනතුරුව තමන් ලද අත්දැකීම් තුළින් පන්නරය ලබමින් Rainer Meutsch විසින් 2009 වසරේදී ෆ්ලයි ඇන්ඩ් හෙල්ප් පදනම ආරම්භ කරන ලදී. කෙටි කාලයක් තුළ දැවැන්ත වර්ධනයක් අත්පත් කරගත් එම පදනම මේ වන විට මහාද්වීප තුනක රටවල් 57 ක ක්‍රියාත්මක වේ. පසුගිය වසර15 තුළ එම පදනම අප්‍රිකාවේ, ආසියාවේ සහ ලතින් ඇමරිකාවේ පාසල් සිය ගණනක් ඉදිකර ඇති අතර, එය සිදුකරනු ලබන්නේ තමන්ට ලැබෙන සෑම පරිත්‍යාගයක්ම නිසි ප්‍රතිලාභීන්ට හිමි වන බව සහතික කරන විශ්වාසනීය හවුල්කරුවන් සමග අත්වැල් බැඳගනිමිනි.

ෆ්ලයි ඇන්ඩ් හෙල්ප් නිර්මාතෘ Rainer Meutsch, හේමාස් අවුට්රීච් පදනමේ විධායක අධ්‍යක්ෂිකා ශිරෝමි මාසකෝරාළ, ෆ්ලයි ඇන්ඩ් හෙල්ප් නියෝජ්‍ය සභාපති Silanca Weihmann සහ හේමාස් අවුට්රීච් පදනමේ සභාපති සහ හේමාස් සමූහ ව්‍යාපාරයේ සමූහ අධ්‍යක්ෂ අබ්බාස් ඉසුෆලි යන මහත්ම මහත්මීන් 1,000 වන ගෝලීය පාසල විවෘත කළ අයුරු ඡායාරූපයෙන් දැක්වේ.

දෙනියාය නගර සණස උප සභාපති සරත් ගොඩේවිතාන අභාවප්‍රාප්ත වෙයි

දෙනියාය මෙඩිසිටි වෛද්‍ය මධ්‍යස්ථානයේ අධිපති, දෙනියාය නගර සණස බැංකුවේ උපසභාපති මෙන්ම වෙළඳ සංගමයේ කාරක සභික සරත් ගොඩේවිතාන මහතා (අවු. 64) අභාවප්‍රාප්ත විය.

ප්‍රදේශයේ ප්‍රකට සමාජ ක්‍රියාකාරිකයකු වූ ඒ මහතා කලක් ලේක්හවුස් ආයතනයේ කර්තෘ මණ්ඩල සෝදුපත් කියවීමේ දෙපාර්තමේන්තුවේ සේවය කර විශ්‍රාම ලැබුවෙකි. බිරිඳ ඇතුළු දරුවන් තිදෙනකුගේ පියකු වූ ඒ මහතාගේ දේහය පිළිබඳ අවසන් කටයුතු අද (24) දෙනියාය ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේදී සවස 6.00ට සිදුකෙරේ. දේහය දැනට දෙනියාය, පන්සල පාර 'දයානි' නිවසේ තැන්පත් කර ඇත.

ඕස්ට්‍රේලියා ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානී

තනතුරින් ඉවත් කිරීම බල රහිත කරන්නේද නැද්ද තීන්දුව දෙසැම්බර් 08 දා

ඒ. ජේ. ඒ. අබේනායක

කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව හා නිසි විමර්ශනයක් හෝ පැවැත්වීමකින් තොරව ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර පිහිටි ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලයේ දූත මණ්ඩලයේ ප්‍රධානී (මිනිස්ටර්) ලෙස කටයුතු කළ ජී. ආර්. පී. එම්. ඒ. දේවේන්ද්‍ර මහතා එකී තනතුරින් වහාම ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරමින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ මානව සම්පත් අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති ලිපිය බලරහිත කරන්නේද නැද්ද යන තීන්දුව ලබන දෙසැම්බර් අටවැනිදා නිකුත් කිරීමට අභියාචනාධිකරණය ඊයේ (23 දා) දින නියම කළේය.

ජී. ආර්. පී. එම්. ඒ. දේවේන්ද්‍ර මහතා විසින් සිය නීතිඥවරුන් මාර්ගයෙන් ගොනුකර තිබූ පෙත්සම සම්බන්ධයෙන් විවාදය ඊයේ (23 දා) අභියාචනාධිකරණ විනිසුරු ආචාර්ය ප්‍රැන්ක් ගුණවර්ධන මහතා ඉදිරියේදී පැවැත්විණි.

පෙත්සම සම්බන්ධයෙන් විභාගය අවසන් කළ අභියාචනාධිකරණ විනිසුරු ආචාර්ය ප්‍රැන්ක් ගුණවර්ධන මහතා ලබන මස 14 දා හෝ ඊට පෙර ලිඛිත දේශන තම අධිකරණය හමුවේ ගොනුකරන ලෙසට පෙත්සම්කාර පාර්ශ්වයට හා වගඋත්තරකාර පාර්ශ්වයට නියෝග කළේය.

වසර 22ක නිකැළැල් රාජ්‍ය සේවයකට හිමිකම් කියන රාජ්‍ය පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වන සිය සේවාදායකයා වසර තුනක කාලයක් සඳහා ගිවිසුම් අත්සන් කර එකී තනතුරට පත්කළ බවත්, වත්මන් රජය පත්ව කෙටි කලකින් එනම් 2025 අගෝස්තු 15 වැනිදා සිට බලපැවැත්වෙන පරිදි ඔහු එකී රාජකාරියෙන් ඉවත් කර ආපසු ශ්‍රී ලංකාවට කැඳවීම යුක්ති සහගත නොවන හා නීතියට පටහැනි ක්‍රියාවක් වන්නේ යැයි දේවේන්ද්‍ර මහතා වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ නීතිඥ ශාන්ත ජයවර්ධන මහතා පෙත්සමේ විවාදය ආරම්භ කරමින් විනිසුරුවරයාට පෙන්වා දුන්නේය.

වසර තුනක කාලයකට පත් කිරීම නිසා සිය බිරිඳ හා දරුවන්ද රැගෙන එරටට ගිය පෙත්සම්කරු මාස අටක් ඇතුළත ආපසු රටට කැඳවීම දේශපාලන හේතුන් මත සිදුකළ අයුක්ති සහගත ක්‍රියාවක් වන බැවින් එකී තීරණය බල රහිත කරන ලෙසටද නීතිඥ ශාන්ත ජයවර්ධන මහතා අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

පෙත්සම්කරු රාජ්‍ය පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වන බව සැබෑ නමුත් ඔහු විදේශ දූත මණ්ඩල සේවයේ ස්ථිර නිලධාරියකු නොවන බවත්, ඔහු නැවත ශ්‍රී ලංකාවට කැඳවීමේ බලය විෂය භාර අමාත්‍යවරයාට ඇති බැවින් පෙත්සම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලෙස වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජනරාල් සුමති ධර්මවර්ධන මහතා විනිසුරුවරයාට පෙන්වා දුන්නේය.

2017දී තයිරොක්සින් පෙති ගැනීමෙන් රජයට මිලියන 16ක් පාඩු කරලා

විශේෂඥ වෛද්‍ය චමල් සංජීව

සුජීව හන්සර

2017 වර්ෂයේදී වෛද්‍ය සැපයුම් ඒකකයේ ඉහළ නිලධාරීන්ගේ උපදෙස් මත, කල් ඉකුත්වීමට ආසන්නව තිබූ තයිරොක්සින් **(Thyroxin)** පෙති මිලියන 28ක් එම ඒකකය විසින්ම භාරගැනීමෙන් රජයට රුපියල් මිලියන 16 ක මූල්‍ය අලාභයක් සිදුව ඇතැයි විශේෂඥ වෛද්‍ය, චමල් සංජීව මහතා පවසයි.

මෙම සිද්ධියට වගකිව යුතු ඉහළ නිලධාරීන් මඟහැර, පහළ නිලධාරීන්ට පමණක් විනය පරීක්ෂණ පවත්වා ඇතැයි පෙරේදා (22දා) පැවැති මාධ්‍ය හමුවකදී වෛද්‍යවරයා චෝදනා කර සිටියේය.

2016 සැප්තැම්බර් කාලසීමාවේදී භාරගෙන ඇති අදාළ තයිරොක්සින් පෙති මිලියන 28ක තොගයේ කල් ඉකුත්වීමේ දිනය 2017 ජූනි මාසය ලෙස සටහන්ව තිබී ඇති බව මේ පිළිබඳව හෙළි කළ අභ්‍යන්තර විමර්ශන වාර්තාවෙන් අනාවරණය වී ඇතැයි ද වෛද්‍යවරයා සඳහන් කළේය.

මෙම තයිරොක්සින් පෙති මිලදී ගැනීම සඳහා අදාළ සමාගම්වලට ගෙවූ රුපියල් මිලියන 16 ක මුදල සම්බන්ධයෙන් වගකිව යුතු ඉහළ නිලධාරීන්ට එරෙහිව මෙතෙක් නීතිය ක්‍රියාත්මක නොවීම කනගාටුවට කරුණක් බවත්, වෛද්‍ය සැපයුම් ඒකකය තුළ දිගින් දිගටම සිදුවෙමින් පවතින මෙවැනි අක්‍රමිකතා සම්බන්ධයෙන් පුළුල් පරීක්ෂණයක් පැවැත්වීමට ජනාධිපතිවරයාගේ අවධානය යොමු විය යුතුව ඇතැයි ද විශේෂඥ වෛද්‍ය චමල් සංජීව මහතා මෙම මාධ්‍ය හමුවේදී වැඩිදුරටත් කියා සිටියේය.

පන්නිපිටිය ක්‍රිස්තුරාජ විදුහලට ආධාර පිණිස සංගීත ප්‍රසංගයක් අද

ශ්‍යාම් නුවන් ගනේවත්ත

පන්නිපිටිය ක්‍රිස්තුරාජ විදුහලේ අධ්‍යාපන අවශ්‍යතා ඉහළනැංවීමේ කටයුතුවලට ආධාර පිණිස පවත්වනු ලබන සංගීත ප්‍රසංගයක් අද (24දා) ප.ව. 7.00ට රත්මලාන ඊගල් ලේක්සයිඩ් හෝටලයේ දී පැවැත්වේ.

එම විදුහලේ දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා ඉහළ නැංවීම වෙනුවෙන් ඉදිකරමින් පවතින නවීන පහසුකම් සහිත ශ්‍රවණාගාරය ඇතුළු භෞතික සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණෙන් මෙම සංගීත ප්‍රසංගය පැවැත්වේ.

නලින් පෙරේරා ප්‍රමුඛ 'මේරියන්ස්' මෙම ප්‍රසංගයේ සංගීතය සපයයි.

පන්නිපිටිය ක්‍රිස්තුරාජ විදුහලේ විදුහල්පති මාධවී ඉලංගසිංහ පැවිදි සොයුරියගේ මඟපෙන්වීමෙන් විදුහලේ මාපිය කමිටුව හා ආදි ශිෂ්‍ය එකමුතුව මගින් මෙය සංවිධානය කර ඇත. 0715191267 සහ 0762622772 යන දුරකථන අංක මගින් වැඩිදුර විස්තර විමසිය හැකිය.

ලෝක එක්සත් ජාතීන්ගේ දිනය අදයි

ලෝක එක්සත් ජාතීන්ගේ දිනය හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දිනය අද (ඔක්තෝබර් 24) සිහිපත් කිරීමේ දිනයක් ලෙස සමරයි. එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ නිල ආරම්භය එදිනම සිදුවිය. ලෝකයේ සාමය, ආරක්ෂාව සහ සංවර්ධනය වර්ධනය කිරීමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ කරන ලදි. එක්සත් ජාතීන්ගේ දිනය කැපකර ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අපේක්ෂාවන් හා ඉෂ්ටප්‍රාප්තීන් පිළිබඳව ලොව ජනයා දැනුවත් කිරීම සඳහාය. එක්සත් ජාතීන්ගේ දිනය, ඔක්තෝම්බර් 20 දින සිට 26 දා දක්වා පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ සතියෙහි කොටසකි.

ලෝක UN දිනය ලෝකය පුරා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමය, සාධාරණය සහ සමාජ ආරක්ෂාව පිළිබඳ කාර්යභාරය සැමරීමේ දිනක් වන අතර මෙය එක්සත් ජාතීන්ගේ සදාකාලික දායකත්වය සහ ප්‍රතිඵල පිළිබඳ කාරුණිකත්වයක් ලෙස විදහා දැක්වීමට උපකාරී වේ. මෙහි නිෂේධ බලය සහිත රටවල් වන්නේ චීනය, ප්‍රංශය, රුසියාව හා ඇමරිකා එක්සත් ජනපදයයි. මීට අමතරව ආර්ථික හා සාමාජීය කවුන්සිලය සාධාරණත්වය පිළිබඳ ජාත්‍යන්තර අධිකරණයේ යනාදී වශයෙන් වන තවත් අංශ රාශියකින් එක්සත් ජාතීන්ගේ සංවිධානය සමන්විත වේ. දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ගැටුමෙන් ඔබ්බට යමින් ගෝලීය සහයෝගිතාව සඳහා පිහිටුවා යත් සංවිධානය වන්නේ ද මෙය බවයි. ගුටෙරස් මහතා පෙන්වා දෙනුයේ එයෙම ඔබ සංවිධානය 75කට වඩා වැඩි වසරක ඉතිහාසයක් ඇති අතර එම කාලයේදී ලෝකයේ බොහෝ ප්‍රධාන ගැටළු විසඳීමට සමත් විය.

ජී. එම්. සළලි සත්සරණි රත්නායක
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

කෝප් කමිටුවේ සීමාව අධීක්ෂණයෙන් ඔබ්බට යෑම භයානකයි

කෝප් කමිටුවේ හිටපු සභාපති, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය චරිත හේරත්

රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව හෙවත් කෝප් කමිටුව (COPE) විසින් මෑතකාලීනව පවත්වන ලද සැසිවාරයන් සම්බන්ධයෙන් රට තුළ දැඩි විවාදයක් නිර්මාණය වී තිබේ. මෙම පසුබිම තුළ, පසුගිය පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ ආචාර්ය චරිත හේරත් විසින්, කමිටුවේ මුල් අරමුණ සහ එය මුහුණ දෙන වර්තමාන අභියෝග පිළිබඳව සිය අදහස් දැක්වීම වැදගත්ය. වත්මන් කෝප් කමිටුවේ හැසිරීම පිළිබඳ අදහස් දක්වමින් ආචාර්ය චරිත හේරත් මහතා පවසන්නේ කෝප් කමිටුව විධායකයේ කාර්යයන් ඉක්මවා ගොස් මහජන උසාවියක් බවට පත්වීම නරක තත්ත්වයක් බවයි. ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ 'දිවයින' සමඟ සාකච්ඡාවකට එක්වෙමිනි.

ආචාර්ය චරිත හේරත් මහතා පෙන්වා දෙන්නේ, කෝප් කමිටුව යනු 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පසුව 1979 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ථාවර කාරක සභාවක් බවයි. ඔහුට අනුව "කෝප් කමිටුවේ ප්‍රධාන අරමුණ වන්නේ රජය විසින් පාලනය කරනු ලබන ආයතන පිළිබඳව පාර්ලිමේන්තු අධීක්ෂණය සැපයීමයි." ඒ අනුව පාර්ලිමේන්තුවේ ප්‍රධාන කාර්යභාර හතර වන නියෝජනය, නියාමනය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ විධායකයේ කටයුතු අධීක්ෂණය යන කාර්යයන් අතුරින් COPE අයත් වන්නේ සිව්වැනියට දක්වා ඇති අධීක්ෂණ කාර්යයට පමණි. කමිටුවේ කාර්යභාරයේ සීමාවන් පැහැදිලි කරමින් හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ කෝප් කමිටුවේ කාර්යය වන්නේ රජයට අයත් ව්‍යවසායන් පාර්ලිමේන්තු දෘෂ්ටිකෝණයකින් පරීක්ෂා කිරීම මිස විධායක බලතල හෝ අධිකරණමය තීන්දු ලබාදීමේ බලයක් ඊට නොමැති බවයි. එහිදී ඔහු අවධාරණය කළේ, "කෝප් කමිටුවට නිලධාරීන් ඉවත් කිරීමට හෝ ඔවුන් සිරගත කිරීමට බලයක් නැහැ. එහි අරමුණ අධීක්ෂණය පමණයි" යනුවෙනි.

තමා සභාපති ධූරය දැරූ කාලය තුළ කමිටුවට මුහුණ දීමට සිදු වූ ප්‍රධාන අභියෝගය වූයේ රජයේ විධායකයෙන් කමිටුවට එල්ල වූ නිරන්තර මැදිහත්වීම බව ආචාර්ය හේරත් මහතා සිහිපත් කරයි.

"බොහෝ විට, ජනාධිපතිවරයා, ඇමැතිවරුන් හෝ කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තු කෝප් කමිටුවේ අධීක්ෂණ කටයුතුවලට බාධා කිරීමට උත්සාහ කළා. ඇතැම් අවස්ථාවල විධායකයේ සිටි ඇතැම් නායකයන් මාව සම්බන්ධ කරගෙන ඇතැම් කරුණු කෝප් කමිටුව හරහා විමර්ශනය නොකරන ලෙසට බලපෑම් කළා." යනුවෙන් සිහිපත් කළ ඔහු, තමා එම විධානයට යටත් නොවූ බවත්, පසුව තමා තනතුරෙන් ඉවත් කිරීමට ඇතැම්විට එය හේතු වන්නට ඇති බවත් පවසයි. COPE කමිටුවට සාපරාධී පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) හෝ වෙනත් විමර්ශන ආයතන වෙත සිද්ධීන් යොමුකිරීමට බලය දිය යුතු බවට නැගෙන යෝජනා පිළිබඳව ද මෙහිදී ආචාර්ය චරිත හේරත් අදහස් පළකරයි. ඒ සම්බන්ධව මේ වන විට මතුව තිබෙන ජනප්‍රියවාදී ස්ථාවරයට ඔහු සිය දැඩි විරුද්ධත්වය පළ කරයි. ඔහු අනතුරු අඟවා සිටින්නේ, "පාර්ලිමේන්තුවේ මුද්‍රාව යටතේ ලිපියක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ පොලිස්පතිවරයා වෙත යවන්නේ නම් එයට සම්මිති බරක් තිබෙනවා" යනුවෙනි. එමගින් නීති ක්‍රියාවලිය අනුගමනය කිරීමට පෙර පවා රාජ්‍ය නිලධාරීන්ට බරපතළ ප්‍රතිවිපාක ඇති කළ හැකි බවද පෙන්වා දෙයි.

කෝප් කමිටුවේ හිටපු සභාපතිවරයා මෙහිදී වැඩිදුරටත් පෙන්වා දුන්නේ, කමිටුවේ සභාපතිවරයාට, යම් රාජ්‍ය ආයතනයක ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට (අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාට) එම කරුණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස උපදෙස් දිය හැකි නමුත්, සෘජුවම පාර්ලිමේන්තුවෙන් එවැනි කටයුතු කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මගින් වෙන්කර ඇති බලතල බෙදීමට පවා පටහැනි බවයි.

කෝප් කමිටුවේ සැසිවාරවලදී රාජ්‍ය නිලධාරීන්ට සලකන ආකාරය පිළිබඳව ද ආචාර්ය හේරත් මහතා සිය කනස්සල්ල පළ කර සිටියේය. වත්මන් ක්‍රියාවලිය මාධ්‍ය ඔස්සේ විකාශනය කිරීමේදී නිලධාරීන් ප්‍රසිද්ධියේ සමච්චලයට ලක්වීමෙන් රාජ්‍ය සේවය කෙරෙහි මහජන විශ්වාසයට හානි විය හැකි බව ඔහු අවධාරණය කළේය.

"වත්මන් රජය බලයට එමට පෙර සියලුම දේශපාලනඥයන් දූෂිත බවට වූ මතයක් ජනතාව අතර ජනප්‍රිය කළා. දැන් එම තත්ත්වයම රාජ්‍ය නිලධාරීන් දක්වාද ව්‍යාප්ත වෙමින් පවතිනවා. මෙය නිලධාරීන් අතර බියක් ඇති කර තිබෙනවා." යැයි ඒ මහතා සඳහන් කළේය. මෙම තත්ත්වය තුළ නිලධාරීන් රටේ සංවර්ධන කටයුතුවලට දායක වීම වෙනුවට රජයේ දෛනික රාජකාරි කටයුතු පවත්වා ගැනීමට පමණක් සීමා වන බවත්, එය රට 'පාලනය කළ නොහැකි තත්ත්වයක්' කරා තල්ලු කිරීමේ අවදානමක් ඇති කරන බවත් ආචාර්ය චරිත හේරත් මහතා සිය අදහස් දැක්වීමේදී අවධාරණය කළේය.

"අධීක්ෂණය සහ වගවීම අත්‍යවශ්‍ය වුවද, රාජ්‍ය සේවයේ මනෝභාවය සහ ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීමද ඒ හා සමානව වැදගත් වෙනවා" යනුවෙන් ඔහු වැඩිදුරටත් පෙන්වාදුන් අතර කෝප් කමිටුවට එහි ව්‍යවස්ථාපිත භූමිකාව තුළ රැඳී සිටීම මගින් පමණක්, සැබෑ පාර්ලිමේන්තු අධීක්ෂණය තහවුරු කළ හැකි බව ආචාර්ය චරිත හේරත් මහතාගේ අවධාරණය වේ.

සාකච්ඡා කර සකස් කළේ
චමින්ද සිල්වා

දැන්වීමයි

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංකු පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි.

ඩීඑෆ්සීසී බැංකු පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දක්වෙන යෝජනාව **2025 අගෝස්තු මස 27** වන දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

ඩීඑෆ්සීසී බැංකු පීඑල්සී හමට ප්‍රසිද්ධ නොතාරිස් ටී.එච්.ඩී.එල්.එල්. ජයසේකර විසින් ලියා සහතික කරන ලද 2015.11.20 දිනැති **අංක 2253, 2255, 2257 සහ 2258**, ප්‍රසිද්ධ නොතාරිස් ඩී.කේ.පී.එන්. වාසනා විසින් ලියා සහතික කරන ලද 2019.05.10 දිනැති **අංක 981 සහ 983** සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී.කේ.පී.එන්. වාසනා විසින් ලියා සහතික කරන ලද 2022.01.27 දිනැති **අංක 1288** දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, සිය ලියාපදිංචි කාර්යාලය කොළඹ 09, ඵලියස් පෙදෙස, අංක 21 දරන ස්ථානයේ පවත්වාගෙන යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද, **තරංගනී ගාමන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්** යනුවෙන් කලින් හඳුන්වන ලද අංක PV12679 දරන **ඇනෙස්ටා ක්ලෝතිං (ප්‍රයිවෙට්) ලිමිටඩ්** (මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින්ද,

2024 දෙසැම්බර් මස 31 වන දිනට එකී **තරංගනී ගාමන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්** යනුවෙන් කලින් හඳුන්වන ලද **ඇනෙස්ටා ක්ලෝතිං (ප්‍රයිවෙට්) ලිමිටඩ්** වෙතින් ඩීඑෆ්සීසී බැංකු පීඑල්සී වෙත ඉහත කී **අංක 2253, 2255, 2257, 2258, 981, 983 සහ 1288** දරන උකස් බැඳුම්කරයන් මත **රුපියල් පනස් පස් මිලියන හය ලක්ෂ පන් දහස් හාරසිය හතළිස් නවයයි ශත පහළොවක (රු. 55,605,449/15)** මුදලක් ද, **ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් එකොළොස් ලක්ෂ හැත්තෑ හතර දහස් දෙසිය හතළිස් හතයි ශත හතළිහක (ඇඑජඩො. 1,174,247/40)** මුදලක් ද, 2025 ජනවාරි මස 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා **රුපියල් විසි මිලියන විසි හය දහස් පන්සිය අනූ හතයි ශත හැත්තෑ දෙකක (රු. 20,026,597/72)** මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR SPOT) ඉහළින් **වර්ෂයකට සියයට හයයි දශම දෙකයි පහක් (6.25%)** බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද **රුපියල් තිස් එක් මිලියන හත් ලක්ෂ විසි හය දහස් දෙසිය හැත්තෑ හතයි ශත අසූවක (රු.31,726,277.80)** මුදල මත **වර්ෂයකට සියයට තිස් හයක්** (36%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, **ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් නව ලක්ෂ තිස් තුන් දහස් හත්සිය අනූ අටයි ශත අසූ හතරක (ඇඑජඩො. 933,798/84)ක** මුදල මත රිෆයිනිටි (Refinity) මත ප්‍රකාශයට පත් කරනු ලබන අනුපාතයන්හි සඳහන් පරිදි අදාළ කරගත හැකි ත්‍රෛමාසිකව එනම් සෑම වර්ෂයකම ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන LIBOR අනුපාතයට ඉහළින් සියයට අටක් (ත්‍රෛමාසික ලිබර් 8%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, **ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් එක් ලක්ෂ දහ හත් දහස් හත්සිය දහ හතරයි ශත හතළිස් අටක (ඇඑජඩො. 117,714/48)** මුදල මත වර්ෂයකට සියයට දහ අටක් (18%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද

තවද **2024** නොවැම්බර් මස 30 වන දිනට එකී **තරංගනී ගාමන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්** යනුවෙන් කලින් හඳුන්වන ලද **ඇනෙස්ටා ක්ලෝතිං (ප්‍රයිවෙට්) ලිමිටඩ්** වෙතින් ඩීඑෆ්සීසී බැංකු පීඑල්සී වෙත **ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දෙලක්ෂ දොළොස් දහස් හයසිය අසූ දෙකයි ශත අසූවක (ඇඑජඩො. 212,682/80)** මුදලක් ද, 2024 දෙසැම්බර් මස 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා **ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් එක් ලක්ෂ විසි හය දහස් අටසිය පනස් හයයි ශත අසූ හතක (ඇඑජඩො. 126,856/87)** ක මුදල මත රිෆයිනිටි (Refinity) මත ප්‍රසිද්ධ කළ අනුපාතයේ සඳහන් නියමයන් පරිදි අදාළ කරගනු ලබන, සෑම වර්ෂයකම ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සුරක්ෂිත එක්දින මූල්‍ය අනුපාතිකය (SOFR-Security Overnight Financing Rate) ට ඉහළින් **වර්ෂයකට සියයට අටක් (8%)** බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තවද, එකී මුදල වන **රුපියල් පනස් පස් මිලියන හය ලක්ෂ පන් දහස් හාරසිය හතළිස් නවයයි ශත පහළොවක (රු. 55,605,449/15)** මුදලක් ද, **ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් එකොළොස් ලක්ෂ හැත්තෑ හතර දහස් දෙසිය හතළිස් හතයි ශත හතළිහක (ඇඑජඩො. 1,174,247/40)** මුදලක් ද, 2025 ජනවාරි මස 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා **රුපියල් විසි මිලියන විසි හය දහස් පන්සිය අනූ හතයි ශත හැත්තෑ දෙකක (රු. 20,026,597/72)** මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකයට (AWPR SPOT) ඉහළින් **වර්ෂයකට සියයට හයයි දශම දෙකයි පහක් (6.25%)** බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, **රුපියල් තිස් එක් මිලියන හත් ලක්ෂ විසි හය දහස් දෙසිය හැත්තෑ හතයි ශත අසූවක (රු. 31,726,277/80)** මුදල මත වර්ෂයකට සියයට තිස් හයක් (36%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, **ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් නව ලක්ෂ තිස් තුන් දහස් හත්සිය අනූ අටයි ශත අසූ හතරක (ඇඑජඩො. 933,798/84)** ක මුදල මත රිෆයිනිටි (Refinity) මත ප්‍රකාශයට පත් කරනු ලබන අනුපාතයන්හි සඳහන් පරිදි අදාළ කරගත හැකි ත්‍රෛමාසිකව එනම් සෑම වර්ෂයකම ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන LIBOR අනුපාතයට ඉහළින් සියයට අටක් (ත්‍රෛමාසික ලිබර් 8%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, **ඇමෙරිකානු එක්සත් ජනපද, ඩොලර් එක් ලක්ෂ දහ හත් දහස් හත්සිය දහ හතරයි ශත හතළිස් අටක (ඇඑජඩො. 117,714/48)** මුදල මත වර්ෂයකට සියයට දහ අටක් (18%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලියද, සහ **ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දෙලක්ෂ දොළොස් දහස් හයසිය අසූ දෙකයි ශත අසූවක (ඇඑජඩො. 212,682/80)** මුදලක් ද, 2024 දෙසැම්බර් මස 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා **ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් එක් ලක්ෂ විසි හය දහස් අටසිය පනස් හයයි ශත අසූ හතක (ඇඑජඩො. 126,856/87)ක** මුදල මත රිෆයිනිටි (Refinity) මත ප්‍රසිද්ධ කළ අනුපාතයේ සඳහන් නියමයන් පරිදි අදාළ කරගනු ලබන, සෑම වර්ෂයකම ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සුරක්ෂිත එක්දින මූල්‍ය අනුපාතිකය (SOFR-Security Overnight Financing Rate) ට ඉහළින් වර්ෂයකට සියයට අටක් (8%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැංකු පීඑල්සී විසින් වැය කර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අය කිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2253, 2255, 2257, 2258, 981, 983 සහ 1288 දරන උකස් බැඳුම්කරයන් මගින් **තරංගනී ගාමන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්** යනුවෙන් කලින් හඳුන්වන ලද **ඇනෙස්ටා ක්ලෝතිං (ප්‍රයිවෙට්) ලිමිටඩ්** විසින් ඩීඑෆ්සීසී බැංකු පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම, ගොඩනැගිලි සහ යන්ත්‍ර බලයලත්, **වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න** ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැංකු පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

අංක 2253, 2255, 981, 983 සහ 1288 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ පෑලියගොඩ නගර සභා බලසීමාව තුළ පෑලියගොඩ පිහිටි මීගමු පාර වරිපනම් අංක 386 සහ 387 (කොටසක්) දරන **දිවුල්ගහවත්ත** යනුවෙන් ද හඳුන්වන **අඹගහවත්ත** නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1964 පෙබරවාරි මස 05 දිනැති අංක 2829 දරන පිඹුරේ දක්වෙන ලොට් A1, A2, A3, සහ A4 යන ඉඩම්වල ඒකාබද්ධ කිරීමක උප බෙදීමක් වන) බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු සෝමරත්න වික්‍රමසිංහ විසින් සාදන ලද 1984 මාර්තු මස 10 දිනැති අංක 1265 දරන පිඹුරේ දක්වෙන ලොට් 4 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට **මායිම් උතුරට:** පාර ද, **නැගෙනහිරට:** ලොට් 3ද **දකුණට:** ලොට් 5ද සහ **බස්නාහිරට:** මීගමුව පාර වරිපනම් අංක 376 ද වශයෙන් මායිම් වූ එකී අංක 1265 දරන පිඹුර ප්‍රකාරව **ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම තුනක් (අ0රූ0පර්12.3)** ක් විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ පෑලියගොඩ නගර සභා බලසීමාව තුළ පෑලියගොඩ පිහිටි මීගමු පාර වරිපනම් අංක 386 සහ 387 (කොටසක්) වන **දිවුල්ගහවත්ත** යනුවෙන් ද හඳුන්වන **අඹගහවත්ත** නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1964 පෙබරවාරි මස 05 දිනැති අංක 2829 දරන පිඹුරේ දක්වෙන ලොට් A1, A2, A3, සහ A4 යන ඉඩම්වල ඒකාබද්ධ කිරීමක උප බෙදීමක් වන) බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු සෝමරත්න වික්‍රමසිංහ විසින් සාදන ලද 1984 මාර්තු මස 10 දිනැති අංක 1265 දරන පිඹුරේ දක්වෙන **ලොට් 5** වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට **මායිම් උතුරට:** ලොට් 3 සහ ලොට් 4 ද, **නැගෙනහිරට:** රජයේ ඉඩම සහ මීගමුව පාර ද **දකුණට:** ලොට් 6 ද සහ **බස්නාහිරට:** ගංගාරාමය විහාරය ද වශයෙන් මායිම් වූ එකී අංක 1265 දරන පිඹුර ප්‍රකාරව **ප්‍රමාණයෙන් පර්චස් විසි හතක් (අ0 රූ0පර් 27)** ක් විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඉහත ඉඩම් පහත විස්තර කරන ඉඩම්වලට අනන්‍ය වේ.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ පෑලියගොඩ නගර සභා බලසීමාව තුළ පෑලියගොඩ පිහිටි මීගමු පාර **දිවුල්ගහවත්ත** යනුවෙන් ද හඳුන්වන **අඹගහවත්ත** නමැති ඉඩමට (ඉහත කී අංක 1265 දරන පිඹුරේ දක්වෙන ලොට් 4හි නැවත මැනීමක් වන), බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු එම්.ඩී.ජේ.වී. පෙරේරා විසින් සාදන ලද 1996 සැප්තැම්බර් මස 19 දිනැති අංක 15140 දරන පිඹුරේ දක්වෙන ලොට් B වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට **මායිම් උතුරට:** පාර ද, **නැගෙනහිරට:** ලොට් Aද **දකුණට:** ලොට් Cද සහ **බස්නාහිරට:** මීගමුව පාර වරිපනම් අංක 307/17 ද වශයෙන් මායිම් වූ එකී අංක 15140 දරන පිඹුර ප්‍රකාරව **ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම තුනක් (අ0රූ0පර්12.3)** ක් විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ පෑලියගොඩ නගර සභා බලසීමාව තුළ පෑලියගොඩ පිහිටි මීගමු පාර **දිවුල්ගහවත්ත** යනුවෙන් ද හඳුන්වන **අඹගහවත්ත** නමැති ඉඩමට (ඉහත කී අංක 1265 දරන පිඹුරේ දක්වෙන ලොට් 5හි නැවත මැනීමක් වන), බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු එම්.ඩී.ජේ.වී. පෙරේරා විසින් සාදන ලද 1996 සැප්තැම්බර් මස 19 දිනැති අංක 15140 දරන පිඹුරේ දක්වෙන ලොට් C වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට **මායිම් උතුරට:** ලොට් B සහ ලොට් A ද, **නැගෙනහිරට:** මහ පාර (High Way) ද **දකුණට:** ලොට් 6ද සහ **බස්නාහිරට:** ගංගාරාමය විහාරය සහ මීගමුව පාර වරිපනම් අංක 307/18 දරන පරිශ්‍ර වශයෙන් මායිම් වූ එකී අංක 15140 දරන පිඹුර ප්‍රකාරව **ප්‍රමාණයෙන් පර්චස් විසි හතක් (අ0රූ0පර් 27)** ක් විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. බලයලත් මිනින්දෝරු එම්.ඩී.ජේ.වී. පෙරේරා විසින් සාදන ලද 1996 සැප්තැම්බර් මස 19 දිනැති **අංක 15140** දරන පිඹුරේ දක්වෙන එකී ලොට් B සහ ලොට් C ඒකාබද්ධ කොට නැවත මනින ලදුව දැන් පහත පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ දකුණ රාගම් පත්තුවේ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පෑලියගොඩ නගර සභා බලසීමාව තුළ කොට්ඨාස අංක 2හි පෑලියගොඩ ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු එම්.ඩී.ජේ.වී. පෙරේරා විසින් සාදන ලද 1996 සැප්තැම්බර් මස 19 දිනැති **අංක 15140** දරන පිඹුරේ දක්වෙන ලොට් B සහ ලොට් C ඒකාබද්ධ කොට පවත්නා මායිම්වල නැවත මැනීමක් වන වර්තමානයේ මීගමු පාර වරිපනම් අංක 307 දරන දිවුල්ගහවත්ත යනුවෙන් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ.එම්. සාරද හේවාමානගේ විසින් සාදන ලද 2015 අගෝස්තු මස 09 දිනැති **අංක 1873** දරන පිඹුරේ දක්වෙන ලොට් X වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට **මායිම් උතුරට:** පාර සහ තරංගනී ගාමන්ට් පරිශ්‍රය (එම ඉඩමේ ලොට් A)ද, **නැගෙනහිරට:** තරංගනී ගාමන්ට් පරිශ්‍රය (එම ඉඩමේ ලොට් A) සහ මීගමුව පාර ද **දකුණට:** බලයලත් මිනින්දෝරු සෝමරත්න වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 1265 දරන පිඹුරේ දක්වෙන ලොට් 6 ද සහ **බස්නාහිරට:** පෑලියගොඩ ගංගාරාමය විහාර පරිශ්‍රය සහ සිරිමාන්නගේ ඉඩම ද වශයෙන් මායිම් වූ **ප්‍රමාණයෙන් පර්චස් තිස් නවයයි දශම තුනක් (අ0රූ0පර්39.3)ක් හෝ හෙ. 0.09940** විශාල ඉඩම එහි පිහිටි සියලු දේ ද සමග වේ.

අංක 2257 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

චංචල පිරියත යන්ත්‍ර සහ උපකරණ ඇතුළත්ව සම්පූර්ණයෙන්ම -

1.	තනි ඉඳිකටු මැෂින්ස් පැරණි	250	(Single Needle Machines Old 250 Nos.)
2.	ඕවර්ලොක් මැෂින් 4/5 නූල්	21	(Over lock machine 4/5 thread 21Nos)
3.	බොත්තම් කාස මැෂින්	03	(Button Hole machine 3 Nos.)
4.	බොත්තම් ඇලුණුම්	03	(Button attached 3 Nos.)
5.	බා ට්‍රැක් මැෂින්	01	(Bar track machine 1No.)
6.	බ්ලයින්ඩ් හෙම් මැෂින්	02	(Blind Hem machine 2 Nos.)
7.	ඉඳිකටු දෙක	06	(Double needle 6 Nos.)
8.	ෆ්ලැට් ලොක් ෆෝල්ඩර්	13	(Flat lock folder 13 Nos.)
9.	ෆ්ලැට් ලොක් හෙම් කටර්	02	(Flack lock hem cutter 2 Nos.)
10.	කන්සායි මැෂින්	03	(Kansai machine 3 Nos.)
11.	චේන් ඩබල් නීඩ්ල්	01	(Chain double needle 1 No.)
12.	ෆ්ලැට් ලොක් සිලින්ඩර් බෙඩ්	01	(Flat lock silinder bed 1 No.)
13.	ස්නැප් බටන් මැෂින්	02	(Snap button machine 2 Nos.)
14.	අලිස් 30 ප්ලොටර් මැෂින්		(Alys 30 plotter machine)
15.	ෆියුසිං මැෂින්	02	(Fushing machine 2 Nos.)
16.	බ්‍රෑන්ඩ් නයිෆ් මැෂින්		(Brand knife machine)
17.	ඩීසල් බොයිලර්	03	(Diesel boiler 3 Nos.)
18.	ජෙනරේටර්		(Generator)
19.	නිව් සිංගල් නීඩ්ල්	32	(New single needle 32 Nos.)
20.	නිව් ඕවර්ලොක් 4 ත්‍රෙඩ්ස්	10	(New over lock 4 threads 10 Nos.)
21.	නිව් ඕවර්ලොක් 5 ත්‍රෙඩ්ස්	10	(New over lock 5 threads 10 Nos.)
22.	නිව් ඕවර්ලොක් 6 ත්‍රෙඩ්ස්	20	(New over lock 6 threads 20 Nos.)

සහ අමතර කොටස් උපාංග සහ උපකරණ ද ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇලහැර, බකමූණ, අංක දරන පරිශ්‍රයේ දැනට තමා තිබෙන, යම් අවස්ථාවක හා කලින් කල ගබඩා කර හෝ තමා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක් තුළ හෝ මත දැනට තිබෙන වෙනත් සියලු චංචල පිරියත යන්ත්‍රෝපකරණ, කලින් කල හා සෑමකල්හිම ගබඩා කර තබනු ලැබිය හැකි පරිශ්‍රයක තිබෙන සෑම ආකාරයකම හා සියලු විස්තරවලට අයත්වන සමාගමේ වෙනත් සියලු චංචල පිරියත යන්ත්‍ර උපකරණ සහ උපාංග සහ සෑම කල්හිම වරින් වර එකී පරිශ්‍රයට ගෙන එනු ලැබිය හැකි හෝ ඒ පරිශ්‍රයක තමා තිබිය යුතු හා තිබිය හැකි වෙනත් සියලු චංචල දේපළ සහ සමාගම විසින් මින් මතු යම් අවස්ථාවක සහ වරින් වර එහි ව්‍යාපාරය හෝ කර්මාන්තය හෝ ගබඩාවට ගෙනයනු ලැබිය හැකි, ව්‍යාපාර ස්ථානවලට හෝ ව්‍යාපාර ස්ථානයකට හෝ ගෙන එනු ලැබිය හැකි, එකී ව්‍යාපාර චංචල පිරියත යන්ත්‍රෝපකරණ අමතර කොටස් සහ උපාංග ද සමග වේ.

අංක 2258 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

2015 නොවැම්බර් මස 20 වන දිනට තොග වෙළෙඳ භාණ්ඩ අමුද්‍රව්‍ය කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ සහ නොනිමි භාණ්ඩ ඇතුළත්ව සම්පූර්ණයෙන්ම -

නිමි භාණ්ඩ කෑබලි 175600 - මුලු වටිනාකම ඇඑජඩො 422,658/-
(FINISHED GOODS - 175600 Pieces total value USD 422,658.00)
කෙරීගෙන යන වැඩ කෑබලි 68750 - මුලු වටිනාකම ඇඑජඩො 275,000/-
(WORKING IN PROGRESS - 68750 pieces total value USD 275,000.00)
හැන්ගර් කෑබලි 112500 - මුලු වටිනාකම ඇඑජඩො 25,875/-
(HANGER - 112500 pieces total value USD 25,875.00)
ෆැබ්‍රික් යාර 76100 - මුලු වටිනාකම ඇඑජඩො 125,670/-
(FABRIC - 76100 Yards total value USD 125,670.00)
උපාංග - වටිනාකම ඇඑජඩො 31,090/-
(ACCESSORIES - to the value of USD 31,090.00)

සහ අනෙකුත් සියලුම අයිතමයන් සහ කවරාකාරයේ වුවද සෑම විස්තර සහ භාණ්ඩයකටම අයත් චංචල දේපළ, ශ්‍රී ලංකා ජනරජයේ උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොළොන්නරුව, ඇලහැර, බකමූණ, **තරංගනී ගාමන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්** පරිශ්‍රයෙහි දැනට තමා තිබෙන සහ සෑම ආකාරයකම වෙනත් චංචල දේපළ සහ කවරාකාරයේ වුවද විස්තර කර ඇති සහ ගබඩා කර ඇති සහ යම් අවස්ථාවක හා කලින් කල ගබඩා කර හෝ තමා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක් තුළ තමා තිබෙන යම් අවස්ථාවක හා කලින් කල ගබඩා කර හෝ තමා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක් තුළ හෝ මත දැනට තිබෙන බන්ධනදායිගේ තොග වෙළෙඳ භාණ්ඩ අමුද්‍රව්‍ය කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ නොනිමි භාණ්ඩ සහ අනෙකුත් සියලු අයිතමයන් සහ වෙනත් චංචල දේපළ, සහ අනෙකුත් සියලුම අයිතමයන් සහ කවරාකාරයේ හෝ ස්වභාවයේ වුවද වෙනත් චංචල දේපළ කලින් කල හා සෑමකල්හිම ගබඩා කර තබනු ලැබිය හැකි පරිශ්‍රයක තිබෙන සෑම ආකාරයකම හා සියලු විස්තරවලට අයත්වන තොග වෙළෙඳ භාණ්ඩ අමුද්‍රව්‍ය කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ සහ නොනිමි භාණ්ඩ සහ චංචල දේපළ, සහ අනෙකුත් සියලුම අයිතමයන් සහ කවරාකාරයේ හෝ ස්වභාවයේ වුවද වෙනත් චංචල දේපළ සහ මින්මතු මෙම ලියවිල්ල බලාත්මකව පවත්නා කාල ඇතුළත සහ සෑම කල්හිම වරින් වර එකී පරිශ්‍රයට ගෙන එනු ලැබිය හැකි හෝ ඒ පරිශ්‍රයක තමා තිබිය යුතු හා තිබිය හැකි තොග වෙළෙඳ භාණ්ඩ අමුද්‍රව්‍ය කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ සහ නොනිමි භාණ්ඩ සහ චංචල දේපළ සහ අනෙකුත් සියලුම අයිතමයන් සහ කවරාකාරයේ හෝ ස්වභාවයේ වුවද වෙනත් චංචල දේපළ සහ මින් මතු යම් අවස්ථාවක සහ වරින් වර එහි ව්‍යාපාරය හෝ කර්මාන්තය හෝ ගබඩාවට ගෙනයනු ලැබිය හැකි, සහ නැවගත කිරීමේ අපේක්ෂාවෙන් හෝ වාප්පුවේදී හෝ ගබඩාවේදී නිශ්කාෂණය කිරීමේ අපේක්ෂාවෙන් එකී ජනරජයේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ව්‍යාපාර ස්ථානවලට හෝ ව්‍යාපාර ස්ථානයකට හෝ ගෙන එනු ලැබිය හැකි, එකී තොග වෙළෙඳ භාණ්ඩ අමුද්‍රව්‍ය කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ සහ නොනිමි භාණ්ඩ සහ චංචල දේපළ, සහ අනෙකුත් සියලුම අයිතමයන් සහ කවරාකාරයේ හෝ ස්වභාවයේ වුවද වෙනත් චංචල දේපළ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැංකු පීඑල්සී.

☎ 0112 350000 www.dfcc.lk
ෆිච් ශ්‍රේණිය A (lka)
මහ බැංකු අධීක්ෂණය යටතේ පවතින බලපත්‍රලාභී වාණිජ බැංකුවකි

DFCC බැංකුව
ඔබේ වර්ධනයට

නීරු පුත්ත තෙරුප්පු විශේෂ දැක්ම දා

දේවින්ද කෝන්ගහගේ අධ්‍යක්ෂණය කරන ලද " නීරු පුත්ත තෙරුප්පු " අළු යට ගිනි Fire Beneath Ash චිත්‍රපටයේ විශේෂ දැක්මක් පසුගිය දා (2025 ඔක්තෝබර් 15) ජාතික චිත්‍රපට සංස්ථා තරංගනී සිනමාශාලාවේ දී පැවැත්වුණා. මෙම අවස්ථාවට "නීරු පුත්ත තෙරුප්පු" චිත්‍රපටයේ ප්‍රධාන චරිතය රඟපාන ඉන්දීය ජනප්‍රිය රංගන ශිල්පී බොස් වෙනකට් සහ සිනමාවට හඳුන්වා දෙන ඔහුගේ පුත් තේජූ වෙනකට් සහභාගී වුණා. ඊට අමතරව ජ්‍යෙෂ්ඨ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක, චන්ද්‍රන් රත්නම් සහ දේශපාලනඥයින්, කලාකරුවන්, මාධ්‍යවේදීන් සහ හිතවතුන් ඇතුළු පිරිසක් එක්ව සිටියා.

මනමාල කුරුල්ලෝ මහරදී...

කීර්ති බණ්ඩාරයන්ගේ 55 වැනි වේදිකා නිර්මාණය මනමාල කුරුල්ලෝ මිළඟ දර්ශනය ඔක්තෝබර් 26 වැනිදා පස්වරු 3.30 ට සහ 6.30 ට මහර කැලණිය සංස්කෘතික මධ්‍යස්ථානයේදී වේදිකාගත කෙරේ. මෙහි කීර්ති බණ්ඩාර සමග අරවින්ද පෙරේරා, ඩැල්ටන් ශාශා, මල්ෂිකා හෙට්ටිආරච්චි, අනුර වීරසිංහ, ගාමිණී කොස්තා රඟපාති. නර්තන පුහුණුව අරවින්ද පෙරේරා ගෙනි. අංග රචනය ගාමිණී කොස්තාද, විදුලි ආලෝකය සුනිල් සමරකෝන්ද වේදිකා පරිපාලනය නලින් මධුරප්පෙරුම සහ රේණුකා වැලිගොඩගේ විසිනි.

'මං ආදරෙයි' 27 වැනිදා සිට

දශකාර යොවුන් වියේ හිතුවක්කාර හැඟීම් සුන්දරත්වයත්, හිරිමල් කැකුළු ප්‍රේමයත් කැටිකර ගත් ත්‍රිකෝණගත ආදර අන්දරයක් රැගෙන තාරුණ්‍යය අමතන 'මං ආදරෙයි' ටෙලි නාට්‍යය ඔක්තෝබර් 27 වැනි සඳුදා සිට ටීවී දෙරණ තුළින් රාත්‍රී 9.30 ට සතියේ දිනයන් හි විකාශනය වීමට නියමිතව ඇත. හර්ෂ උඩකන්ද අධ්‍යක්ෂණය කරනු ලබන මෙහි සාවින්දි සෙනායා, උත්පලා පීරිස්, දේශිත පීරිස්, සඳනි වක්කුඹුර, තුසිත එස්. බණ්ඩාර, පබුදු කවීෂා, දෙවමි පෙරේරා, චනදීප වීරසිංහ, කවිඳු යසස්, කිවාන් ෂයිමිනු රාජපක්ෂ, ශශිකා මධුෂානි, සංකල්ප පෙරේරා වැනි යෞවන යෞවනියන් රැසක් පුංචි තිරයට හඳුන්වා දෙනු ලබන අතර, මහේන්ද්‍ර වීරරත්න, අශිකා මතසිංහ, ලාල් වීරසිංහ, එස්.අයි. සමරක්කොඩි, නිරංජලා ජයසිංහ, පැතුම් රුක්ෂාන්, අනුරාධා උදයංගනී, නිර්මලා නිශාන්ති, තිළිණි පෙරේරා, කුමුදිනී අධිකාරි, ඇතුළු රංගන ශිල්පීන් රැසක් 'මං ආදරෙයි' වෙනුවෙන් එක් වී ඇත. හර්ෂ උඩකන්ද සමගින් අහිංසා නිල්මිණි එක්ව තිර රචනය ලියා ඇත.

සුද්දෙක් ඔබ අමතයි 02 වැනිදා බොරැල්ලේදී...

උදයසිරි වික්‍රමරත්න ජාතික වේදිකාවට ගෙන එන 'සුද්දෙක් ඔබ අමතයි' නොවැම්බර් මස 02 වැනිද සවස 3.30 ට සහ 6.45 ට බොරැල්ල නාමෙල් මාලනී පුංචි තියටර්හිදී වේදිකාගත කෙරේ.

සෙල්ලං ද කොල්ලෝ බොරැල්ලේදී...

හේමන්ත ප්‍රසාද්ගේ සෙල්ලං ද කොල්ලෝ වේදිකා නිර්මාණය නොවැම්බර් මස 08 වැනිද සවස 3.30 ට සහ 6.45 ට බොරැල්ල නාමෙල් මාලනී පුංචි තියටර්හිදී වේදිකාගත කිරීමට නියමිතය.

කෝලම්කාරයෝ නොවැම්බර් 21 වැනිදා

සරත් දික්කුඹුර අධ්‍යක්ෂණය කරන ලද ඉතාලියේ රෝම නගරයේ සුදත් රෝහණ නිෂ්පාදනය කළ ලංකාවේ ප්‍රථම ඩිජිටල් තාක්ෂණය මත දිගහැරෙන වේදිකා නාට්‍ය කෝලම්කාරයෝ නොවැම්බර් මස 21 වැනිද සවස 6.30 ට නවලෝක රෝහල් ශ්‍රවණාගාරයේදී වේදිකාගත වේ.

රොම්බ තෑන්ක්ස් මහරගම දී

රාජ්‍ය සම්මාන, යෞවන සම්මාන දිනූ නාට්‍යවේදී සජීව මල්මාලආරච්චිගේ නවතම හාස්‍ය වේදිකා නාට්‍ය නිර්මාණයක් වන 'රොම්බ තැන්ක්ස්' ලබන 26 වැනිදා සවස 3.30ට සහ 6.30ට මහරගම මධ්‍ය මහා විද්‍යාලයීය රංග ශාලාවේදී වේදිකාගත වේ.

'රැයක් හෝ පැයක්' 30 වැනි දා එනවා...

'90 රංගන

දශකයේදී තිරයට පිවිසි ප්‍රවීණ ශිල්පී ලාල් වීරසිංහ විසින් අධ්‍යක්ෂණය කළ 'රැයක් හෝ පැයක්' චිත්‍රපටය ඔක්තෝබර් 30 වැනිදා සිට එම්.පී.අයි. ප්‍රදර්ශන මණ්ඩලයේ බෙදා හැරීමක් ලෙසින් දිවයින පුරා තිරගත වීමට නියමිතව ඇත. ඉවසීමේ සීමාව ඉක්මවා අධික මානසික පීඩනයට ලක්වූ කළ, දාරක සෙනෙහස වෙනුවෙන් කාන්තාවකට කළ නොහැකි දෙයක් නොමැත. නොසික්මුණු සමාජයක වෙසෙන සෑම කාන්තාවක් විසින්ම නොවරදවා නැරඹිය යුතුම ආදර්ශවත් කතා තේමාවක් මත නිර්මිතව, ඉන්දු ලංකා හවුල් නිෂ්පාදනයක් ලෙසින් තිරයට පිවිසෙන 'රැයක් හෝ පැයක්' චන්න පෙරේරා, ලාල් වීරසිංහ, දිල්රුක්ෂි වීරප්පෙරුම, කුමාර ජයකාන්ත, රජිත හිරාන්, නොෂින් ද සිල්වා සමගින් රුළා, සන්ජනා නයිඩු, යෝගිරාම් ඇතුළු ඉන්දියානු රංගන ශිල්පීන් රැසක් රංගනයෙන් දායක වී ඇත. ආර්. කුලන්දායි යේසු කතාව සහ තිර රචනය ලියා ඇති අතර කැමරා අධ්‍යක්ෂණයෙන් කංගයියා මාඩසාමි, කලා අධ්‍යක්ෂණයෙන් එම් . සෙල්වරාජ් සමගින් නාලක කුරුප්පුආරච්චි, සටන් අධ්‍යක්ෂණයෙන් ෂෙන් අර්යන් සහ එස්.ආර්. මුරුගන්, සහාය අධ්‍යක්ෂණයෙන් චාමර බලත්ගොඩ, සාධුනි ජයපත්මා පුබුමිණි, ගීත ගායනයෙන් නොයෙල් රාජ් පීරිස්, චම්පා කල්හාරි, දිනුෂ නානායක්කාර, ශෂිකා මධුෂානි ද, ගීත රචනයෙන් සුනිල් ධර්මසිරි සමගින් හර්ෂ උඩකන්ද, පසුබිම් සංගීත අධ්‍යක්ෂණයෙන් සජිත් ඇන්ඩසන් සහ සම්පත් ප්‍රනාන්දු, විධායක නිෂ්පාදනයෙන් මංජුලා ද සිල්වා සමගින් නිශාන්ත ප්‍රදීප් එක්ව ඇති 'රැයක් හෝ පැයක්' ධනුෂ් ප්‍රේමරත්නගේ නිෂ්පාදනයකි.

● ඇන්ටන් ජේ. ප්‍රනාන්දු

අපි ආවේ ගල් මුල් මැදින් දුෂ්කර ගමනක

ශ්‍රියන්ත මෙන්ඩිස්

අඩසියවසක රංගයාත්‍රිකයා හෙට

ශ්‍රියන්ත මෙන්ඩිස් රංගධරයාගේ රංගන දිවියට දශක පහක් සම්පූර්ණ වීම සනිටුහන් කරමින් අඩසිය වසක රංගයාත්‍රිකයා නමින් ප්‍රත්‍යාවලෝකන ප්‍රසංගයක් සහ ප්‍රකාශන එළිදැක්වීමේ උළෙලක් හෙට (25 වැනිදා) සවස 6.30ට මරදාන එල්ෆින්ස්ටන් රංග ශාලාවේදී පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

මෙහිදී ඔහුගේ චරිතාපදානය ජනගත කිරීම, වේදිකාව, රූපවාහිනිය සහ සිනමාව යන මාධ්‍ය ත්‍රිත්වයේ අඩ සියවසක රංග කුසලතා ඇතුළත් ප්‍රත්‍යාවලෝකන වාර්තා චිත්‍රපටය එළිදැක්වීම වගේම ඔහුගේ රංගන දිවියේ විශේෂ අවස්ථා අගය කරමින් නිර්මාණය කරනු ලබන නාට්‍යමය සංගීත ප්‍රසංගය වේදිකාගත කිරීම ද සිදුකෙරේ. ශ්‍රියන්ත මෙන්ඩිස් රංගධරයා සමග දිවයින සිනමා කලා මෙවර කතාබහ ඒ නිමිත්තෙනි.

අඩසියවසක රංගයාත්‍රිකයාගේ ගමන ගෙවුණේ සහ දැනුණේ කොහොමද?

ඒකේ බරපතළකම සහ කාලරාමුවේ තිබෙන දිගුව මට දැනෙන්නේ යන්තම් උත්සවයක් සංවිධානය කළාට පස්සෙයි. 1975 සිට 2025 දක්වා මේ කාලය ගත්තහම වේදිකාව, සිනමාව ටෙලිනාට්‍ය කියන මාධ්‍ය ත්‍රිත්වය ගත්තහම ඒ තුනේම මට වැඩ කරන්න අවස්ථාව ලැබිලා තියෙනවා. වැඩ කළා. ඉතිං ඒ වැඩ කරපුවාගේ මහන්සියේ ප්‍රතිඵල තමයි හෙට අපි ඒකරාශි කරන්නේ. ඒ අස්වැන්න තමයි අපි පෙළා යන්න උත්සාහ කරන්නේ.

අඩසියවසක් කියන්නේ ලේසි නැහැ මේ ගමන්මගේදී බාධක, කඩතොළු, ජයග්‍රහණවලට මොන විදිහට ද මුහුණ දුන්නේ?

මම හිතන්නේ ඒක බොහොම සුන්දර රළ පරළ අත්දැකීමක්. ඒ කියන්නේ අපි ආපු මාවත සුන්දර සුමට මල්මාවතක් නෙමෙයි. අපි ආවේ ගල් මුල් මැදින් දුෂ්කර ගමනක. නමුත් ඒක දිහා හැරිලා බලපුවහම හරිම සුන්දරයි, ඒ අත්දැකීම්. දශක පහ පුරාවට අපි [illegible] කියලා දැනෙන්න ගත්තා. එතකොට විවිධ සමාජ දේශපාලන, ආර්ථික ක්‍රියාවලි මැද්දෙන් ආවා. නිර්මාණකරණ මැද්දෙන් ආවා. ටෙලිවිෂන් ආරම්භ කරන කොට එතැන හිටිල්ලා හිටියා. සිනමාවේ කොතැන හෝ තැනකින් ඇතුළු වුණා. අපිත් එක්කම වේදිකාව තවදුරටත් පෝෂණ වෙමින් පවතිනවා. ඉතිං මේ සියලු දේ දැන කියාගන්න වසර 50ක් ඇතුළත පුළුවන් වුණා මේකේ ගමන ශ්‍රියන්ත අඩසියවසක රංගයාත්‍රිකයා ඒ කියන්නේ යාත්‍රාව තවම යනවා කොටුපාළට ඇවිල්ලා නැහැ. කවදාහරි කොටුපාළට එයි. එතකන් මේ යාත්‍රාව පදවනවා.

ඔබට පරම්පරා ගණනාවක අධ්‍යක්ෂවරු මුණගැහෙන්න ඇති නේද?

ඒක හරි අපූරුයි. දැන් මම 20 වැනි සියවසේ ඉපදිලා 21 වැනි සියවසට පා තබලා ඉන්නේ. එතකොට 20 වැනි සියවසේ අපිත් එක්ක ගනුදෙනු කරපු අධ්‍යක්ෂවරු බොහෝදෙනෙක් අද ජීවතුන් අතරත් නැහැ. ඊළඟට අපි 21 වැනි සියවසට පා තැබුවා. එතකොට වර්තමානයේ ඉන්න නවීන අධ්‍යක්ෂවරු සමගත් වැඩ කරන්න හම්බවුණා. මට මේ සියලු පරම්පරාවන් එක්ක වැඩ කරන්න ලැබුණා. මම හිතන්නේ ඒක නළුවෙක් ලබන දුර්ලභ වාසනාවක්. ඒක බොහොම අපූරුයි. නව පරම්පරාවත් එක්ක වැඩකරන කොට නව අධ්‍යක්ෂවරු අපට හම්බ වෙනවා. ඔවුන්ගේ ගෞරවය වටිනාකම මට ලැබෙනවා. ඒක නැත්තේ නැහැ. මම ඔවුන්වත් ගරු කරනවා ස්තූති කරනවා තවදුරටත් ශ්‍රියන්ත මෙන්ඩිස්ව රඳවා ගැනීම සම්බන්ධයෙන්.

මේ ගමන අතහරින්න ඕනෑ කියලා හිතුණු අවස්ථා එහෙමත් ඇතිනේ?

ඒවා ගත්තහම හරිම අඩුයි. හුඟක් වෙලාවට මා විසින් වාසනාවකුත් මිට මොළවාගෙන එන්න ඇති. මම ජන්මයෙන්ම පලබර උපයාගත් පවුලකින් ආපු කෙනෙක් නෙමෙයි. මගේ තනි කැමැත්තට තනි ගමනක් ගිය කෙනෙක්. ඒක නිසාම කලකිරීම් නැත්තේ ද නොවේ. සමහරක් තැන්වලදී එහෙම කලකිරීම්වලට භාජනය වුණා. සමහරක් තැන්වල දී ඒවා විඳදරා ගත්තා. මා වටා මහ දැවැන්ත පවුරක් වගේ ප්‍රේක්ෂකාගාර හිටියා. තවමත් මාව ඔවුන් විශ්වාස කරනවා. ආදරය කරනවා මට. මම හිතන්නේ ඒ බැම්ම නිසාම අර කලකිරීම් එච්චර ගණන් ගත්තේ නැහැ. අදටත් ඒ කිසිදෙයක් ගණන් ගන්නේ නැහැ. හැමදෙයක්ම කාලය විසින් විසඳාවි කියන ඉලක්කය මට තියෙනවා.

ඕනෑම කෙනකුට මෙතැනට එන්න පුළුවන්. හැබැයි රැඳෙන්න හරි අමාරුයි. ඔබේ ප්‍රේක්ෂකයෝ තවමත් ඔබව මෙතැනි රඳවාගෙන ඉන්නවා. ඔබේ යුගයේ අය දැන් මෙතැනින් ඈත්වෙලත් ඇති?

අනේ ඔව්. 70 දශකයේ මධ්‍යම කාර්තුවේදී තමයි මම බිහිවෙන්නේ. එතකොට අපිත් එක්ක ආපු අය හුඟදෙනෙක් අද නැහැ. අද ජීවතුන් අතරත් නැහැ. ඔවුන් ඔවුන්ගේ කාර්ය කරලා හැර දාලා ගිහිල්ලා. දැන් මම ඊයෙත් රඟපෑවා. අදත් රඟපානවා. හෙටත් රඟපානවා. පරාජිත කියන නාට්‍යය මම රඟපාන්න පටන් ගත්තේ 1980දී. දැනට අවුරුදු 46ක් මම ඒ නාට්‍යයේ රඟපාලා තියෙනවා. මම හිතන්නේ ලෝකයේ කිසිම රටක නළුවෙක් වසර 46ක් එකම චරිතය රඟපාලා නැතිව ඇති කියලා. ඒ නාට්‍යයත් එක්ක මම අවුරුදු 46ක් ගතකරලා තියෙනවා. ඒක සුවිශේෂයි. එහෙම වෙන්න හේතුව මේක දෙවියන් විසින් දුන්න තෑග්ගක් කියලයි මම හිතන්නේ.

ජයන්ත, ජැක්සන්, කමල්, ශ්‍රියන්ත කියන මිත්‍ර සමාගම බෝඩිංවල ගෙවපු ජීවිතවල සුන්දර මතක එහෙමත් තියෙනවා නේද?

අනිවාර්යයෙන්ම, මේ ගමන හරියට එන්න හේතු කාරණා වුණේ නිර්මාණ පක්ෂය තුළදී අපි ඇක්ශන් එක ඇකඩමික් කියලා තේරුම් ගත්තා. අපි ඒක මුල ඉඳලම තේරුම්ගත්ත කණ්ඩායමක්. මේක අධ්‍යාපනිකයි. මේක ඉගෙන ගත යුතුයි. මේක එහෙම ඉගෙන ගතයුතු විෂයක් කියන එක අපි අවබෝධ කරගත්තා. ඒ නිසාම 70 දශකයේ අන්තිම කාර්තුවේදී අපි රංගනය හදාරන්න පටන් ගත්තා. ඒ හැදෑරීමේ ප්‍රතිඵලයක් විදිහට මිත්‍රයෝ ගොඩක් හම්බ වුණා. ජයන්ත, කමල්, මහේන්ද්‍ර, ජැක්සන්, වසන්ත යන පිරිවර. වසන්ත සහ ජැක්සන් අපි අතර නැහැ. ඔවුනුත් මගේ 50 දශකය සමරන වෙලාවේ හිටියානම් මට ලොකු හයියක් වෙනවා. නමුත් අපි ඒ සමරණ මැද්දෙත් ගොඩ ආවා. ඒක නිසා මේ සියලු අත්දැකීම් අපිට ලැබිච්ච එකම රංගන ශිල්පියෙක් විදිහට මට මාර දැවැන්ත හයියක්. ඒ කියන්නේ 71 කැරැල්ල අපිට මතකයි. 77 නිදහස් ආර්ථික සම්ප්‍රාප්තිය මතකයි. 83 ජූලි කලබල මතකයි. 87, 88 භීෂණ සමය මතකයි. 2004 සුනාමිය මතකයි. පාස්කු ප්‍රහාරය මතකයි. අරගලය මතකයි. දේශපාලන වෙනස්වීම් ඒක මතකයි. මේ ඔක්කොම අස්සේ එන්න ලැබුණානේ.

● දිනේෂ් විතාන

ප්‍රෑන්ක් වැඩ අරඹයි...

සංදේශ් බණ්ඩාර අධ්‍යක්ෂණය කරනු ලබන ප්‍රෑන්ක් සිනමාපටයේ මුහුරත් උළෙල පසුගියදා පැවැත්විණි. මෙය හාස්‍ය සහ කුතුහලය මිශ්‍ර කතා පුවතකින් සමන්විතය. ජනප්‍රිය ටෙලිනාට්‍ය කතා රචක බුද්ධික ජේමසිංහ ප්‍රෑන්ක් සිනමා පටය තිර රචනය කොට තිබේ. රොෂාන් පිලපිටිය, අශාන් විජේසූරිය, අංජලී ජයසිංහ, ශාරද් චන්ද්‍රම, කිශූ ගෝමස්, සුහඳි වෝල්ඩ්, දෙවින්ද වික්‍රමසිංහ ඇතුළු පිරිස මෙහි රංගන දායකත්වය ලබා දෙති. ප්‍රෑන්ක් නිෂ්පාදනය ශයා ඒකනායකගෙනි. රොෂාන් ජයසුන්දර සහාය අධ්‍යක්ෂණයෙන්ද, දිනුක චමින්ද් කැමරා අධ්‍යක්ෂණයෙන් ද, කලා අධ්‍යක්ෂණයෙන් අශාන් දිනුකගෙනි ද, විශ්වනාත් විජේසූරිය අංග රචනා ශිල්පියෙන්ද, සංගීතය ධනංජය රුක්ශාන්ගෙන් ද, ඛන්ලුල නානායක්කාරවසම් ගී පද රචනයෙන් ද එක්වෙති.

සුනිල්- සංඛ- සංඛනී එක්වන සඳකඩපහණ පේරාදෙණිය, මාතර සහ කොළඹදී

ප්‍රවීණ ගීතවේදී සුනිල් එදිරිසිංහගේ 'සඳකඩපහණ' ප්‍රසංග ත්‍රිත්වයක් නොවැම්බර් 04 වැනිද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදීත්, නොවැම්බර් 09 වැනිද මාතර රුහුණ විශ්වවිද්‍යාලයීය රවීන්ද්‍රනාත් තාගෝර් ශාලාවේත්, නොවැම්බර් 15 වැනි ද කොළඹ මියුසියස් විද්‍යාල ශාලාවේදීත් පැවැත්වීමට නියමිතය.

මෙවර මේ ප්‍රසංග ත්‍රිත්වයට සුනිල්ගේ පුතු සංඛ සහ දියණිය සංඛනී ද සහභාගීවීම සංගීත රසිකයන්ගේ දිගු කාලීන ඉල්ලීමක් ඉටුකිරීමකි. ප්‍රවීණ සංගීතවේදී සුසිල් අමරසිංහ සංගීත අධ්‍යක්ෂණයෙන් දායක වන මෙම ප්‍රසංගය තරිඳු ගමගෙදර ප්‍රමුඛ TRIOLK ඉදිරිපත් කිරීමකි. ප්‍රසංග පිටපත සහ කළමනාකරණය පුෂ්කර වන්නිආරච්චි විසිනි.

බොම්බියා

ඇමතිකම් කලින්... සාමාන්‍ය පෙළ සහතිකයවත් මගේ ළඟ නෑ! හැඳුනුම් පතයි.. මුහුණින් ලකුණින් එකයි විතරයි තියෙන්නේ
හොඳ වෙලාවට P.H.D. එකක් තිබුණේ නැත්තේ... නේ!
දුවපිය යන්න!!

ඔබේ දෛවය

යක්කල වීරවංශ පතිරණ

රාහු කාලය

අද:- 10.27 සිට 11.57 දක්වා

හෙට - 08.57 සිට 10.27 දක්වා

මේෂ - ශුභාශුභ මිශ්‍රඵල දෙයි. ආගමික වතාවත්, උත්සව වැනි දේවල්හි යෙදේ. තම ඥාති මිත්‍රාදීන් දහමට යොමු කරවයි. උත්සව සාද වැනි දේවල් ද යෙදේ. තරමක් වැය ඉහළ යයි. චිරයගත රෝග, සෙම් රෝග මතු වේ. ශුභ වර්ණය - රතු, ජය අංකය - 03

වෘෂභ - ක්‍රියාශීලී දිනකි. රාජකාරි මෙන්ම අමතර ක්‍රියාකාරකම් යෙදේ. ගමන් බිමන් ද බහුල වෙයි. තම ඥාති මිත්‍රාදීන් ඒකරාශිව ක්‍රියා කරයි. ආගමික උත්සව වැනි දේවල්හි ද යෙදේ. සෙම් කෝප රෝග ද මතු කරයි. ශුභ වර්ණය - සුදු, ජය අංකය - 01

මිථුන - නව අරමුණු මත ක්‍රියා කරයි. උත්සව සාද වැනි දේ යෙදේ. අලංකාර කටයුතු සඳහා වියපැය ඉහළයි. දුරස්ථ ඥාතීන් සම්බ වෙයි. ප්‍රේම සබඳතා වර්ධනය වෙයි. අමතර ලාභ ලබයි. ස්නායු පද්ධතියේ රෝග, වාත රෝග මතු වේ. ශුභ වර්ණය - කොළ, ජය අංකය - 06

කටක - අවිවේකී දිනකි. ආගමික උත්සව හා වතාවත් වැනි දේ සඳහා යොමුවෙයි. වන්දනා ගමන් වැනි දේ, විනෝදජනක ක්‍රියා වැනි දේ යෙදේ. හදිසි ධන ලාභ ලැබීම් ඇති වෙයි. මූල රෝග, භගන්දරා වැනි දේ යෙදේ. ශුභ වර්ණය - රන්වන්, ජය අංකය - 07

සිංහ - ශුභාශුභ මිශ්‍රඵල මතු කරයි. තරමක් ආවේගශීලීව ක්‍රියාකරයි. යටපත් වූ සතුරු බලපෑම් යළි ඉස්මතු වෙයි. අලංකාර කටයුතු සඳහා වියපැය ඉහළ යයි. චිරයගත රෝගවලට හේතුයි. ශුභ වර්ණය - තැඹිලි, ජය අංකය - 01

කන්‍යා - ශුභවාදී ඵල මතු කරයි. නව නිර්මාණකරණයට ශුභයි. දුරගමන්, විදෙස් ගමන් වැනි දේවලට හේතුයි. තම ව්‍යාපාරවල තත්ත්වය පහත වැටේ. තරමක් කලකිරුණු ස්වරූපයක පෙන්වයි. ආමාශයගත රෝග සාදයි. ශුභ වර්ණය - කහ, ජය අංකය - 05

තුලා - ශුභාශුභ මිශ්‍රඵල මතුවෙයි. ප්‍රබෝධමත්ව ක්‍රියාවන්හි යෙදේ. කනතුරු ලාභ ලැබීම්වලට හේතුයි. ප්‍රේම සබඳතා වර්ධනය වෙයි. නවක මිතුදම් වර්ධනය වෙයි. සෙම් රෝගවලට හේතුයි. ශුභ වර්ණය - ක්‍රීම්, ජය අංකය - 02

වෘශ්චික - ශුභාශුභ මිශ්‍රඵල මතු කරයි. අලංකාරකරණයට වියපැය ඉහළ යයි. රැකියා ස්ථානවල චෝදනා එල්ල වෙයි. ඉවසීමෙන් ක්‍රියා කළයුතු දිනකි. හදිසි රෝගවලට හසුවෙයි. ශල්‍යකර්ම වැනි දේ යෙදේ. ශුභ වර්ණය - දුඹුරු, ජය අංකය - 04

ධනු - ශුභාශුභ ඵල දෙයි. දාන ශීලාදි ගුණධර්ම ගරු කරයි. ආගමික වතාවත් ගරු කරයි. නවක මිතුදම් ඇති වෙයි. වන්දනාගමන් ද විනෝද ගමන් ද යෙදෙන අතර වැය ඉහළ යන දිනකි. බඩ අමාරු පීඩා මතු කරයි. ශුභ වර්ණය - අළු පැහැය, ජය අංකය - 02

මකර - වන්දනාගමන්, විනෝදගමන් වැනි දේවල්වලට හේතුයි. ප්‍රීති උත්සව සාද යෙදේ. නවක මිතුදම් ඇති වෙයි. දහමට අවතීර්ණව ක්‍රියාකරයි. පවුලේ වෙනයකට හේතු කරුණු යෙදේ. සන්ධි ප්‍රදාහ රෝග මතු කරයි. ශුභ වර්ණය - රතු, ජය අංකය - 08

කුම්භ - දුරගමන්, ආගමික ගමන් යෙදේ. සමාජ සත්කාරක ක්‍රියාවන්හි ද යෙදේ. පරාර්ථකාමීව ක්‍රියා කරයි. ආගමික උත්සව, පුද පූජා කර්ම ආදියෙහි යෙදේ. හදිසි ධන ලාභ ලබයි. ශිරෝගත රෝග, උෂ්ණ රෝග මතුවේ. ශුභ වර්ණය - දම්, ජය අංකය - 05

මීන - දහමට අවතීර්ණව දවස ගෙවයි. දානමය පුණ්‍ය කර්ම, ශීල ගුණධර්මාදියෙහි යෙදෙන දිනකි. සමාජ සත්කාරක ක්‍රියාවන්හි යෙදේ. ප්‍රීති උත්සව වැනි දේවල් යෙදෙන අතර වැය ඉහළ යන දිනකි. සෙම් රෝග, උෂ්ණ රෝග මතු වේ. ශුභ වර්ණය - රෝස, ජය අංකය - 09

ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව සීමාසහිත සමාගමක නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම. 2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය 2025 ඔක්තෝබර් 17 දින වෙනස් කළ බව මෙසේ දැනුම් දෙනු ලැබේ.

පෙර සමාගම් නාමය : හලිව් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් අංකය : පීවී 87248

ලියාපදිංචි කාර්යාලය : අංක 31, ලෙයාඩ්ස් පාර, කොළඹ 5.

නව සමාගම් නාමය : හැන්ඩ්ස් ඉන්ටර්නැෂනල් ගෲප් (පීවීටී) එල්ටීඩී.

ආර් එන් එච් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලේකම්වරු

'ආර් එන් එච්. හවුස්', අංක 622 ඕ, කෝට්ටෙ පාර, කෝට්ටෙ

දිනය : 2025 ඔක්තෝබර් 23දා

තෙසයි තීන්දු ප්‍රකාශයයි

මහර දිසා අධිකරණයේදීය

බර්ණඳුරගේ මයුරි සුගන්දිකා සිල්වා

අංක 13/12, පට්ටිවිල,ගෝනවල.

නඩු අංකය - 1148/D

ස්වභාවය - දික්කසාද **පැමිණිලිකාරිය**

කාර්ය පටිපාටිය - සාමාන්‍ය **එදිරිව,**

වටිනාකම - රු. 1, 500,000/-

නාරංගොඩ ලියනගේ සදීප් රශ්මික ලියනගේ

අංක 33/B, වැඹඩ නැගෙනහිර,වැඹඩ

විත්තිකරු

මෙම නඩුව සුදුස්සක් කිරීම සඳහා 2025 ක් වූ ජූලි මස 04 වන දින මහර ගරු දිසා විනිසුරු තැන්පත් සාලිය වන්ත අභයරත්න මැතිතුමා ඉදිරිපිටට පමුණුවනු ලැබූ අවස්ථාවේදී පැමිණිලිකාරිය සහ පැමිණිලිකාරිය වෙනුවෙන් නීතිඥ ප්‍රසාද් ලියනාරච්චි මහතා පෙනී සිටියදී, විත්තිකරුට පුවත්පත් දැන්වීම මගින් සිතාසි නිකුත්කර තිබියදී සහ විත්තිකරු ගරු අධිකරණය ඉදිරියේ පෙනී නොසිටීම මත මෙම නඩුව විත්තිකරුට එරෙහිව ඒකපාර්ශ්වික විභාගයට ගෙන ඉදිරිපත් වූ පැමිණිලිකාරියගේ සාක්ෂිය අනුව පැමිණිලිකාරිය හා විත්තිකරු අතර "පෙ1" ලෙස ලකුණු කරන ලද අංක 4174 දරණ විවාහ සහතිකය මත ඇති කරගන්නා ලද විවාහ බන්දනය විත්තිකරුගේ අනුමිත ද්වේශ සහගත අතහැර යාමේ වෛවාහික වරද මත විලෝපනය කොට විසුරුවා හරිමින් පැමිණිලිකාරියගේ වාසියට දික්කසාද තීන්දුවක් ලබාදෙන ලද බවට මෙයින් අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

තවද මෙම තෙසයි තීන්දු ප්‍රකාශය නියත කිරීමෙන් පසුව පැමිණිලිකාරියට විවාහයට පෙර භාවිතා කළ නාමය භාවිතා කළ හැකි බවත්, අවිවාහක ස්ත්‍රියක සතු සියලුම අයිතිවාසිකම් හා වරප්‍රසාද හිමිවන බවටත් මෙයින් තවදුරටත් අණකර තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

තවද මෙම තෙසයි තීන්දු ප්‍රකාශය භාරදුන් දින සිට මාස 03ක කාලයක් ඇතුළත නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් නොකළ යුතු බවට ප්‍රමාණවත් හේතු නොදක්වුවහොත් එකී කාලය ඉකුත්වීමෙන් පසු මෙම තෙසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත්කරනු ලබන බවද අණකර තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

වර්ෂ 2025 ක් වූ ජූලි මස 04 වන දිනදීය.

දිසා විනිසුරු
දිසා අධිකරණය
මහර

සකස්කර ඉදිරිපත් කළේ

....

පැමිණිලිකාරියගේ ලේඛනගත නීතිඥ

Prasad Liyanaarachchi
Attorney - at - Law, Notary Public
Commissioner for Oaths
Company Secretary
No 9, Sapugaskanda, Makola
0729009059, 0112400949

ලුහුඬු දැන්වීම්

නම් සංශෝධනය

මාතලේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ E 337/ B ඩන්ගන් පෙදෙස ග්‍රාම නිලධාරි වසමේ පදිංචි රාජගුරු රාජකරුණා විජයානන්ද ගනේ බණ්ඩාරලාගේ විහාර වලව්වේ ස්ටැන්ලි බර්නාඩ් හුලංගමුව වන මා මින් ඉදිරියට, විහාර වලව්වේ ස්ටැන්ලි බර්නාඩ් හුලංගමුව යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වමි.

මාතලේ අඹන්ගඟ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේ අස්වැද්දුම ග්‍රාම නිලධාරි වසමේ පදිංචි යමානලෑ අලුත් ගෙදර උපසේන, යමානලෑ අලුත් ගෙදර ලොකුහාමි දිනුලි අසින්මා සෝමරත්න, යමානලෑ අලුත් ගෙදර ජයෝද් සචින්තන සෝමරත්න, යමානලෑ අලුත් ගෙදර සුනෙර ඉන්දිවර සෝමරත්න වන අප මින් ඉදිරියට යසමාන්න ආරච්චිලාගේ ගයාන් ප්‍රභාත් සෝමරත්න, යසමාන්න ආරච්චිලාගේ ලොකුහාමි දිනුලි සෝමරත්න, යසමාන්න ආරච්චිලාගේ ජයෝද් සචින්තන සෝමරත්න, යසමාන්න ආරච්චිලාගේ සෙහාර ඉඳුවර සෝමරත්න යනුවෙන් භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වමි.

මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 128 කිඹුලාවෙල ග්‍රාම නිලධාරි වසමේ තැරලෙ ගංගොඩ අබලන්ද, ගලබැද්ද, මොණරාගල ලිපිනයේ පදිංචි වත්තේගෙදර රම්මැණිකා වන මා මින් මතුවට රත්නායක මුදියන්සේලාගේ රන්මැණිකා ලෙස භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙමි.

සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක. 01 සහ 2011 අංක. 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

ඊ එච් අබේසිංහ

හැඳුනුම් අංකය : 0019 5003 2010

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025/07/30 වෙනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක. 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එන් ඩී බී ගමගේ විසින් ලියා සහතික කරන ලද 2016 සැප්තැම්බර් 08 දාතම හා අංක 1521 දරන, 2014 ජූලි 18 දාතම හා අංක 595 දරන, 2016 මැයි 05 දාතම හා අංක 1345 දරන, 2018 අප්‍රේල් 24 දාතම හා අංක 2358 දරන, 2019 අප්‍රේල් 10 දාතම හා අංක 2765 දරන උකස් බැඳුම්කර සියල්ල සහ සී ජී අබේවික්‍රම විසින් ලියා සහතික කරන ලද 2023 සැප්තැම්බර් 27 දාතම හා අංක 4883 දරන, 2012 දෙසැම්බර් 23 දාතම හා අංක 4818 දරන සහ 2014 දෙසැම්බර් 24 දාතම හා අංක 1811 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ එකාන් හර්ෂ අබේසිංහ ඔත්තුකාරයින් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී අංක. 1521, 595, 1345, 2358, 2765, 4883, 4818 සහ 1811 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන් කෝටි තුන් ලක්ෂ අනූ තුන් දහස් දෙසිය තිස් හතරයි ශත හැටක (Rs.50,393,234.60) මුදලක් 2025 අප්‍රේල් 06 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන් කෝටි තුන් ලක්ෂ අනූ තුන් දහස් දෙසිය තිස් හතරයි ශත හැටක (Rs.50,393,234.60) මුදල ද 2025 අප්‍රේල් 07 වෙනි දින සිට අංක. 1521, 595, 1345, 2358, 2765, 4883, 4818 සහ 1811 දරන උකස් බැඳුම්කර මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂයක (Rs.5,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි තුනයි දශම බිංදුවක් (23.0%) හා තවත් රුපියල් දෙකෝටි අනූ පන් ලක්ෂ හතලිස් හය දහසක (Rs.29,546,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) හා තවත් රුපියල් හැට අට ලක්ෂ තිස් හය දහස් නමසිය දහයයි ශත පහළොවක (Rs.6,836,910.15) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සයි දශම බිංදුවක් (20.0%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක. 1521, 595, 1345, 2358, 2765, 4883, 4818 සහ 1811 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී කේ ඊ සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

ඉහත කී උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කැස්බෑව නගර සභා සීමාවන් තුළ සහ කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාශයේ තුම්බෝවිල (ග්‍රා නි කො අංක 576) ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිළියන්දල ග්‍රාමයේ තුම්බෝවිල පිහිටි සමරකෝන් මාවත වරිපනම් අංක 021/07 දරණ **"දෙල්ගහවත්ත නොහොත් සමරකෝන්වත්ත"** යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ශ්‍රී ජේ සී මුදලිගේ විසින් සාදන ලද 2016 අගෝස්තු 27 සහ 30 දාතම හා **අංක 848** දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 6 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් - උතුරට - විමලසේන ජයකොඩි සහ වෙනත් අය සහ පියදාසගේ ඉඩම් නැගෙනහිරට - අංක 4504 දරන පිඹුරේ ලොට් 7 දකුණට - අංක 4504 දරන පිඹුරේ ලොට් 13 (මීටර් 6.0 පළල පාර) සහ බස්නාහිරට - අංක 4504 දරන පිඹුරේ ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම තුනයි බිංදුවක් (A:0 R:0 P:10.30) විශාල ඉඩම් කොටස පස ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 848 දරන පිඹුරට අනුවය.

අංක 848 දරන එකී පිඹුරේ නිරූපිත එකී ලොට් 6 වඩා නිවැරදිව පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී පිළියන්දල ග්‍රාමයේ තුම්බෝවිල පිහිටි "දෙල්ගහවත්ත නොහොත් සමරකෝන්වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව් එස් එස් පෙරේරා විසින් සාදන ලද 2000 නොවැම්බර් 09 දාතම හා **අංක 4504** දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 6 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් - උතුරට - විමලසේන ජයකොඩි සහ වෙනත් අය සහ පියදාසගේ ඉඩම් නැගෙනහිරට - මෙහි ලොට් 7 දකුණට - මෙහි ලොට් 13 (මීටර් 6.0 පළල පාර සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට - මෙහි ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හතයි පහක් (A:0 R:0 P:10.75) විශාල ඉඩම් කොටස පස ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 4504 දරන පිඹුරේ නිරූපිත හිමිකම් C 1277/05 යටතේ දෙල්කන්ද නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 4505 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 1, 3 සහ 13 වශයෙන් ලකුණුකොට ඇති සියළුම මාර්ග වෙන්කිරීම් දිගේ හා ඒ මගින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

(උකස් බැඳුම්කර අංක 1521 සහ 4883 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කැස්බෑව නගර සහා සීමාවන් තුළ සහ කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාශයේ තුම්බෝවිල (ග්‍රා නි කො අංක 576) ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ පිළියන්දල ග්‍රාමයේ පිහිටි "දෙල්ගහවත්ත නොහොත් සමරකෝන්වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව් එස් එස් පෙරේරා විසින් සාදන ලද 2000 නොවැම්බර් 09 දාතම හා අංක 4504 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 7 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් - උතුරට - එඩ්වඩ් සහ වෙනත් අයගේ ඉඩම් නැගෙනහිරට - ලොට් 8 දකුණට - ලොට් 13 (මීටර් 6.0 පළල පාර සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට - ලොට් 6 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හතයි පහක් (A:0 R:0 P:10.75) හෝ හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි දෙකයි හතයි එකයි නමයක් (0.02719 Ha) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 4504 දරන පිඹුරට අනුව හිමිකම් C 1239/44 යටතේ දෙල්කන්ද -නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 4504 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 1, 3 සහ 13 වශයෙන් ලකුණු කොට ඇති සියළුම මාර්ග වෙන්කිරීම් දිගේ හා ඒ මගින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

(උකස් බැඳුම්කර අංක 595, 1345 සහ 4818 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත)

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ උඩුගහ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ හෝමාගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාශයේ අම්බලන්ගොඩ (ග්‍රා නි කො අංක 594) ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ අම්බලන්ගොඩ පිහිටි පන්සල පාර අම්බලන්ගොඩ වරිපනම් අංක 39 දරන "ලියනගෙ වත්ත" යැයි කියනු ලබන ඉඩමට (බලයලත් මිනින්දෝරු සේ ආර් පෙරේරා විසින් සාදන ලද 2003 සැප්තැම්බර් 15 දාතම හා **අංක 1849** දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හි උපබෙදුමක් වන) බලයලත් මිනින්දෝරු එස් එස් ජයලත් විසින් සාදන ලද 2014 මාර්තු 28 දාතම හා **අංක 2014/741** දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් - උතුරට - ලොට් 1B සහ පාර නැගෙනහිරට - කෝන්ගහවත්ත දකුණට - ලොට් 1B සහ බස්නාහිරට - ලොට් 1B යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හතයි දශම හයයි පහක් (A:0 R:0 P:37.65) විශාල ඉඩම් කොටස පස ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2014/741 දරන පිඹුරට අනුව හිමිකම් A 858/22 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 1811 සහ 2358 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත)

4. ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල කෝරළේ කතරගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ කතරගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාශයේ දෙටගමුව (ග්‍රා නි කො අංක 146 B) ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ කොච්චිපතාන පිහිටි සිසුල්පට්ට පාර වරිපනම් අංක 444 දරන බලයලත් මිනින්දෝරු ඩී එම් ඩබ්ලිව් බී දිසානායක විසින් සාදන ලද 2019 පෙබරවාරි 08 දාතම හා **අංක 2019/144** දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් - උතුරට - FTP 25 හි ලොට් 4219 සහ 4131 නැගෙනහිරට - FTP 25 හි ලොට් 4131 සහ 4132 දකුණට - FTP 25 හි ලොට් 4232 සහ බස්නාහිරට - FTP 25 හි ලොට් 4232 සහ 4219 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම දෙකයි එකයි නවයයි අටක් (0.2198 Ha) හෝ රූඩ් දෙකයි පර්චස් හයයි දශම නමයයි බිංදුවක් (A:0 R:2 P:06.90) විශාල ඉඩම් කොටස පස ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2019/144 දරන පිඹුරට අනුවය.

අංක 2019/144 දරන එකී පිඹුරේ නිරූපිත එකී ලොට් A වඩා නිවැරදිව පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි -

එකී කොච්චිපතාන පිහිටි "කොච්චිපතානකැලේ උස් ඉඩම" යැයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සකසාපනය කරන ලද අංක 25 දරන අවසන් Topographical පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 4218 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් - උතුරට - ලොට් 4219 සහ 4131 නැගෙනහිරට - ලොට් 4131 සහ 4132 දකුණට - ලොට් 4232 සහ බස්නාහිරට - ලොට් 4232 සහ 4219 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම දෙකයි එකයි නවයයි අටක් (0.2198 Ha) විශාල ඉඩම් කොටස පස ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක FTP 25 දරන පිඹුරට අනුව හිමිකම් LDO N 08/09 යටතේ මොනරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

වෙන් කිරීමේ වගන්ති :

1. මෙම ප්‍රදානයේ ඛනිජ සඳහා හිමිකම (මෙම ප්‍රදානයේ වටිනා ගල් ඇතුළත් වේ) සහ එවැනි ඛනිජ කැණීමට, සෙවීමට, වැඩ කිරීමට සහ රැගෙන යාමට ඇති අයිතිය රජයට වෙන් කර ඇත - සහ

2. මෙම ප්‍රදානයේ දිනයේ දී හිමිකම මත පවතින ඕනෑම මාර්ග අයිතියකට හෝ වෙනත් පරවශතාවයකට වගඋත්තරකාරීව හිමිකරුගේ (උකස්කරුගේ) හිමිකම යටත් වේ.

කොන්දේසි :

1. මෙහි දක්වා ඇති උප බෙදීමේ ඒකකයට වඩා අඩු ප්‍රමාණයකින් යුත් ඉඩමෙන් බෙදී ගිය කොටසක් හිමිකරු විසින් බැහැර නොකළ යුතුය, එනම් පර්චස් 06-

2. මෙහි නිශ්චිතව දක්වා ඇති අවම කොටස වන 1/4 ට වඩා අඩුවෙන් බෙදා නොගත් කොටසක් හිමිකරු විසින් බැහැර නොකළ යුතුය-

3. කොන්දේසිය 1 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීමේ ඒකකයට වඩා අඩු ප්‍රමාණයකින් බෙදී ගිය ඉඩමේ කොටසෙහි හිමිකරු කිසිදු පුද්ගලයකු නොවිය යුතුය.

4. කොන්දේසිය 2 හි නිශ්චිතව දක්වා ඇති අවම කොටසට වඩා අඩුවෙන් බෙදා නොගත් කොටසක හිමිකරු කිසිදු පුද්ගලයෙකු නොවිය යුතුය.

5. ඉදිකිරීම් ආරක්ෂාව දැනටමත් ඉදිකර ඇති හෝ මින් ඉදිරියට ඉදිකිරීමට නියමිත වාරිමාර්ග කාර්යයක් මගින් ඉඩම හෝ එහි යම් කොටසක් හෝ වාරිමාර්ග සැපයිය හැකි නම් හෝ මින් ඉදිරියට වාරිමාර්ග සැපයිය හැකි නම්, හෝ හිමිකරු වාරිමාර්ග ප්‍රදේශය

සම්බන්ධයෙන්, වාරිමාර්ග ආඥා පනතේ (453 පරිච්ඡේදය) විධිවිධාන සහ ඒ යටතේ සකස් කර ඇති ඕනෑම රීතියකට අනුකූල විය යුතුය-

6. දිසාපතිගෙන් ලිඛිත අවසරයක් සහ සුදුසු අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගෙන නොමැති නම්, හිමිකරු ඉඩම තුළ හෝ ඒ මත ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයක් කැණීම, සෙවීම, ගැනීම, සුදුසු තත්ත්වයට පත් කිරීම, විකිණීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම නොකළ යුතුය- සහ

7. ප්‍රාදේශීය ලේකම්වරයාගේ ලිඛිත පූර්ව අවසරයක් නොමැතිව, ඉඩම හෝ එහි කිසිදු කොටසක් බැහැර කිරීම සිදු නොකළ යුතුය.

(උකස් බැඳුම්කර අංක 2765 මගින් හා ඒ යටතේ උකස්කර ඇපකර ඇත)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්

සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක. 01 සහ 2011 අංක. 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

ආර් ඒ පී බී රණසිංහ

හැඳුනුම් අංකය : 1173 5759 9328

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025/07/30 වෙනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක. පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක. 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වයි එන් දෙල්පෙචිතු විසින් ලියා සහතික කරන ලද 2021 ජූනි 29 දාතම හා අංක 5224 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රණසිංහ ආරච්චිගේ ගනේෂ් දිපාල් රණසිංහ ඔත්තුකාරයින් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද, එකී අංක. 5224 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැට එක් ලක්ෂ විසි අට දහස් තුන්සිය එකයි ශත තුනක (රු. 6,128,301.03) මුදලක් 2025 අප්‍රේල් 08 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැට එක් ලක්ෂ විසි අට දහස් තුන්සිය එකයි ශත තුනක (රු. 6,128,301.03) මුදල ද 2025 අප්‍රේල් 09 වෙනි දින සිට අංක. 5224 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් එක් ලක්ෂ දහ හත් දහස් නවසිය අසූ නවයයි ශත හතරක (රු. 5,117,989.04) මුදලක් සඳහා වාර්ෂිකව සියයට අටයි දශම බිංදුවක් (8.0%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක. 5224 දරන උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී කේ ඊ සේනාපතිලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ අඹගොඩ පහළ කොට්ඨාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කොළොන්නාව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාශයේ කල්ලුගහවත්ත - 513 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ ගොතටුව නව නගරය පිහිටි කොළොන්නාව පාර වරිපනම් **අංක 57/2** දරන **"කහනත්තවත්ත නොහොත් සමදරාගහවත්ත"** යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ශ්‍රී රණතුංග විසින් සාදන ලද 2018/02/17 දාතම හා **අංක 3129** දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් X වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට **මායිම් - උතුරට** - සේ අයිවන් ද සිල්වා විසින් හිමිකම් කියන වරිපනම් අංක 63 දරන පරිශ්‍රයන් **නැගෙනහිරට** - ඒ ජී ගෝඨාභය රණසිංහ ගේ ඉඩම **දකුණට** - බලයලත් මිනින්දෝරු බී එස් එස් කුරුප්පු විසින් සාදන ලද අංක 2009 දරන පිඹුරේ ලොට් 4 (අඩි 10 පළල පාර) සහ බස්නාහිරට - අංක 69/30 දරන පිඹුරේ ලොට් 2B යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම බිංදුවක් (A:0 R:0 P:6.0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3129 දරන පිඹුරට අනුවය.

එකී ලොට් X බලයලත් මිනින්දෝරු සේ ඒ කලුබිකියන විසින් සාදන ලද 1998/08/15 දාතම හා **අංක 2767** දරන පිඹුරේ නිරූපිත ලොට් 3 තවත් අයුරකින් බලයලත් මිනින්දෝරු එල් ඩී සී කාරියවසම් විසින් සාදන ලද 1997/10/02, 29 දාතම හා අංක 69/30 දරන පිඹුරේ ලොට් 2B නැවත මිනුමක් වන අතර එය පහතින් මැනවින් විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ අඹගොඩ පහළ කොට්ඨාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කොළොන්නාව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාශයේ කල්ලුගහවත්ත - 513 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ ගොතටුව නව නගරය පිහිටි **"කහනත්තවත්ත නොහොත් සමදරාගහවත්ත"** යයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එල් ඩී සී කාරියවසම් විසින් සාදන ලද 1997/10/02, 29 දාතම හා **අංක 69/30** දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට **මායිම් - උතුරට** - සේ අයිවන් ද සිල්වා විසින් හිමිකම් කියන වරිපනම් අංක 63 දරන පරිශ්‍රයන් **නැගෙනහිරට** - වරිපනම් අංක 57 දරන පරිශ්‍රයන්, එල් පී සෝනා ගේ ඉඩම **දකුණට** - (අඩි 10 පළල පාර) සහ බස්නාහිරට - ලොට් 2B1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම බිංදුවක් (A:0 R:0 P:6.0) විශාල ඉඩම් කොටස එකී අංක 69/30 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව V/F 402/23 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 2009 දරන පිඹුරේ ලොට් 4 (අඩි 10 පළල පාර) දිගේ හා ඒ මගින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. මගින් (ගම්පොල ශාඛාව)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පීකිව 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර

1 වන උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත, ගඟ ඉහළ කෝරළයේ, ගඟ ඉහළ කෝරළයේ ප්‍රාදේශීය සභා සීමාවේ සහ ගඟ ඉහළ කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 1051- රක්සාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත අලුගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්.ඒ. වඩුඩ විසින් 2014 පෙබරවාරි 05 වන දින පිළියෙල කරන ලද අංක 4301 දරන පිඹුරේ දක්වෙන රක්සාව එස්ටේට් ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස

ප්‍රමාණය රූඩ් තුනක් සහ පර්චස් තිස් පහ (අ.0-රූ.3-පර්. 35,00) ක

විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

2 වන උපලේඛනය (උපකරණ)

අංකය	විස්තරය	ඒකක
	නව උපකරණ	
1.	Colour Separtor	1
2.	Drier Sirocco Supper	1
	පැරණි උපකරණ	
1.	Trough Units	4
2.	Suction Winnower (3HP Motor)	1
3.	Dust Fan 48' (with 3HP Motor)	1
4.	Michi Shiffer	6
5.	Middleton Shifter	2
6.	Chota Shifter	1
7.	Fiber Extractor	1
8.	Roller Breaker	2
9.	Tea Dryer	4
10.	Walkers Roller	3
11.	Terry Nipeer	1
12.	Iron Frame Lift	1
13.	44" Roller	1
14.	Dryer Conveyer	1
15.	Exhaust Fan	1
16.	Tea Bins	1
17.	Firewood Slitter	1
18.	Panel Board	1
19.	Weighting Machines 250kg	1
20.	Weighting Machines 300kg	1
21.	Weighting Machines 200kg	1
22.	Cooling System for machine room	1

සමාගම පනත යටතේ (ලියාපදිංචි කිරීමේ අංක PV 98269 දරන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන දොළොස්බාගේ, රක්සාව එස්ටේට් හි එහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති රක්සාව එස්ටේට් ටී ෆැක්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හැන්දෙස්ස, අම්බගොල, අංක 243 දරන ස්ථානයේ බදුර්දීන් මොහමඩ් අබ්දුල් රහීම් සහ අබ්දුල් රහීම් මොහමඩ් මුනීර් යන දෙදෙනා, දොළොස්බාගේ, රක්සාව එස්ටේට් හි අබ්දුල් රහීම් මොහමඩ් මුනාෆ් සහ අබ්දුල් රහීම් මොහමඩ් රියාස් යන දෙදෙනා, උකස්කරුවන් හැටියට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කරන ලද ඉහත 1 වන සහ 2 වන උපලේඛනවල සඳහන් දේපළ සහ යන්ත්‍රෝපකරණ

1 වන උපලේඛනය

වර්ෂ 2025ක් වූ නොවැම්බර් මස 24 වන දින පෙ.ව. 11.00 ට ද

2 වන උපලේඛනය (යන්ත්‍රෝපකරණ)

වර්ෂ 2025 ක් වූ නොවැම්බර් මස 24 වන දින පෙ.ව. 11.30ට ද

ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2021.10.22 වන දින රජයේ ගැසට් පත්‍රයද 2021.10.22 වන දින දිවයින, අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

දේපළ වෙත පිවිසීම:

ගම්පොල නගරයේ සිට දොළොස්බාගේ පාර ඔස්සේ රක්සාව හංදිය දක්වා කිලෝමීටර් 19ක් පමණ ගමන් කර රක්සාව එස්ටේට් වෙත වමට හැරී කිලෝමීටර් එකක් පමණ ගමන් කළ විට පාර අවසානයේ ඇති විෂයගත දේපළ වෙත ළඟා වේ.

ගෙවීමේ ක්‍රමය:-

විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) ලිපිකරු හා සේවක වේතනය රු. 2000/- (05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් (06) ගැනුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි (07) ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළදී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගම්පොල ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න:

කළමණාකරු
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
අංක 28K, 28H,
ගඟ ශ්‍රී පාර දකුණ,
ගම්පොල.
දුරකථන 081-2354131
ෆැක්ස් 081-2354134

එල්.බී. සේනානායක
සාම විනිසුරු බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,
අංක 7/1/10, 1 වන මහල, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08.
දුරකථන 0112396520

අද තරගය දිනන්න අපි හොඳ මානසික සූදානමකින් ඉන්නවා

- හර්ෂිතා කියයි

ශ්‍රී ලංකා - පකිස්තාන සටන අද

ප්‍රසිල් ජයකොඩි
- ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේ සිට

2025 කාන්තා ලෝක කුසලාන එක්දින තරගාවලියේ පළමු අදියරේ ශ්‍රී ලංකාවට හිමි අවසන් තරගය අද ශ්‍රී ලංකාව සහ පකිස්තානය අතර කොළඹ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේදී ඇරඹීමට නියමිතයි.

මේ වනවිට පකිස්තාන කණ්ඩායම තරග හයකට ක්‍රීඩාකර තරග 4ක් පරාජය වී තිබෙන අතර ඉතිරි තරග 2 වර්ෂාව නිසා අතහැර දමූ තරගයි. ඒ අනුව පකිස්තානය ප්‍රසාද ලකුණු සටහනේ 8 වැනි තැනට වැටී තිබෙන අතර ශ්‍රී ලංකාව සමග තරගයේදී ජයග්‍රහණය ගැන වැඩි බලාපොරොත්තුවක් පකිස්තානයට තබාගත නොහැකිව තිබේ.

ශ්‍රී ලංකාව මුහුණදුන් තරග 6න් තරග තුනක් පරාජයවී ඇති අතර එක් තරගයක් ජයගෙන තිබේ. ඉතිරි තරග 2ක වර්ෂාව නිසා අතහැර දැමුණේය. ඒ අනුව ශ්‍රී ලංකා කණ්ඩායම ප්‍රසාද ලකුණු සටහනේ හය වැනි තැනට පත්ව සිටින්නේ ප්‍රසාද ලකුණු 4ක් ලබාගෙනය.

මේ වනවිට තරගාවලියේ අවසන් පූර්ව වටය සඳහා ඕස්ට්‍රේලියානු කාන්තා කණ්ඩායම ද දකුණු අප්‍රිකාව සහ එංගලන්ත කණ්ඩායම් සුදුසුකම් ලබා තිබේ. ඉන්දියා කාන්තා කණ්ඩායම සහ නවසීලන්ත කාන්තා කණ්ඩායම අර්ධ අවසන් පූර්ව වටයට පිවිසීමේ අවස්ථාව ඉතා වැඩි අතර ශ්‍රී ලංකා කණ්ඩායමට ද අවස්ථාව නැතුවාම නොවේ. එවන් වටපිටාවක් පවතිද්දී ශ්‍රී ලංකා කාන්තා කණ්ඩායමේ හර්ෂිතා සමරවික්‍රම මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු ලබාදුන්නේ ශ්‍රී ලංකාට අද ජයග්‍රහණයට ඉතා හොඳ මානසිකත්වයකින් සිටින බවයි. ඇත්තටම අපි හොඳ සූදානමකින් ඉන්නවා. කලින් තරගය අපි හොඳින් ජයග්‍රහණය කළා. අද තරගය ජයග්‍රහණය කරන්නත් අපි හොඳ මානසික සූදානමකින් ඉන්නෙ.

අපි අවසාන තරගයෙන් පස්සෙ කණ්ඩායම් සාකච්ඡාවේදී කතා කළා කොහොමද අපි ලකුණු අතරට එන්නෙ කියන, විශේෂයෙන්ම එක නායිකාව සහ පුහුණුකරුවන් කතා කළා.

කලින් තරග තුනේදීම මට හොඳ ආරම්භයක් ගන්න පුළුවන් වුණත් ඒක දිගටම කරගෙන යන්න බැරිවුණා. ඒ වගේම මගෙ අතින් කලින් තරගවල වෙච්ච අඩුපාඩු හදාගෙන අද තරගයේදී හොඳින් ක්‍රීඩා කරන්න බලාපොරොත්තු වෙනවා.

අපි දන්න මෙම තණතිල්ලෙ කණ්ඩායම් ක්‍රීඩා කරනවා. ඒක ගැන හොඳට අධ්‍යයනය කරල අද තරගය හොඳින් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

දිවයින
ක්‍රීඩා
වසරේ විශිෂ්ටතම ක්‍රීඩා පිටුව
2025 ඔක්තෝබර් මස 24 වැනිදා සිකුරාදා
සංස්කරණය - ප්‍රසිල් ජය

Kandos
සැබෑම චොක්ලට් රස
රු.20/- සිට ඉහළට

ඔස්ට්‍රේලියා ඉන්දියා එක්දින තරගාවලිය

තරගයක් ඉතිරිව තිබියදීම ඕස්ට්‍රේලියාවට තරගාවලි ජයක්

සිසිර ඉන්ද්‍රජිත්

මැතිව් ෂෝර්ට් ගේ ඉවසිලිවන්ත පිතිකරණයත්, මැදපෙළින් පිවිසි කූපර් කොනොලිගේ නොදැවුණු ඉනිමත්, දඟ පන්දු යවන ක්‍රීඩක ඇඩම් සැම්පා ගේ විශිෂ්ට පන්දු යැවීමත් හේතුවෙන් සංචාරක ඉන්දීය ක්‍රිකට් කණ්ඩායම සහ ඕස්ට්‍රේලියානු කණ්ඩායම අතර තරග 3කින් සමන්විත එක්දින තරගාවලියේ දෙවැනි තරගයෙන් කඩුලු 2ක ජයක් ලැබීමට සත්කාරක ඕස්ට්‍රේලියානු කණ්ඩායම සමත්විය.

ඒ අනුව තරග 3කින් සමන්විත එක්දින තරගාවලියේ තරගයක් ඉතිරිව තිබියදීම තරගාවලි ජය තමන් සතුකර ගැනීමට ඕස්ට්‍රේලියානු කණ්ඩායමට හැකියාව ලැබිණි.

ඊයේ (24 දා) ඇඩිලේඩ් ඕවල් ක්‍රීඩාංගණයේදී පැවැති මෙම තරගයේ කාසියේ වාසිය දිනාගත් ඕස්ට්‍රේලියානු කණ්ඩායමේ ඇරයුමින් යුතුව පළමුව පන්දුවට පහරදීම සඳහා පිවිසි ඉන්දීය කණ්ඩායමට ඕස්ට්‍රේලියානු පන්දු බලඇණිය හමුවේ ලබාගැනීමට හැකියාව ලැබුණේ නියමිත පන්දු වාර 50 අවසානයේ කඩුලු 9ක් දවා ලකුණු 264ක් පමණි.

ඒ අනුව ලකුණු 265ක ඉලක්කයක් හඹායෑම සඳහා පිවිසි ඕස්ට්‍රේලියානු පිතිකරුවෝ පන්දු වාර 46යි පන්දු 2ක් අවසානයේ කඩුලු 8ක් දවා ලකුණු 265ක් ලබාගනිමින් තරගයේ ජය වාර්තා කිරීමට සමත්විය.

ඉන්දීය කණ්ඩායම වෙනුවෙන් පන්දුවට පහරදීමේදී රෝහිත් ශර්මා ලකුණු 73ක්, ශ්‍රෙයාස් අයියර් ලකුණු 61ක් සහ අක්ෂාර් පටෙල් ලකුණු 44ක් ලැබීය.

පන්දු යැවීමේදී ඇඩම් සැම්පා ලකුණු 60කට කඩුලු 4ක්, සේවියර් බාට්ලට් ලකුණු 39කට කඩුලු 3ක් සහ මිචෙල් ස්ටාර්ක් ලකුණු 62කට කඩුලු 2ක් සිඳහෙලීය.

ඕස්ට්‍රේලියානු කණ්ඩායම වෙනුවෙන් පන්දුවට පහරදීමේදී මැතිව් ෂෝර්ට් ලකුණු 74ක්, කූපර් කොනොලි නොදැවී ලකුණු 61ක් සහ මිචෙල් ඕවන් ලකුණු 36ක් ලැබීය.

පන්දු යැවීමේදී අර්ෂදීප් සිංග්, වොෂිංටන් සුන්දර් සහ හර්ෂිත් රණා අතරේ කඩුලු 2ක බැගින් බෙදීගියේය.

තරගයේ වීරයා ලෙස ඇඩම් සැම්පා සම්මාන ලැබීය.

රන්සිව ජයතිලකට රන් පදක්කමක්

කටුනායක - වී.කේ.ජී. කපිල

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි පැවති "විවෘත ක්ලැසික් ලීග්" (Dubai Open Classic Leaque) සවිසවිමේ ජාත්‍යන්තර තරගාවලියට සහභාගි වූ ශ්‍රී ලාංකික ක්‍රීඩක රන්සිව ජයතිලක, එහි "ප්‍රෝ" (Pro) අංශයෙන් තරග කරමින් "ඩෙඩ් ලිෆ්ට්" (Ded Lift) ක්‍රමයට කිලෝග්‍රෑම් 315 ක බර ඔසවමින්, වාර්තාවක් තබමින්, එහි ප්‍රථම ස්ථානය දිනා ගනිමින් රන් පදක්කම රැගෙන ඊයේ (23) අලුයම මෙරටට පැමිණියේය.

මෙම තරගාවලිය සඳහා ලෝකයේ සවිසවිමේ ඉහළම දක්ෂතා වාර්තා කර ඇති රටවල් 10 ක ක්‍රීඩකයන් සඳහා ආරාධනා ලැබී තිබූ අතර එය පසුගිය 18 සිට 19 දින දක්වා ඩුබායි නුවර දී පවත්වා තිබුණි.

රන්සිව ජයතිලක නේපාලයේ පැවති ආසියානු සවිසවිමේ තරගාවලියේ දී කිලෝග්‍රෑම් 310 ක බර ඔසවමින් ඔහු විසින් තබා තිබූ වාර්තාව අලුත් කිරීමට සමත් වී තිබුණි.

ඔහු පිළිගැනීමට ඔහුගේ බිරිඳ, දියණිය , දෙමාපියන් සහ ඔහුගේ සහෝදර ක්‍රීඩකයන් පිරිසක් ද ගුවන්තොටුපොළ වෙත පැමිණ සිටියහ.

කණ්ඩායම් 1303 කට ශ්‍රී ලංකා ක්‍රිකට් වෙතින් පන්දු 22,684 ක්

යාපනය

හම්බන්තොට

නුවර

කොළඹ

සහජ දක්ෂතා ඇති සෑම ක්‍රිකට් ක්‍රීඩක ක්‍රීඩිකාවකටම ජාතික කණ්ඩායම නියෝජනය කිරීම සඳහා සමාන අවස්ථා ලබාදීම වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් දිවයින පුරා සිදුකරනු ලබන 'ජාතික ගමන් මග' වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව පුරා ක්‍රිකට් ක්‍රීඩා කරනු ලබන අවුරුදු 13 න් පහළ සහ අවුරුදු 19 න් පහළ බාලක සහ අවුරුදු 19 න් පහළ බාලිකා පාසල් තරග සඳහා ක්‍රිකට් පන්දු විසි දෙදහස් හයසිය අසූ හතරක් (22,684) ක් සහ ක්‍රිකට් උපකරණ කට්ටල ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පියවර ගනු ලැබීය.

ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපති ශම්මි සිල්වා මහතාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වන විධායක කමිටුවේ සංකල්පයකට අනුව අවුරුදු 13 න් පහළ වයස් කාණ්ඩය යටතේ ඉදිරි පාසල් තරග වාරය නියෝජනය කරනු ලබන පාසල් 863 ක් සහ ලෙදර් පන්දුව භාවිතයෙන් ක්‍රිකට් ක්‍රීඩා නොකරන පාසල්වල දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් සැදුම් ලත් දිස්ත්‍රික් කණ්ඩායම් 37ක් වශයෙන් කණ්ඩායම් 900ක් වෙනුවෙන්ද, අවුරුදු 19 න් පහළ දෙවැනි පෙළ බාලක නියෝජනය කරනු ලබන පාසල් 282 ක් සහ අවුරුදු 19 න් පහළ බාලිකා ක්‍රිකට් තරගාවලිය නියෝජනය කරනු ලබන පාසල් 121 ක් වෙනුවෙන් ද මෙම සම්පත් පන්දු සංඛ්‍යාව බෙදා දෙනු ලැබීය.

ඊට අමතරව අවුරුදු 13 න් පහළ වයස් කාණ්ඩය ක්‍රීඩා කරනු ලබන, එහෙත් බාලක ක්‍රිකට් සඳහා පරිහරණය කරනු ලබන ක්‍රිකට් උපකරණ ඇතුළත් උපකරණ කට්ටල නොලැබුණු පාසල් වෙනුවෙන් සහ දිස්ත්‍රික් කණ්ඩායම් වෙනුවෙන් වන උපකරණ කට්ටල 116 ක් ද මේ දිනවලදී බෙදා දීමට පියවර ගැනිණ.

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයේ ද සහයෝගය ඇතිව සිදු කරන ලද මෙම පන්දු ප්‍රදානයේදී රතු පන්දුවට අමතරව පළමු පෙළ බාලිකා තරගාවලිය නියෝජනය කරනු ලබන බාලිකා පාසල් 14 කට ද සුදු පන්දු 268ක් ද පිරිනැමිණ. ඒ අනුව දෙවැනි පෙළ බාලිකා තරගාවලිය නියෝජනය කරනු ලබන පාසල් 107ක් වෙනුවෙන් ග්‍රෑම් 142 ක බරකින් යුක්තව වන රතු පන්දු 1268ක් පිරිනැමිණ.

මෙම පන්දු බෙදා දීම යටතේ වූ කොළඹ දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් වැඩසටහන 2025 ඔක්තෝම්බර් ඉකුත් 14 වැනිදා සහ 16 වැනිදා යන දෙදින පෙ.ව. 10.00 ට කොළඹ දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය මූලිකර ගනිමින් එම සංගම් මූලස්ථානයේදී පැවැත්විණ. ඊට අමතරව එම වැඩසටහනට සමගාමීව සෙසු දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් 24 ම මූල් කර ගනිමින් එකම වේලාවට මෙම උපකරණ එකවර බෙදාදීමට කටයුතු යෙදීම මෙහි ඇති සුවිශේෂීතාව විය.

'ජාතික සංවර්ධන ගමන් මග', 'ජාතික ගමන් මග' වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන 'ක්‍රිකට් ගමට' වැඩසටහන මඟින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වසරෙන් වසර ග්‍රාමීය මට්ටමින් ජාතික මට්ටම දක්වා ක්‍රිකට් ක්‍රීඩාව පවත්වාගෙන යෑමට හා ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය ක්‍රිකට් උපකරණ සහ යටිතල පහසුකම් සැපයීමේ ස්ථාවර වාර්ෂික මෙහෙයුමක් දියත් කරමින් සිටින අතර ඒ මඟින් වසරින් වසර පාසල් දහසකට අධික සංඛ්‍යාවකට සහය ලබා දෙනු ඇත.

වත්තල මහබාගේ ගල්උඩුපිට ග්‍රාමයේ, පරාක්‍රම පාරේ පිහිටි කර්මාන්තශාලාවක් ද සහිත වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

මෙම දේපල ඩීඑෆ්සීසී බැංකු පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. වික්‍රමතිලක විසින් සියල්ල ලියා සහතික කරන ලද 2017.08.31 දිනැති අංක 2428, 2430, 2431 දරන උකස් බැඳුම්කරයන්, 2019.05.07 අංක 2886 දරන උකස් බැඳුම්කරය සහ 2019.08.23 දිනැති අංක 2965 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, සාති ෂු ඉන්ඩස්ට්‍රීස් යන නාමය අභිධානය හා විලාසය යටතේ රාගම ව්‍යාපාරයක් පවත්වාගෙන යන රාගම පදිංචි බුලත්සිංහලගේ චිරාන් සංජීව කුරේ සහ අහංගම විතානගේ තියාගි දිලිනි ද සිල්වා සහ පොන්විර ආරච්චිගේ දෙන්න මේරි මානෙල් හෙවත් පොන්විර ආරච්චිගේ දෙන්න මේරි මානෙල් පොන්විර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත් කුරු කෝරළේ, රාගම පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත ගල්උඩුපිට ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගල්උඩුපිට පිහිටි, "කොස්ගහවත්ත හෙවත් දෙල්ගහවත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ජී. ගුණතිලක විසින් සාදන ලද 2007.12.01 දිනැති අංක 5779 දරන පිඹුරේ ලොට් 1C1 වශයෙන් දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට: පරාක්‍රම පාර ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු පී. එම්. නෝනිස් විසින් සාදන ලද 1970.10.09 දිනැති අංක 5007 දරන පිඹුරේ දැක්වෙන එම ඉඩමේ කොටසක් ද, දකුණට : බලයලත් මිනින්දෝරු එස්. ජී. ගුණතිලක විසින් සාදන ලද 2005.01.05 දිනැති අංක 3583 දරන පිඹුරේ ලොට් 1C හි ඉතිරි කොටස ද සහ බස්නාහිරට : පොද්ගලික පාර ද, වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් හතරයි දශම පහයි බිංදුවක් (පර්. 34.50) විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුලු සෑම සියලු දේ ද සමග වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

නිශ්චල යන්ත්‍ර ලැයිස්තුව
List of Immovable Machinery

අංකය	අයිතමය	ඒකක ගණන	අනුක්‍රමික අංකය
1	ඉන්ජෙක්ෂන් මෝල්ඩිං මැෂින්	1	
2	ඉන්ජෙක්ෂන් මෝල්ඩිං (180ට)	1	
3	මෝල්ඩ්ස්	80	
4	මික්සර්	1	
5	කූලිං ටවර්	1	

තොග වෙළඳ භාණ්ඩ සහ අමුද්‍රව්‍ය කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ හා නොනිමි භාණ්ඩ ඇතුලුව සම්පූර්ණයෙන්ම,

විස්තරය	ප්‍රමාණය
කාන්තා හා ළමා සෙරෙප්පු (කුට්ටම්)	11,000 කුට්ටම්
ප්‍රදර්ශනාගාර තොග - කාන්තා සෙරෙප්පු හා ළමා සෙරෙප්පු කුට්ටම	12,750 කුට්ටම්
සෘජු විකිණීමේ වැඩසටහන තොග - කාන්තා හා ළමා සෙරෙප්පු කුට්ටම්	2,500 කුට්ටම්
කෙරීගෙන යන වැඩ (කුට්ටම්)	3,250 කුට්ටම්
සපත්තු අඩි	5,000
රෙක්සින් සහ රෙදි (මීටර්)	3,000 (මීටර්)
ගම්	40 (ලීටර්)
පටි	10,000 යාර
පුවරු	2,000
ලෙදර්	ව. අ. 1000

සහ ශ්‍රී ලංකා ජනරජයේ, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම, ගල්උඩුපිට, පරාක්‍රම මාවතේ, අංක 64 දරන ස්ථානයේ දැනට තබා තිබෙන සහ ගබඩා කර ඇති සහ යම් අවස්ථාවක හා කලින් කල ගබඩා කර හෝ තබා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක් තුළ හෝ මත දැනට තිබෙන තොග මත නිමි භාණ්ඩ නොනිමි භාණ්ඩ වෙනත් සියලු දේපළ, කලින් කල හා සෑම කල්හිම ගබඩාකර තබනු ලැබිය හැකි පරිශ්‍රයක තිබෙන කවරාකාරයේ වුව ද සෑම ආකාරයකම හා සියලු විස්තරවලට අයත්වන උකස්කරුගේ තොග මත වෙනත් නිමි භාණ්ඩ නොනිමි භාණ්ඩ සහ සියලු චංචල දේපළ සහ මින්මතු මේ බැඳුම්කරය බලාත්මකව පවත්නා කාල ඇතුළත සහ සෑම කල්හිම වරින් වර එකී පරිශ්‍රයට ගෙන එනු ලැබිය හැකි හෝ ඒ පරිශ්‍රයක තබා තිබිය යුතු හා තිබිය හැකි බන්ධනදායිගේ තොග මත වෙනත් නිමි භාණ්ඩ, නොනිමි භාණ්ඩ සහ සියලු චංචල දේපළ සහ බන්ධනදායී විසින් මින් මතු යම් අවස්ථාවක සහ වරින් වර එහි ව්‍යාපාරයක හෝ කර්මාන්තයක හෝ ගබඩාවකට ගෙන යනු ලැබිය හැකි, එකී ජනරජයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ව්‍යාපාර ස්ථානවලට හෝ ව්‍යාපාර ස්ථානයකට හෝ නැව්ගත කිරීමේ අපේක්ෂාවෙන් හෝ වාප්පුවේ හෝ ගබඩාවේ නිෂ්කාෂණය කිරීමේ අපේක්ෂාවෙන් ගෙන එනු ලැබිය හැකි, උකස්කරුගේ එකී තොග මත නිමි භාණ්ඩ නොනිමි භාණ්ඩ සහ ව්‍යාපාර චංචල දේපළ වේ.

ඉඩම් ප්‍රමාණයෙන් පර්චස් 34.50 කි (අ. 0 රූ.0 පර්. 34.50)
එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, යන්ත්‍ර සූත්‍ර, උපකරණ, තොග භාණ්ඩ, අමුද්‍රව්‍ය ඇතුළුව අනෙකුත් සියළුම දේ සමග ඉඩම
ඩී එෆ් සී සී බැංකු පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලතල අනුව
2025 නොවැම්බර් මස 24 වන දින පෙරවරු 10.00 ට
එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපලට පිවිසීම : පෑලියගොඩ සිට මීගමුව පාර ඔස්සේ කි. මී. 7 ක පමණ දුරක් ගියවිට මැක්ඩොනල්ඩ් එකට පෙර දකුණු පසට ඇති පරාක්‍රම පාරට හැරී තවත් මීටර් 400 ක පමණ දුරක් ගිය විට අදාල දේපල මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම : රජයේ ගැසට් පත්‍රයේ 2023.12.08 වන දින පළවී ඇති අතර, දිවයින, ද අයිලන්ඩ් යන පුවත්පත්වල 2023.11.27 වන දින ද, තිනකුරල් යන පුවත්පතේ 2023.11.28 වන දින ද පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය :- සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3000/-, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 2,000/-, 6. සියලුම ප්‍රචාරක වියදම්. 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වේනොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා විමසන්න : අයකර ගැනීම සහ පුනරුත්ථාපන අංශය, ඩී. එෆ්. සී. සී. බැංකු පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02. දුරකථනය : 011-2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දු. ක. 011 3068185, 011 2572940

ප්‍රජා සහ ළමා සෞඛ්‍ය වැඩසටහන් වෙනුවෙන් ගොල්ෆ් තරගාවලියක්

ශ්‍රී ලංකේය ගොල්ෆ් තරග අතර සුවිශේෂී ගොල්ෆ් තරගාවලියක් වන Dialog Club Vision Rotary Par 3 Golf Classic හි 2025 තරගය 10 වන වසරටත් Royal Colombo Golf Club (RCGC) හිදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. තරගාවලිය හෙට (25දා) පැවැත්වීමට නියමිතයි. RCCM විසින් මෙහෙයවනු ලබන ප්‍රජා සේවා වැඩසටහන් සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම අරමුණු කරගත් මෙය, ක්‍රීඩාව, සහයෝගිතාව හා පරිත්‍යාගශීලිත්වය එක් කළ තරගාවලියක් ලෙස සඳහන් කළ හැකිය.

ප්‍රජා සේවා වැඩසටහන් සඳහා සිය කැපවීම මහාව ප්‍රදර්ශනය කළ Dialog මෙම තරගාවලිය සඳහා ප්‍රමුඛ දායකත්වය ලබාදීම වෙනුවෙන් අඛණ්ඩව 10 වන වරටත් RCCM සමග අත්වැල් බැඳගෙන ඇත. මේ වසරේදී එහි ප්‍රධාන අනුග්‍රාහකයා ලෙස කටයුතු කරන Dialog Club Vision යහපැවැත්ම හා ක්‍රීඩාව හරහා ජනතාව එකතු කිරීමේ වැඩසටහන සඳහා Dialog මෙතෙක් දැක්වූ දායකත්වය අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට සමත්ව සිටියි.

Royal Colombo Golf Club විසින් සාම්ප්‍රදායිකව පවත්වාගෙන යනු ලබන 18-hole තරග සැලසුම Par 54 සැලසුමක් බවට පරිවර්තනය කරමින් සුවිශේෂී ආකෘතියක් යටතේ Dialog Club Vision Rotary Par 3 Golf Classic ක්‍රියාත්මක වේ. මෙහිදී තරග වදින ක්‍රීඩක ක්‍රීඩිකාවන් හට සෑම සිදුරක්ම Par 3 සලකමින් ක්‍රීඩා කිරීමේ අභියෝගය ලබා දී තිබීම විශේෂත්වයකි. මෙම අවස්ථාව සඳහා ව්‍යාපාරික, රාජ්‍ය තාන්ත්‍රික හා ක්‍රීඩා ප්‍රජාවන් යනාදී උනන්දුවක් දක්වන පාර්ශවයන් රැසක් එක්වීමට නියමිත අතර එදින පෙ.ව 7.00 ට සහ ප.ව. 12.30 තරග ආරම්භයන් සිදු කෙරෙනු ඇත.

උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2025 ඔක්තෝබර් මස 24 වැනිදා සිකුරාදා හෝමාගම පිහිටි උපාලි මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.